ISSN 1391 - 1031
2016 ජනවාරි
21 වෙළුම 10 කලාපය

# ජ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

"නිදහස් තරඟයේ අසහාය ස්වාමිකත්වය සහිතව පැවති පැරණි ධනපති ක්‍රමය භාණ්ඩ අපනයනයෙන් උපලක්ෂිතය. ඒකාධිකාරයන්ගේ පාලනය බලපවත්වන ධනපති ක්‍රමයේ නවතම අවධිය ප්‍රාග්ධන අපනයනයෙන් උපලක්ෂිතය."
**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
***04 වෙළුම,***
***90 පිටුව***

ආධාරය රු 30/=
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

**05 ජනවාරි 8...**



මේ තත්වය තුළ නව වසරේ ආරම්භයේ සිටම විටින් විට ජනතාව මත විවිධ බදු හරහා බර...

**08 'ජනතාව'...**



ධනවාදයේ අර්බුදය විසින් ජනතාව පීඩාවට පත්වීමත්, එකී පීඩනයෙන් මිදීමට ජනතාව ගත් සියලු...

**09 2015 අයවැය...**



ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නිසා මේ ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ නම් ඔවුන් එම ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු වූයේ...

**10 ආණ්ඩුවේ රෙදි...**



වවුචර් සඳහා ගුරු වැටුප් ගිණුම යොදවා ගැනීමට ආණ්ඩුව ගෙන තිබෙන තීරණයට ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ...

සංවාදය.......................... 03
තරුණ.......................... 04
ආවර්ජනා.......................... 06
විශේෂ.......................... 07
ජාත්‍යන්තර.......................... 11
කාන්තා.......................... 12
විශේෂාංග.......................... 14

# ජන වරමට ගරු කරනු!

# ජ.වි.පෙ. ආණ්ඩුවට බලකරයි

*02 පිටුවට*




සහන කප්පාදුවට එරෙහිව දෙසැම්බර් 17දා කොළඹදී වීදියට බට ගොවි ජනතාව...

***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***



# වැඩ බිම

## “ඔබේ මුදල් ඔබේ දරුවාට” - වරාය සේවක දරුවන්ට ශිෂ්‍යත්ව




වරාය අධිකාරියේ සේවක සමූපකාර බැංකුව මගින් වාර්ෂිකව ශිෂ්‍යත්වය සමත් හා විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ සිසුන් වෙනුවෙන් ලබාදෙන ‘ඔබේ මුදල් ඔබේ දරුවාට’ ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සව දෙකක් මහරගම තරුණ සේවා සභා ශාලාවේදී හා මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති, එම සංගමයේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සමග සමුපකාර කොමසාරිස් කාර්යාල නියෝජිතයන්ද මෙම අවස්ථාවලට සහභාගි වී සිටි අතර ශිෂ්‍යත්ව ලබාගැනීම සඳහා විශාල සිසු සිසුවියෝ පිරිසක් මෙම අවස්ථාවලට සහභාගි වී සිටියහ.

## ඉල්ලීම් ලබානොදීමට එරෙහිව උපාධිධාරීහු පෙළපාලි යති




වත්මන් ආණ්ඩුව විසින් නිකුත් කර ඇති අයවැය මඟින් සිදුකර තිබෙන කප්පාදු කිරීම්වලට මෙන්ම පොරොන්දු වූ පරිදි උපාධිධාරින්ගේ වෘත්තිය ගැටලුවලට විසඳුම් නොදිමට එරෙහිව ජාතික විරෝධතාවයක් පසුගියදා රැකියාලාභී උපාධිධාරී සංගමය විසින් දියත් කරනු ලැබිණි.

මෙම සේවාවට අයත් උපාධිධාරින් විසින් 18 දින අසනීප නිවාඩු වාර්තා කරමින් කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිට දී උද්ඝෝෂණ ව්‍යාපාරයක් හා අරලියගහ මන්දිරය දක්වා පෙළපාලියක් පැවැත්විණි.

මෙම විරෝධතාවය හේතුවෙන් උද්ඝෝෂණ පෙළපාලිය අතරතුර අග්‍රාමාත්‍ය ලේකම්වරයා සමග රැකියාලාභී උපාධිධාරී සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි ඇතුළු නියෝජිතයින් කිහිප දෙනෙකු සමග සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී අමාත්‍යාංශ ලේකම්වරුන් සමග ඒකාබද්ධව සාකච්ඡාවක් පැවැත්වීමෙන් මෙම ගැටලුවලට විසඳුම් ලබාදීමට එකඟ වූ බව සූරියආරච්චි සහෝදරයා නියමුවා වෙත පැවසීය.

## ස්ථිර වූ මෑන්පවර් සේවකයින්ගෙන් රංජන් ජයලාල්ට උණුසුම් පිළිගැනීමක්



පසුගියදා ලංකා විදුලි බල මණ්ඩලයේ මෑන් පවර් සේවකයින් 2350 කට ස්ථිර පත්වීම් ලබාදුන් අතර එම පත්වීම් ලැබීමෙන් පසු ඔවුන් විසින් ලංකා විදුලි සේවක සංගමයේ රංජන් ජයලාල් සහෝදරයාව විදුලි බල මණ්ඩල මූලස්ථානය ඉදිරිපිටදී උණුසුම් ලෙසින් පිළිග නු ලැබිණි.

මෙහිදී රංජන් ජයලාල් සහෝදරයා පැවසූයේ මෑන් පවර් සේවකයින් ස්ථිර කරන ලෙසට දිගින් දිගට තම සංගමය ඇතුළු වෘත්තීය සමිති ව්‍යාපාරය විසින් කරන ලද අරගලය හමුවේ මෙම ජයග්‍රහණය ලබාගත හැකි වූ බවත් ඉදිරියේදී ඉතිරි සේවකයින් ස්ථිර කරගැනීම වෙනුවෙන් අඛණ්ඩව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවයි.

## අයිතීන් ඉල්ලා දිවිනැගුම සේවකයෝ දැවැන්ත උද්ඝෝෂණයක




තම ඉල්ලීම් ගණනාවක් සම්බන්ධයෙන් විසඳුම් ලබාදෙන ලෙස බලකරමින් දිවිනැගුම දෙපාර්තමේන්තු සේවකයෝ විශාල පිරිසක් පසුගියාදා බත්තරමුල්ල සෙත්සිරිපාය ඉදිරිපිටදී උද්ඝෝෂණයක නියැලිණි. වෘත්තීය සමිති 10 ක් පමණ ඒකාබද්ධ වූ ‘අයිතීන් දිනාගැනීමේ දිවිනැගුම වෘත්තීය සමිති එකමුතුව’ මගින් මෙම උද්ඝෝෂණය පවත්වනු ලැබිණි. උද්ඝෝෂණය අවසානයේ සියලු වෘත්තීය සමිති නායකයින් විසින් උද්ඝෝෂණයට සහභාගි වූ පිරිස අමතමින් රැස්වීමක්ද පවත්වනු ලැබිණි.

මෙහිදී රැස්ව සිටි පිරිස ඇමතූ එම වෘත්තීය සමිති එකමුතුවේ සම කැඳවුම්කරු චාමර මද්දුමකළුගේ සහෝදරයා පවසා සිටියේ වසර ගණනාවක් තිස්සේ මෙම ගැටලු සඳහා විසඳුම් ඉල්ලා සිටි නමුත් විසඳුම් නොලැබුණු බවත් එබැවින් වර්තමානයේ යහ පාලන ආණ්ඩුව මෙම ගැටලු විසඳීමට කටයුතු නොකරන්නේ නම් දිවිනැගුම දෙපාර්තමේන්තු සියලු සේවකයින් ඒකාබද්ධව අඛණ්ඩ වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවය.

# ඉතිරි

## *මුල් පිටුවෙන්* ජනවරමට...

එකාධිපති රාජපක්ෂ පවුල් පාලනය පෙරළා දැමීමෙන් පසුගිය වසරේ ජනවාරි 08වැනිදා ජනතාව අපේක්ෂා කළ අරමුණු වත්මන් හවුල් ආණ්ඩුව විසින් නොසලකා හැරීමට එරෙහිව එම බල පෙරළියට වසරක් පිරීම පදනම් කරගනිමින් ජනවරමට ගරුකරන ලෙස ආණ්ඩුවට බලකරන උද්ඝෝෂණ ව්‍යාපාරයක් හා පුළුල් ජනතා බලවේගයක් ගොඩනැගීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර තිබේ.

මෙහි පළමු පියවර ලෙස මෙම ජනවාරි 08වැනි දින නුගේගොඩදී උද්ඝෝෂණ රැලියක් හා පා ගමනක් සංවිධානය කිරීමට ජ.වි.පෙ. කටයුතු යොදා ඇති අතර ඒ සඳහා රාජපක්ෂ පාලනය අවසන් කිරීම සඳහා දායක වූ බහුජන සංවිධාන, වෘත්තීයවේදීන්, කලාකරුවන්, බුද්ධිමතුන් ඇතුළු පුළුල් ජනතා බලවේග ඒකරාශි කරගැනීමටද නියමිතය.

පැවති පාලන සමයේ වංචනිකයින්ට, දූෂිතයින්ට හා ඝාතකයින්ට එරෙහිව ප්‍රමාණවත් නීතිමය පියවර ගැනීමට අසමත්වී ඇති එ.ජා.ප.-ශ්‍රී.ල.නි.ප. හවුල් ආණ්ඩුව සිය 2016 අයවැය මගින් රාජ්‍ය දේපළ විකුණා දැමීමටද ජනතා සහන කප්පාදු කිරීමටද ජාවාරම්කාරයින් සතුටු කිරීමටද කටයුතු කරමින් යහපාලනය පිළිබඳ වූ ජනතාවගේ සියලු බලාපොරොත්තු බිඳ දමා ඇත. මේ තත්වය හමුවේ රාජපක්ෂ පාලනය අවසන් කිරීමට දායක වෙමින් සැබෑ යහපාලනයක් පිළිබඳ බලාපොරොත්තු දල්වාගත් ජනතාව සිටිනුයේ බලවත් කලකිරීමකය.

ජනවාරි 08 රාජපක්ෂ පාලනය පරාජයට පත්කළ ජනතා බලවේග හමුවේ ඉතිරිව ඇති විකල්පය වන්නේ, රාජපක්ෂ පාලනය ගිය මඟෙහිම යන වත්මන් පාලනයද පරාජයට පත්කරමින් නව සමාජ ආර්ථික දේශපාලන ක්‍රමයක් වෙත පියනැගීම පමණක් බව අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ඒ සඳහා දැවැන්ත ජනතා බලයක් ගොඩනැගීමට ජ.වි.පෙ. කැපවී සිටින බව පැවසීය.

## *03 පිටුවෙන්* 2016 සුවිශේෂ...

එරෙහිව පාරට බහින තත්වයක් මතුවී තිබෙනවා. අගෝස්තු මාසේ 17වෙනිදා මැතිවරණයෙන් පසුව ආණ්ඩුවක් ගොඩනැගිලා කෙටි කාලයක් තුළ ඉදිරිපත් කරන අයවැය ලේඛනයක්. ඒක අවම වශයෙන් ජනතාවගේ මූලික සිතැඟි සහ අරමුණු සමග සමපාත විය යුතුයි කියල සාමාන්‍ය මතයක් තිබෙනවා.

එහෙත් අද අපේ රටේ ධනවාදය මුහුණදී තිබෙන අර්බුදයේ ප්‍රකාශනය තමයි මේ අයවැය ලේඛනය. කිසිසේත්ම හුස්ම ගැනීමටවත් යම් කාලයක් ලබා නොදී, මේ සියල්ල පොඩි පට්ටම් කරමින් යන ගමනකට අවශ්‍ය අවතීරණ වීම තමයි, මේ අයවැය ලේඛනයේ හරය බවට පත්වී තිබෙන්නේ. යම් යම් ප්‍රතිසංස්කරණ සිදුවී තිබුණත් මෙහි හරය කිසිසේත්ම වෙනස් කර නැහැ. විශේෂයෙන්ම වර්තමානයේ පාලනය හොබවන ධනපති පාලන පක්ෂ කල්පනා කරනවා, ආණ්ඩුවේ කාර්යභාරය යටිතල පහසුකම් සැපයීම සහ නීති සම්පාදනයට සීමාවිය යුතුයි. අනික් සියල්ල ආණ්ඩුවෙන් ගලවා එළියට ලබාදිය යුතුයි කියලා. ඒ නිසා ඊට අවශ්‍ය නීති සංශෝධන, ඊට අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් මෙම අයවැය ලේඛනයේ සඳහන් කර තිබෙනවා. ඒනිසා අපේ රටේ ආර්ථිකයේ ජාතික පංගුව මුළුමනින්ම විනාශයට පත් කරමින්, එය ඉතා කුඩා පැලන්තියක් වෙත ආර්ථිකයේ සියලු ධාරාවන් කේන්ද්‍රගත කරන සැලස්මක් තමා මෙම අයවැය ලෙඛනයෙන් ඉදිරිපත් කර තිබෙන්නේ.

***නියමුවා:- ඒ කුමන ක්ෂේත්‍රවලින්ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන් අපේ රටට වෙළඳපොළ ධනවාදය ආවත් අවශ්‍ය වන ප්‍රමාණයට අපේ රටේ කෘෂිකර්මාන්තය විවෘත කරගන්න බැරිවුණා. ඒනිසා ඒ කෘෂිකර්මාන්තය විවෘත කිරීමට අවශ්‍ය ඉඩකඩ මින් නිර්මාණය කරගෙන තියෙනවා. ඉඩම් සීමාවන් ඉවත් කිරීම, ඉඩම් බැහැර කිරීමේ සීමාවන් ඉවත් කිරීම, විදේශීන්ට ඉඩම් මිලදී ගැනීමේදී බදු ඉවත් කිරීම, ගොවිපළවල් පෞද්ගලික අංශය වෙත පැවරීම, ඉඩම් බැංකුවක් සකස් කිරීම, පොහොර සහනාධාරය ඉවත් කිරීම, වී වගාවෙන් ඉවත් කොට වෙළඳභෝග වගාව සඳහා ජනතාව පෙළඹවීම ආදී මේ සියල්ල තුළ සඳහන්වී තිබෙන්නේ මෙතෙක් මෙම වෙළඳපොල ධනවාදයට කෘෂිකර්මාන්තය තුළට වේගයෙන් කිඳාබසින්න බැරිවුණා. ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ මෙම අයවැය තුළින් සකස්කර තිබෙනවා. ඒවගේම තමයි විශේෂයෙන්ම රාජ්‍ය අංශය කුඩා කරමින් එයට ජනතාවගේ තිබෙන ආකර්ෂණය කප්පාදු කරමින් රාජ්‍ය අංශය දියකර හැරීමේ සැලැස්ම දියත් කර තිබෙනවා. ඒ වගේම ඔවුන්ට බලශක්ති ක්ෂේත්‍රයට අවතීරණ වෙන්න බැරිවුණා. නමුත් විදුලි සහ බලශක්ති ක්ෂේත්‍රයට අවතීරණ වීමේ සැලැස්ම මේ තුළ ඉදිරිපත් කර තියෙනවා. මූල්‍ය ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් විවෘත කිරීම පවා සිදුකරමින් තිබෙනවා.

ඒනිසා මෙතෙක් මේ වෙළඳපොළ ධනවාදයට රිංගන්න බැරිවූ යම් ප්‍රමාණය එනම් ආර්ථිකයේ ජාතික පංගුවක් ආරක්ෂාකර ගත්තු ක්ෂේත්‍රය පොඩිපට්ටම් කරමින් යන ගමනක්. ඉතින් මේ ගමන කිසිසේත්ම හිතකර ගමනක් වෙන්නේ නැහැ. මේ ගමන්කරමින් තිබෙන ආර්ථික දිසාවට වඩා වේගයෙන් සියල්ල පොඩිපට්ටම් කරමින්, සියල්ල විනාශ කරමින් යන ගමනක්. ඒනිසා අනිවාර්යයෙන්ම මේ ගමනට එරෙහිව ජනතාව පෙළගස්සන්න සටන් මාවතකට අවතීරණ විය යුතුව තිබෙනවා.

***නියමුවා:- 2015 ජනවාරි 08වැනිදා එතෙක් පැවති සමාජ ආර්ථික රටාවේ වෙනසක් අපේක්ෂා කළ ජනතාව 2016 ජනවාරි වන විට සිටින්නේ අපේක්ෂාභංගත්වයකයි. ඔවුන් සමඟ ජ.වි.පෙ.ට ඇත්තේ කවරාකාර සබඳතාවක්ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ජනතාව තුළ විශාල බලාපොරොත්තු තිබුණා. නමුත් දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපට ඒ සීමා මායිම් පිළිබඳ අදහසක් තිබුණා. මොකද මේ ගොඩනැගෙන්නේ ධනපති පාලනයක්. ඒ ධනපති පාලනයට ප්‍රජාතන්ත්‍රවාදය, නිදහසේ ජනතාවගේ අයිතිවාසිකම්, ආර්ථික සාධාරණත්වය, වංචා දූෂණ, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය මොන තරම් ප්‍රමාණයෙන් ආරක්ෂා කරගන්න පුළුවන්ද කියන එක ගැන ඉතා නිවැරැදි දැක්මක් තිබුණා. නමුත් ජනතාවගේ බලාපොරොත්තු ඊට වඩා ඔබ්බට ගිහින් තිබුණා. ඒ නිසා ජනවාරි මාසේ 08 වෙනිදා මේ ආණ්ඩුව බලයට පත්කරන්න විවිධ ආකාරයෙන් දායකත්වය දීපු පිරිස් වික්ෂිප්තභාවයට පත්වෙලා තිබෙනවා; අතරමංවීමට පත්වී තිබෙනවා.

ඒ නිසා අපි ඔවුන්ට කියන්නේ, අපි හමුවේ තිබෙන්නේ, එක් එක් ආණ්ඩු මාරුකිරීම සහ එක් එක් නායකයන් මාරුකිරීම නොවෙයි. එයට වඩා පුළුල් ආර්ථික දේශපාලන පරිවර්තනයක් අපට අවශ්‍යවී තිබෙනවා. ඒ පරිවර්තනය වෙනුවෙන් ජනතාව පෙළගැස්විය යුතුයි. විශේෂයෙන්ම අපි ජනවාරි මාසේ 08වෙනිදා රාජපක්ෂ පාලනය බිඳවැට්ටවීමට දායකවී තිබෙනවා. ඒ සියලු කණ්ඩායම් වලට අපි ආරාධනය කරනවා, අපි එකට එක්වී පොදුජන වේදිකාවක් ගොඩනගමු. ඒ සඳහා අපි ආරම්භයක් මේ ජනවාරි මාසෙ 08වෙනිදා නුගේගොඩදී පෙළපාලියක් රැස්වීමක් පවත්වන්න සූදානම්. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, නිදහස පිළිබඳව, ආර්ථිකය පිළිබඳව, විවිධ එකඟතාවයන් අපි අතර වෙනස්කම් තිබෙන අතර බොහෝ කරුණු පිළිබඳව එකඟතාවයන් තිබෙන දේශපාලන සමාජයේ බලවේගයන් එක් මධ්‍යස්ථානයකට කැඳවීම තමයි අපට දැන් කළ යුතු වන්නේ, ඔවුන් එක්ක පුළුල් සාකච්ඡාවක් අපි ආරම්භ කර තියෙනවා.

***නියමුවා:- ජ.වි.පෙ. විසින් ඉදිරිපත් කරන දේශපාලන විග්‍රහය දෙස ජනතාව උනන්දුවෙන් බලාසිටිනවා. එහෙත් මේ ජනතාව ජ.වි.පෙ. ඡන්ද පදනම බවට පත්කර ගැනීම තවමත් පවතින්නේ අභියෝගයක් ලෙසයි. ඒ සඳහා නව වසර තුළ වන සැලසුම් කවරේද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන් අප දන්නවා, ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි මේ රටේ ජනතාව විශාල කැමැත්තක් සහ විශාල විශ්වාසයක් ගොඩනැගිලා තිබෙනවා. නමුත් ඒ කැමැත්ත, විශ්වාසය මැතිවරණයකදී ඡන්දයක් බවට පරිවර්තනය කරන්න අසමත් වෙලා තිබෙනවා. ජනතාව ඡන්දයක් ප්‍රකාශයට පත්කරන කොට දේශපාලන නිවැරදිභාවය පක්ෂවල තිබෙන නිවැරදිභාවයට වඩා තවත් ඊට වඩා ප්‍රමුඛවූ තවත් වෙනත් කාරනා පිළිබඳ සැලකිල්ලක් කරනවා. ඒ නිසා ඇත්තෙන්ම මැතිවරණ වලදී ජනතාවගේ කැමැත්ත සාධාරණව පිළිබිඹු වෙන්නේ නැහැ.

නමුත් අපට මේ ජනතාව දිනාගත යුතුයි. ඒ වෙනුවෙන් අපි විශේෂයෙන් මේ අවුරුද්දේ ඉලක්ක කරගත්තු යාන්ත්‍රණ තුනක්, එකක් රට තුළ ප්‍රබල මහජන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා පුළුල් පෙරමුණක් ගොඩනැගීම ඉලක්ක කරගත්තු වැඩ සටහනක්, දෙක අපේ පක්ෂයේ සංවිධාන යාන්ත්‍රණය ශක්තිමත් කරන්න අලුත් ජවයක්, නැවුම්භාවයක් අපේ ව්‍යාපාරයට කැඳවාගෙන ඒම වෙනුවෙන් අපේ තරුණ සංගමය ගොඩනැගීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර තියෙනවා. අපි හිතනවා, අපේ රටේ තරුණ ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණත් එක්ක දේශපාලනයට එන අපේ රටේ තරුණ තරුණියන් සමඟ නැවුම් දේශපාලනයක් බවට පරිවර්තනය කළ හැකිවේවි. ඒ සඳහා අපි වැඩසටහන් සකස් කර තියෙනවා. නමුත් ග්‍රාමීය වශයෙන්, විශේෂයෙන් ගම සහ පක්ෂය අතර තිබෙන බැඳීම සැලකිය යුතු ප්‍රමාණයකින් දුබලවෙලා තියෙනවා. යළි ගම ජනතා විමුක්ති පෙරමුණට එක්රැස් කරගැනීම වෙනුවෙන් අපි සමිති යාන්ත්‍රණයක් යෝජනා කර තිබෙනවා. ඒ වෙනුවෙන් වඩාත් ධෛර්ය සම්පන්නව විශ්වාසයෙන් යුතුව මේ වසර ජයග්‍රාහී වසරක් බවට පත් කරගැනීමේ අරමුනින් යුතුව අපි විවිධ සැලසුම් සකස් කර තියෙනවා. ඒ සැලසුම්වල සුවිශේෂ ජයග්‍රහණයක් මේ වසර තුළ අත්පත් කරගත හැකිවේවි කියන විශ්වාසයක් අපට තිබෙනවා.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අලුත් අවුරුද්දේ අලුත් අභියෝග

ලොව ජනතාව 2015 වසර අවසන් වී 2016 වසරට පා තබා සිටිති. ඒ, කැලැන්ඩරයට අනුවය. වසරක් ගෙවී නව වසරක් උදාවීමත් සමඟ ජනතාව සුබ අලුත් අවුරුද්දක් වෙනුවෙන් එකිනෙකාට සුබ පතා ගනිති. එය හොඳ දෙයකි. ඒකාකාරීව ගලායන ජීවිතය අලුත් කරගැනීමට අලුත් අවුරුද්ද නම් අවස්ථාව ලැබීමත් ඒ සඳහා එකිනෙකාට සුබ පතා ගැනීමත් සමාජීය අර්ථයෙන් ගත් විට හොඳය.

අවුරුද්ද මනින භෞතික චලනයට අනුව නම් මෙහි අලුත් දෙයක් නැත. පෘථිවිය සූර්යා වටා පැරණි මඟෙහි පැරණි ලෙස ගමන් කරමින් සිටී. එහෙත් මානව සමාජයේ කාලය මනින කැලැන්ඩරයට අනුව එක් වසරක කාලය ආරම්භ වීම අලුත් වීමකි. අලුත් අවුරුද්දකි. අත්හළ යුතු පැරණි දේ ඉවත දමා ජීවිතයට එක්කරගත යුතු නව දේ සඳහා ජීවිතය අලුතින් පටන් ගැනීම සඳහා මෙය හොඳ අවස්ථාවකි. එබැවින් අලුත් අවුරුද්ද සැබැවින්ම සුබ අලුත් අවුරුද්දක් වනු ඇත්තේ, ජනතාව පසුගිය වසරවල කළ එලක් නැති හා වැරදි දේ ඉවත දමා එලක් ඇති නව දේ වෙතට යොමුවන්නේ නම් පමණි. මේ වසරේද කරන්නේ පැරණි අවුරුදුවල කළ දේම නම් මේ වසරේ හිතන්නේ, පැරණි අවුරුදුවල හිතූ ආකාරයටම නම්, මේ වසරේ ජීවිත හසුරුවන්නේ හා තීරණ ගන්නේ පැරණි ලෙසට නම් අවුරුද්ද අලුත් හෝ “සුබ” වන්නේ නැත.

පසුගිය කිසිදු වසරක් මෙරට පොදු ජනතාවට සුබ වූයේ නැත. හැම වසරකම බඩුමිල වැඩිවීම, බදුබර, ආර්ථික අමාරුකම් ආදිය දරා ගැනීමට ජනතාවට සිදුවිය. වසරින් වසර දරුවන්ගේ අධ්‍යාපනය දුෂ්කර ක්‍රියාවක් විය. රැකියා නැතිකම ඉහළ ගියේය. අපරාධ වැඩිවිය. ජීවිතය දුෂ්කර හා අමාරු විය. ජනවාරි 01දා කරන සුබ ප්‍රාර්ථනාවලින් ඒවා වෙනස් වූයේ නැත. ඒ ඇයි? නව වසරට සුබ පතා ගත්තද ජනතාව චින්තනයෙන් හා භාවිතයෙන් අලුත් නොවූ නිසාය.

2016 වසර එළඹෙන්නේ, ජනතාව දිරිපිට අභියෝග රැසක් තබමිනි. එක අතකින් රු. බිලියන 740 ඉක්මවූ අයවැය පරතරයක් විසින් පෙන්නුම් කළ මහා ආර්ථික අර්බුදයක බර ජනතාව මතට පැටවීමේ අනතුර තිබේ. ඒ නිසාම අධ්‍යාපනය ඇතුළු ජනතා සේවා හා සහන කප්පාදු වීමේ අනතුර මතුව තිබේ. ඡන්ද කල් යමින් තිබේ. ධනපති පක්ෂ සිය බල අර්බුදය විසඳා ගැනීම සඳහා නව ව්‍යවස්ථා නව මැතිවරණ ක්‍රම හැදීමට පිඹුරුපත් සකස් කර තිබේ. ඒ තුළ ජනතාව ඉදිරියේ අභියෝග රැසක් තිබේ.

තමන්මත පැටවෙන ජීවන බර අඩුකර ගැනීම සඳහාත් අහෝසි වන සහන හා අයිතීන් රැක ගැනීම සඳහාත් ජනතාව ඉදිරිපිට සටනක් නිර්මාණය වීම අනිවාර්යයක්ව තිබේ. ධනපති පංතියේ නව ව්‍යවස්ථා ජනතාවට හානිකර දෙසට යාමට ඉඩ නොදීමේ අභියෝගය ජනතාව ඉදිරියේ තිබේ. නව අයිතීන් දිනා ගැනීමේ අභියෝගයද ජනතාව ඉදිරියේ තිබේ. ඒ සියල්ලම තාවකාලික නිසාත් ඒවා යළි අහිමි වීමේ ඉඩ පවතින නිසාත් ස්ථිරසාර හා සැබෑ ජයග්‍රහණ සඳහා අලුත් දේශපාලන ගමන්මඟකට යාමේ වුවමනාවද මතුව තිබේ.

පැරණි ධනවාදී සමාජය දැන් යල්පැන ගොස් අවසන්ය. එයට ‘අලුත්’ හෝ ‘සුබ’ කිසිවක් ජනතාව වෙනුවෙන් ලබා දිය නොහැක. පැරණි යල්පැන ගිය සමාජයක ජීවත් වෙද්දී කිසිදු අවුරුද්දක් අලුත් වන්නේ හෝ සුබ වන්නේද නැත. එබැවින් පැරණි අවුරුදු සමඟ පැරණි ප්‍රශ්න හා ගැටලු සමඟ, පැරණි අර්බුද සමඟ, පැරණි සියලු දුක් වේදනා සමඟ, පැරණි අසාධාරණයන් හා අයුක්තීන් සමඟ පැරණි පාලනයන් සමඟ පැරණි ධනවාදී සමාජ ක්‍රමය අවසන් කළ යුතුය. ඒ වෙනුවට සැබැවින්ම අලුත්, සැබැවින්ම සුබ විකල්ප සමාජ ක්‍රමයක් ගොඩනැගිය යුතුය. පැරණි ධනවාදය පරදා නවීන සමාජවාදය දිනාගත යුතුය. ඒ සඳහා පැරණි, සම්ප්‍රදායික අසාර්ථක ධනවාදයට වාසිදායක වූ දේශපාලන ගමන අතහැර දමා නව දේශපාලන ගමනක් ආරම්භ කළ යුතුය. එය ජයග්‍රහණය සඳහා රැගෙන යා යුතුය. අලුත් අවුරුද්ද සැබැවින්ම අලුත් වනු ඇත්තේද සුබ වනු ඇත්තේද එම ක්‍රියාමාර්ග තුළ පමණි.

පැරණි මග අතහැර අලුත් අවුරුද්දේ අලුත් මගක් ගැනීමට අධිෂ්ඨානයෙන් පෙරට එන ලෙස සැමගෙන් ඉල්ලා සිටින අපි එම අලුත් හා නිර්භීත තීරණය ගැනීම සඳහා සැමට සුබ පතමු.

# 2016 සුවිශේෂ ජයග්‍රහණ ලබන වසරක් වේවි



ජ.වි.පෙ. නායක
අනුර දිසානායක සහෝදරයා

***නියමුවා:- හවුල් ආණ්ඩුව රාජපක්ෂ පාලනයෙන් වෙනස්ද? වෙනස්නම් ඒ කොතැනින්ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** පැවැති රාජපක්ෂ පාලනය හා පවතින පාලනය මූලික වශයෙන්ම ධනපති ක්‍රමය පවත්වාගෙන යාම වෙනුවෙන් ගොඩනැගුණු පාලනයක්. ඒ නිසා හරයාත්මක වශයෙන් ගත් කල පාලනයන් දෙක අතර වෙනසක් නැහැ. නමුත් අප දන්නවා රාජපක්ෂ පාලනය ගොඩනැගී තිබුණු තත්වය. නීතියේ විධානය, ආධිපත්‍යය කඩා වට්ටමින් එක් පවුලක් වටා මුළු බලය කේන්ද්‍රගත කරමින්, මාධ්‍යවේදීන් දඩයම් කරමින්, සාමාන්‍ය ජනතාව භීතියට පත් කරමින්, වංචා දූෂණවල කෙළපැමිණෙමින් සහ ලෝකය හමුවේ අපේ රට හුදකලා රාජ්‍යයක් බවට පත්කරමින් ගමන් කරපු ගමන් මාවතක් තිබුණා. ඒ ගමන් මාවත අවසන් කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදයට යම් ඉඩකඩක් විවෘත කරගැනීම අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස මතුවුණා. ඒ අනුව තමයි රාජපක්ෂ පාලනය බිඳවැටෙන්නේ. රාජපක්ෂ පාලනයෙන් පසුව ගොඩනැගුණු පාලනය පිළිබඳව ජනතාවගේ අපේක්ෂාවන්, බලාපොරොත්තු වුවමනාවන් විශාල ප්‍රමාණයක් තිබුණා.

***නියමුවා:- නමුත් ජ.වි.පෙ. ගොඩනැගුණු පාලනයේ කොටස්කරුවෙක් වුණේ නැහැ?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ඔව්. දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපට එම ගොඩනැගෙන පාලනය පිළිබඳව ඔවුන්ගේ සීමා මායිම් පිළිබඳව ඉතාමත් හොඳ නිරවුල් අවබෝධයක් තිබුණා. ඒ හේතුවෙන්ම තමයි අපි ජනාධිපතිවරණයේදී ඉතා පැහැදිලි ලෙසම මේ රටේ ජනතාව වෙත වෙනස් පණිවුඩයක් ගෙනගියේ. ඒ තමයි, රාජපක්ෂ පාලනය බිඳවැට්ටිය යුතුයි. එහෙත් ගොඩනැගෙන පාලනය පිළිබඳව අපට සහතික ලබාදෙන්න බැහැ කියන එක. නමුත් ගොඩනැගෙන පාලනයෙන් තමන්ගේ අයිතිවාසිකම් දිනාග ැනීම වෙනුවෙන් ජනතාව පෙළගැසිය යුතුයි කියන නිශ්චිත දේශපාලන අදහස අපි සමාජය වෙත කැටුව ගියා. රාජපක්ෂ පාලනය බිඳවැටීමත් සමගම යම් ප්‍රමාණයකට ප්‍රජාතන්ත්‍රවාදයේ ඉඩකඩ විවරව තිබෙනවා. විශේෂයෙන්ම 19වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ නව නීති ප්‍රමාණයක් තහවුරු කිරීම, මාධ්‍යවලට යම් තාවකාලික ඉඩක් ලබාදීම සිදුවෙලා තිබෙනවා. හැබැයි අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ, මේ ඇතිවී තිබෙන තත්වය දිගුකාලයක් පවතීවි කියලා.

***නියමුවා:- ඇයි ඒ?***

***අනුර දිසානායක සහෝදරයා:-*** මොකද ධනපති පාලනයන් ඒ තුළ ගැබ්වී තිබෙන අර්බුදයට අනිවාර්යෙන්ම ලක්වීමේදී ඔවුන් ඇතිවී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය, නිදහසේ ඉඩකඩ අහුරන බව අපි ඉතිහාසය තුළ ඕනෑවටත් වඩා වැඩියෙන් අත්විඳලා තිබෙනවා. ඒ නිසා මේ පාලනයත් මේ ඇතිවී තිබෙන යම් ප්‍රජාතාන්ත්‍රික ඉඩකඩ අහුරන බව පැහැදිලියි. හැබැයි අප සතු වගකීම තමයි මේ ඇතිවී තිබෙන තත්වය තවදුරටත් වර්ධනය කරගැනීමේ සහ දිගුකාලීනව ආරක්ෂා කරගැනීම සඳහා පුළුල් පවුරක් ගොඩනැගීම. ඒ වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් නිදහස සඳහා වූ ජනතා පවුරක් ගොඩනැගිය යුතුව තිබෙනවා.

අනික් පැත්තෙන් ආර්ථිකයේ දිශානතිය බැලුවොත් විශේෂයෙන් 1977 දශකයේ මුල් භාගය වනකොට ධනපති ක්‍රමය අර්බුදයට ගොස් තිබුණා. ඒ නිසා එය ලෝකය පුරා නව අත්හදා බැලීම් කරමින් තිබුණා, නව ක්‍රමවේදයන් වෙත යන්න. ඒ අනුව තමයි වෙළඳපොළ ධනවාදය අපේ රටේ ස්ථාපිත වෙන්නේ. ජේ.ආර්.ගේ අවධියේත් ප්‍රේමදාසගේ අවධියේත්, චන්ද්‍රිකාගේ අවධියේත්, මහින්ද රාජපක්ෂගේ අවධියේත් එක් එක් රිද්මයට අනුව, විටෙක වේගයෙන්, විටෙක අඩ සහිත ගමනකින් මේ ගමන් මාවතේ ගමන් කරමින් තිබුණා. හැබැයි රනිල් වික්‍රමසිංහ මහත්තය ඒ ගමන් මාවත වඩාත් වේගයෙන් සියල්ල පොඩිපට්ටම් කරමින් යන දිසාවකට අවශ්‍යවන ආර්ථික උපායමාර්ග සකස්කර තියෙනවා. ඒ ආර්ථික උපාය මාර්ගය, අපේ රටේ ජනතාව ආර්ථිකයෙන් පිටමන් කර ඉතා කඩා කණ්ඩායමකට පමණක් ආර්ථිකයේ ප්‍රතිලාභ ලැබෙන උපායමාර්ගයක්, එය කිසිසේත්ම රාජපක්ෂ පාලනයෙන් වෙනස් වෙන්නේ නැහැ. ඒවගේම තමයි දේශපාලන, සංස්කෘතිමය වශයෙන් ගත්තත් මේ දෙකෙහි වෙනසක් නැහැ. වංචාවෙන්, දූෂණයෙන් නාස්තියෙ සහ දේශපාලන සංස්කෘතියේ බොහෝ අංගයන් රාජපක්ෂ පාලනය හා සමානව තිබෙනවා. ඒ නිසා යම් අඩු වැඩිවීම් පාලන දෙක අතර තිබුනත් හරයාත්මකව ගත්තොත් මෙය ධනපති ක්‍රමය පවත්වාගෙන යාම වෙනුවෙන් ගොඩනැගී තිබෙන ධනේශ්වර ආණ්ඩුවක් කියන මූලධර්මයට යටත්ව තමයි මෙම පාලනයන් දෙකම පවතින්නේ.



“මෙතෙක් මේ වෙළඳපොළ ධනවාදයට රිංගන්න බැරිවූ ප්‍රමාණය එනම් ආර්ථිකයේ ජාතික පංගුවක් ආරක්ෂාකර ගත්තු ක්ෂේත්‍රය පොඩිපට්ටම් කරමින් යන ගමනක්. ඉතින් මේ ගමන කිසිසේත්ම හිතකර ගමනක් වෙන්නේ නැහැ. මේ ගමන්කරමින් තිබෙන ආර්ථික දිසාවට වඩා වේගයෙන් සියල්ල පොඩිපට්ටම් කරමින්, සියල්ල විනාශ කරමින් යන ගමනක්. ඒනිසා අනිවාර්යෙන්ම මේ ගමනට එරෙහිව ජනතාව පෙළග ස්සන්න සටන් මාවතකට අවතීර්ණ විය යුතුව තිබෙනවා. ”

***නියමුවා:- ජනතා විරෝධය මැද ආණ්ඩුව විටින් විට අයවැයට සංශෝධන ඉදිරිපත් කළා. එහෙත් මූලික වශයෙන් රටේ ආර්ථිකයේ විනාශකාරී දිශානතියට අදාළ කරුණු කිසිවක් ආපසු ගෙන නැහැ. මෙය රට කොතැනට ගෙනියනු ඇතිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන්ම මෙම අයවැය ලේඛනය සියලු ජනතාවගේ විරෝධයට පත්වී තිබෙනවා. ගොවි ජනතාව, තරුණ පරම්පරාව, ධීවර ජනතාව, රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, බැංකු නිලධාරීන් මේ සියලු දෙනා තමන්ගේ අයිතිවාසිකම් කප්පාදුවට එරෙහිව, ඒ විතරක් නෙවෙයි පරණ යකඩ එකතු කරන්නන් පවා මෙම අයවැය ලේඛනයට

**02 වැනි පිටුවට**

# WFDY
# ලෝක වමේ තරුණ බලකොටුව

"WFDY උප සභාපති ධුරය සමාජවාදී ශිෂ්‍ය සංගමයට" යන හිසින් යුතු පුවතක් පසුගිය නියමුවා කලාපය තුළින් ඔබ නෙත ගැටෙන්නට ඇත. මේ පුවත දුටු මොහොතේ පටන් බොහෝ දෙනෙකුට ක්ෂණයෙන් නැගුණු පැනය වූයේ "මොකක්ද මේ WFDY කියන්නේ, ඇයි මේ තරම් වැදගත්?" යන්න ඉදින් මෙවර නියමුවා - තරුණ පිටුවෙන් මේ ඉඩකඩ වෙන්වන්නේ ඊට පිළිතුරු සෙවීමටය.

අධිරාජ්‍යවාදී රාජ්‍යයන් විසින් සිය වෙළඳපොළ වුවමනාවන් වෙනුවෙන් කළ මැදිහත් වීමේදී රාජ්‍යයන් අතර යුද ගැටුම් වර්ධනය වීම නිරන්තරයෙන්ම සිදුවන්නට විය. ජීවිත ලක්ෂ ගණනින් විනාශ කර දමමින් සැහැල්ලු ආයුධවල පටන් බර අවි දක්වා සංක්‍රමණය වූ පළමු ලෝක යුද්ධයේ පටන් දෙවන ලෝක යුද්ධයේ අවසානය දක්වා ලෝකය ගමන් කළේය. ඒ, තුන්වන ලෝක යුද්ධයක් කෙරෙහි සමස්ත ලෝකවාසී ජනතාව තුළ දැඩි අප්‍රසාදයක් හා බියක් ඉතිරි කරවමිනි.

මෙවන් වටාපිටාවක් තුළ තවත් එවැනිම විනාශකාරී ව්‍යසනයක් ඇතිවීම වැළැක්වීම වෙනුවෙන් මුළුමහත් ලෝකය පුරාම විසිරී සිටින ජනයා අන්තර් ජාතික වශයෙන් එක්වීම අනිවාර්යයක් බවට පත්විය. එනිසාම බිහිවූ තවත් සංවිධාන ගණනාවක් අතර ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයට (World Federation of Democratic Youth - WFDY) හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. සාමය, සහයෝගිතාවය හා අධිරාජ්‍ය විරෝධය යන සංකල්පයන් පෙරදැරි කරගනිමින් එවකට පැවති සෝවියට් දේශයේ මූලිකත්වයෙන් ආරම්භ කෙරුණු මෙම තරුණ සංවිධානයට ලොව නන් දේශයන්හි තරුණ තරුණියන්ගේ ජාත්‍යන්තර අනුග්‍රහ හා දායකත්වය නොමදව ලැබුණි. 1945 වසරේ නොවැම්බර් 10වැනිදා ලන්ඩන් නුවරදී ආරම්භ කෙරුණු මෙම සංවිධානය එහි ආරම්භයේ සිටම මිලියන 30කට අධික තරුණ ප්‍රජාවක් විසින් නියෝජනය කරනු ලබයි. අධිරාජ්‍ය විරෝධය වෙනුවෙන් ගොඩනැගී ඇති ලොව විශාලතම හා ප්‍රගතිශීලීතම තරුණ ව්‍යාපාරය වූ මෙහි සාමාජික සංවිධාන ද්විත්වයක් ලෙස සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබයි. පක්ෂය නියෝජනය කරමින් ප්‍රථම වතාවට WFDY සමඟින් අත්වැල් බැඳගන්නේ 1978 දීය. ඒ, එම වසරේදී කියුබාවේ හවානා අගනුවර පැවැත්වුණු එම සංවිධානයේ 11වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල සඳහා රෝහණ විජේවීර සහෝදරයාගේ සහභාගිත්වයත් සමගිනි.

පසුගිය 70 වසරක WFDY ඉතිහාසය ඉතා සංක්ෂිප්තව සටහන් කළහොත් එහි ප්‍රධාන යුග දෙකක් හඳුනාගත හැකිය. ඉන් පළමුවැනි යුගය වන්නේ සෝවියට් දේශය ඇතුළු නැගෙනහිර යුරෝපීය සමාජවාදී රාජ්‍ය පද්ධතිය පැවති පළමු වසර 45ක යුගයයි. (1945 සිට 1990 දක්වා වූ කාලය) මේ යුගය යනු ලොව සියලුම අධිරාජ්‍ය විරෝධී ක්ෂේත්‍ර වෙත බලය හා භෞතික හා දේශපාලන ශක්තියද ඒකරාශි වී තිබුණු යුගයක් වන බැවින් WFDYයට ඉතා ශක්තිමත්ව ලෝකය පුරා තහවුරු වීමට අවස්ථාව උදාකර වූවකි.

එසේම දෙවැනි යුගය ඇරඹෙන්නේ ලෝකය තුළ සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිඳවැටීමත් සමගය. එක් අතෙකින් භෞතික සම්පත් පිළිබඳව අතිදුෂ්කර කොන්දේසිවලට මුහුණ දීමට සංවිධානයට සිදු විය. එසේම 90 දශකය තුළ දේශපාලන දුෂ්කරතාද ඉතා දැඩිව මතුවන්නට විය. නමුත් ලෝකයේ පොදු අධිරාජ්‍ය විරෝධී අරගලය සේම WFDYයද එම දුෂ්කර කොන්දේසි යටතේත් අරගලය දිගින් දිගටම පවත්වා ගෙන යාමට හුරු විය.

එසේ වීමට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ වූයේ WFDY සාමාජික තරුණ සංවිධාන පොදුවේ ශක්තිමත් වීමත්, ඒ මඟින් WFDY ලොව පුරාම තරුණ ජනයාට සම්බන්ධ වීමත්ය. එහි ශක්තිය පදනම් වී ඇත්තේ අධිරාජ්‍ය විරෝධී ස්ථාවරයක සිට කටයුතු කරන සාමාජික සංවිධානවල අරමුණු හා ක්‍රියාකාරිත්වය, සංවිධානයේ අරමුණු හා ක්‍රියාකාරිත්වය සමග එකිනෙක බද්ධ වීම මතය. අතීතයේ තරම් තවමත් භෞතික වශයෙන් ශක්තිමත් නොවූවද ලෝකයේ තරුණ ප්‍රජාවට වඩාත්ම බලපාන, ඔවුන්ගේ දෛනික අරගලය හා ජීවිත සමග සම්බන්ධ, ලෝකයේ ශක්තිමත්ම තරුණ සංවිධානය වන්නේ WFDYයම බව අවිවාදාත්මකය.

ගත වූ 70 වසර පුරා සාමාන්‍ය ජනතාවගේ, තාරුණ්‍යයේ හා වැඩකරන පන්තියේ ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටින්නා වූ ද ඔවුන්ට සාමකාමී ජීවිතයක් හිමිකර දීම වෙනුවෙන් හා ඔවුන්ගේ වරප්‍රසාද තහවුරු කරනු ලැබීමට ඇති අයිතිය වෙනුවෙන් පෙනී සිටින්නා වූද එකම ජාත්‍යන්තර තරුණ සංවිධානය බවට පත්වීමට ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය සමත්ව ඇත. එය පලස්තීනයේ නිදහස උදෙසා සහයෝගය දක්වන අතර නිදහස් පලස්තීන රාජ්‍යයක් වෙනුවෙන් පලස්තීන ජනතාව සතු අයිතිය පිළිගනු ලැබේ. තවද එය විසින් බටහිර සහරාවේ ස්වයංතීරණ අයිතිය පිළිගනු ලබන අතරම ඇමරිකා එක්සත් ජනපදය විසින් උතුරු කොරියාව ප්‍රකෝප කරවීම නවතන ලෙසද බලකර සිටිනු ලැබේ. කියුබාවට එරෙහි සම්බාධක ඉවත් කරන ලෙසත් ජනතාවගේ නිදහස, අධ්‍යාපනය, සෞඛ්‍ය, විද්‍යාව, තාක්ෂණය හා කලාව යන අංශයන්ගේ දියුණුව හා ඒ තුළින් ජනතාවගේ සංවර්ධනය සඳහා ඇති අයිතියත් වෙනුවෙන් බලකර සිටියි.

පොදු ජනතාවගේ හා වැඩකරන ජනතාවගේ දුක් ගැහැටවලදී ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය ඒ වෙනුවෙන් සැම විටම පෙරමුණ ගෙන පෙනී සිටියි. එය අධිරාජ්‍යවාදයේ ප්‍රයෝජනය වෙනුවෙන් සාමාන්‍ය හා වැඩකරන ජනතාව යොදාග ැනීම ප්‍රතික්ෂේප කරනු ලබයි. එමෙන්ම යුද්ධවලදී පැසිස්ට්වාදී ක්‍රියාකාරකම්වල යෙදීම හා ධනවාදයේ පැවැත්ම වෙනුවෙන් ජනතාව මෙවලමක් කර ගැනීමද ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය විසින් ප්‍රත්ක්ෂේප කරනු ලබයි.

එවන් පසුබිමක් යටතේ WFDY විසින් සංවිධානය කරනු ලබන විශාලතම ක්‍රියාකාරකම වන්නේ ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලයි. (World Festival of Youth and Students - WFYS) එය සෑම වසර 04කටම වතාවක් පවත්වනු ලබන අතර පළමු වන තරුණ හා ශිෂ්‍ය උළෙල පවත්වනු ලැබුයේ 1947දී චෙකොස්ලෝවැකියාවේදීය. 17,000ක් පමණ වූ තරුණ ප්‍රජාවකගේ සහභාගිත්වයෙන් 'තරුණ සමගිය, තිරසාර සාමය උදෙසා පෙරට යාම' යන්න තේමා කරගනිමින් පැවැත්වුණු එම උළෙලේදී පළමු වරට 'ජාත්‍යන්තර තරුණ ගීතය'ද එළි දක්වන ලදී. එතැන් පටන් පැවැත්වූ උළෙල 17කින් අනතුරුව 18වැන්න පැවැත්වූයේ 2013 වර්ෂයේ ඉක්වදෝරයේදීය. එහි තේමාව වූයේ, "ලෝක සාමය, සහයෝගීතාවය සහ සමාජ පරිවර්තනයක් උදෙසා අධිරාජ්‍යවාදය පරදවමු" යන්නය. එසේම 1917දී සිදු වූ ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවයහි 100වැනි සැමරුම පදනම් කරගනිමින් 2017 වසරේදී "19වැනි තරුණ හා ශිෂ්‍ය උළෙල" රුසියාවේදී පැවැත්වීමට නියමිතය.

වර්ෂ 1945 දී ප්‍රංශයේ පැරිස් නුවර WFDY හි මූලස්ථානය ලෙස තෝරාගත්තද යම් යම් අර්බුද හමුවේ එය හංගේරියාවේ බුසාපෙස්ට් දක්වා ගෙනයන ලදී. සංවිධානයේ සභාපති, ලේකම් හා උප සභාපතිවරු තිදෙනා යන ප්‍රධාන තනතුරු 05හි කටයුතු මෙහෙයවන්නේ මෙම මූලස්ථානය මගිනි.

WFDY හි ප්‍රධාන තනතුරු 05 සඳහා නියෝජිතයින් පත්කරගන්නා ක්‍රමවේදයක් ඇත. ඒ අනුව ලෝකය ප්‍රධාන කලාප 05 කට බෙදා ඇති අතර සෑම කලාපයකින්ම එක් තනතුරක් බැගින් නම් කර ප්‍රධාන තනතුරු සඳහා වගකීම් නිශ්චය කර ගනී. එම කලාප 05 වන්නේ

1) ආසියා පැසිෆික් කලාපය
2) අප්‍රිකානු කලාපය
3) ලතින් ඇමරිකානු හා කැරිබියානු කලාපය
4) මැදපෙරදිග කලාපය
5) යුරෝපා හා උතුරු ඇමරිකානු කලාපයයි

එසේම සංවිධාන 140ක් අතරින් කලාපයකින් සංවිධාන 07 බැගින් තෝරාග නිමින් සංවිධාන 35 කින් යුතු මණ්ඩලයක් නම් කර ගැනීමද සිදුකරනු ලබයි. 2003 වසරේ පටන් සමාජවාදී ශිෂ්‍ය සංගමය එහි මහාමණ්ඩල සාමාජිකත්වය දරනු ලබන අතර සමාජවාදී තරුණ සංගමයද එහි සාමාජිකත්වය දරයි.

WFDY හි 70 වන සංවත්සරය හා සමගාමීව කියුබාවේ හවානා නුවරදී පැවැති 19වැනි සම්මේලනය ලාංකේය තරුණ හා ශිෂ්‍ය ප්‍රජාවට අතිශය සුවිශේෂීය. ඒ මේ ලිපිය ලිවීමට පදනම් වූ ප්‍රවෘත්තියේ සඳහන් වූ ඓතිහාසික ජයග්‍රහණය හේතුවෙනි. 70 වසරක WFDY ඉතිහාසය තුළ එහි ප්‍රධාන තනතුරු 05න් එකක් ශ්‍රී ලංකාව නියෝජනය කරන සංවිධානයකට හිමිවූයේ ප්‍රථම වතාවටය. ඒ හැරුණු විට සංවිධානයෙහි මෙවර ප්‍රධාන ලේකම් ධුරය කියුබාවටත් සභාපති ධුරය සයිප්‍රසයටත් හිමි විය.

මෙම තනතුරු සඳහා තේරී පත්වීම සඳහා වඩාත්ම වැදගත් වන්නේ දේශපාලන සුදුසුකම්ය. නියෝජනය කරනු ලබන පුද්ගලයාට වඩා වැදගත් වන්නේ නියෝජනය කරනු ලබන සංවිධානයය. සමාජවාදී ශිෂ්‍ය සංගමය දශක ගණනාවක් පුරාවටම ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය වෙත නායකත්වයත්, ලෝක ශිෂ්‍ය හා තරුණ ප්‍රජාවට ජවය හා ආදර්ශයත් සපයමින් සිටී. ඒ පිළිබඳව ඉතා පුළුල් අවබෝධයක් ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය සතුව ඇත. එසේම සමාජවාදී තරුණ සංගමයද අපේ රටේ පොදු අරමුණු වෙනුවෙන් හා තරුණ අයිතීන් දිනාගැනීම වෙනුවෙන්ද ජාත්‍යන්තර යුතුකම් හා වගකීම් වෙනුවෙන්ද කැප වූ සංවිධානයක් ලෙස ඉදිරියෙන්ම කටයුතු කරමින් සිටී. එවන් පසුබිමක් යටතේ අප මේ සුවිශේෂී ජයග්‍රහණය ලබන්නේද නිතරගයෙන්මය. ආසියා පැසිපික් කලාපය නියෝජනය කරමින් නේපාලයේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංගමයද මෙම තනතුර ඉල්ලා සිටි අතර බහුතර සහය ශ්‍රී ලංකාවේ සමාජවාදී තරුණ සංගමයටත් ශිෂ්‍ය සංගමයටත් හිමි වීම හේතුවෙන් ඔවුන් විසින් සිය අපේක්ෂකත්වය ඉල්ලා අස්කරගනු ලැබීය. අවසන සියලුම සංවිධානවල එකඟත්වයෙන් සමාජවාදී ශිෂ්‍ය සංගමය එම තනතුර සඳහා නිතරගයෙන්ම තේරී පත් විය.



වසර 40 කට ආසන්න සිය සටන් ඉතිහාසය තුළ හෙළූ දහඩිය, කඳුළු හා ලේවල වටිනාකමට පිදූ තවත් ගෞරවයක් මෙන්ම ලාංකේය තරුණ හා ශිෂ්‍ය ව්‍යාපාරය ලද නව පන්නරයක්ද බවට මෙම සුවිශේෂී මෙහොත හා ජයග්‍රහණය පත්වනවාට සැකයක් නැත. වර්තමානයේදී ලෝකය තුළ ව්‍යාප්තව ඇති විශාලතම අධිරාජ්‍යවිරෝධී හා ෆැසිස්ට් විරෝධී තරුණ සංවිධානය වන ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයටද සිය ශක්තිය එක් කරමින් ලාංකේය තාරුණ්‍යයටද නායකත්වය දෙමින් අනාගත සමාජවාදී ලෝකය ගොඩනැගීම උදෙසා සමාජවාදී ශිෂ්‍ය සංගමයටත් සමාජවාදී තරුණ සංගමයටත් ශක්තිය හා ධෛර්යය ලැබේවා යන්න මේ මොහොතේ සුවහසක් වූ තාරුණ්‍යයේ ඒකායන ප්‍රාර්ථනය වනු නිසකය. එසේම එම ප්‍රාර්ථනයන් සියල්ල ඉටුකරමින් මානව සංහතියේ හෙට දවස වෙනුවෙන් අද කළ යුතු යුතුකම් ඉටුකිරීමේදී ලාංකේය තාරුණ්‍යය ලද ආශීර්වාදයක් බවටද මෙය පත්වනු නොඅනුමානය.



# ජනවාරි 8

## ආණ්ඩුව හා රට



"ධනවතුන් හා හොරුන් එකම කාසියක දෙපැත්තට සමානය. ධනපති ක්‍රමය විසින් පෝෂණය කරන ලද ප්‍රධාන පරපෝෂිත වර්ග දෙක මොවුන්ය. සමාජවාදයේ ප්‍රධාන සතුරන් මොවුන්ය. මේ සතුරන් මුළු මහත් ජනතාවගේම විශේෂ පරීක්ෂාකාරිත්වය යටතේ තැබිය යුතුය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**07 වෙළුම,**
**82 පිටුව**

මෙම ජනවාරි 08වැනිදාට මහින්ද රාජපක්ෂගේ දූෂිත පවුල් පාලනය පරදවා වසරකි. නැතිනම් තවත් අවුරුදු 06ක් බලයේ සිටීමට උත්සාහ කළ මහින්ද රාජපක්ෂ සිංහාසනයෙන් නෙරපා දමනු ලැබීමට වසරක් පිරී තිබේ. මෙරට ලක්ෂ 62ක් වූ ඡන්ද දායකයින්, (ඉන් සාතිශය බහුතරය) තමන්ට පෞද්ගලිකව කිසිවක් බලාපොරොත්තු නොවී, රාජපක්ෂගේ බලපෑම්වලට අල්ලසට යට නොවී ඔහු බලයෙන් පහකළේ අවම වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අපේක්ෂා කරමිනි. මහින්ද රාජපක්ෂ පාලනය පරදවා වසරක් ගෙවෙන විට අප දන්නා සත්‍යය කුමක්ද? ඒ, වත්මන් හවුල් පාලනය ජනවාරි 08දා ජනතාවගේ අභිලාෂයට පයින්ගසා ජනවරමට පිටුපා අයාලේ ගමන්කරමින් සිටින බවය.

රාජපක්ෂ පාලනය තුළ, රාජපක්ෂ පවුලේ අය ඇතුළු එවකට පැවති ආණ්ඩුවේ ප්‍රධානින්ට මහා පරිමාණ වංචා, දූෂණ පිළිබඳ, බලය අයුතු ලෙස යෙදවීම පිළිබඳ, මනුෂ්‍ය ඝාතන පිළිබඳ චෝදනා රැසක් තිබියෙදී, පැමිණිලි රැසක් තිබියෙදී, සාක්ෂි තිබියෙදී, පරීක්ෂණ කෙරෙන බව පවසමින් තිබියෙදී වසරක් ගතවන විටත් දඬුවමකට ලක්වූ කිසිවෙක් නැත. අධිචෝදනා ලැබ අධිකරණයට ගිය කෙනෙක්ද නැත. ඒ වෙනුවට රාජපක්ෂ පාලන සමයේ අපරාධකරුවෝ හා දූෂිතයෝ පිරිසක් වත්මන් හවුල් ආණ්ඩුවේ ඇමති, උප ඇමති, රාජ්‍ය ඇමති යන විවිධ තනතුරුවලින් පුද දෙනු ලැබ සිටිති. තවත් පිරිසක් ඊනියා ඒකාබද්ධ විපක්ෂයේ සිට මලබද්ධය හැදුණ විට මෙන් බෙරිහන් දෙමින් සිටිති. රාජපක්ෂ මහතා ජනතාව නොමග යවමින් නිදැල්ලේ සිටියි. සත්‍යය එයයි.

ඒ අතර ආණ්ඩුව තමන්ට ඡන්දය දුන් ජනතාවගේ කරමත බදුබර පටවමින්, ජනතාවගේ සහන කපමින්, ශිෂ්‍යයන්ගේ ඔළු පලමින්, අයිතින් ඉල්ලන ජනතාවට තර්ජනය කරමින් රටේ සම්පත් හා ඉඩම් ටික පවා අධිරාජ්‍යවාදීන්ට, ජාවාරම්කරුවන්ට පවරා දීමට පිඹුරුපත් සකස්කරමින් ජනතා විරෝධී මඟක ගමන් කරමින් සිටී. වත්මන් හවුල් ආණ්ඩුවේ මේ ක්‍රියාදාමය විසින් මෙරට ජනතාවට හොඳ පාඩමක් උගන්වා තිබේ. ඒ, ධනපති කණ්ඩායම් රටේ ජනතාවගේ ප්‍රශ්නත් ඒ මත ගොඩනැගුණු සටන් පාඨත් උපයෝගී කරගන්නේ තමන් වෙත බලය ලබා ගැනීම සඳහා මිස ඒවා සැබෑ ලෙසම විසඳීමට නොවේය යන්නය. ධනපති ආණ්ඩුවලින් ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, යුක්තිය, සාධාරණය බලාපොරොත්තු වීම ගණිකා මඩම් හිමියන්ගෙන් සදාචාරය බලාපොරොත්තු වීම වැනිය.

ආණ්ඩුව දැන් සිටින්නේ අර්බුද රැසක් හා ප්‍රතිවිරෝධතා රැසක් තුළය. එහෙත් එම ප්‍රතිවිරෝධතා හා අර්බුද මැදම ආණ්ඩුව ගමන් කරමින් සිටී. එහි ගමන්මග තේරුම් ගැනීමට එය මුහුණදී සිටින ප්‍රතිවිරෝධතා පද්ධතිය තේරුම් ගැනීම අවශ්‍යය.

ලංකාවේ දුබල ධනපති ක්‍රමය පවත්වාගෙන යාමේදී රටට ආදායම් මාර්ග ප්‍රමාණවත් නැති තත්වය තුළ ආණ්ඩුව බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණදී සිටී. මෙවර අයවැය පරතරය රු.බිලියන 740ක් තරම් විශාල වීමෙන් මෙය තේරුම් ගත හැක. ආණ්ඩුව මෙම පරතරය පියවා ගැනීමට යන්නේ, රටේ ඉඩම් හා සම්පත් ජාවාරම්කරුවන්ට පැවරීමෙන් හා ණය ගැනීමෙනි. මේ ක්‍රියාමාර්ග දෙකම පොදු ජනතාවට බලපාන බැවින් ජනතා කණ්ඩායම් හා බරපතළ ප්‍රතිවිරෝධයකට යාමට ආණ්ඩුවට සිදුවනු ඇත. අනෙක් අතට ආණ්ඩුව තම රාජ්‍ය ආදායම උපයා ගැනීමට යන්නේද ජනතාව මත බදුබර පැටවීමෙනි. එහෙත් අයවැය යෝජනාවලට එරෙහිව එල්ලවූ දැවැන්ත ජනතා විරෝධය නිසා සමහර බදු වර්ග (උදාඃ වාහන දුම් සහතිකයේ බද්ද) හකුළා ගැනීමට ආණ්ඩුවට සිදුවිය. මේ නිසා දැන් අපේක්ෂිත ආදායමද නොලැබෙන තත්වයක් තුළ අයවැය පරතරය තවත් වැඩිවී තිබේ. **මේ තත්වය තුළ නව වසරේ ආරම්භයේ සිටම විටින් විට ජනතාව මත විවිධ බදු හරහා බර පැටවීමටත් වරින්වර සහන කපමින් රාජ්‍ය වියදම් අඩුකර ගැනීමටත් ආණ්ඩුවට සිදුවේ. එහි ප්‍රතිඵලය වන්නේ ඉදිරි කාලය තුළ ඉන් පීඩාවට පත්වන ජනකණ්ඩායම්වල විරෝධයට මුහුණ දීමට ආණ්ඩුවට සිදුවීමය. මේ අනුව ආණ්ඩුව ජනතාව සමග බරපතළ ප්‍රතිවිරෝධයකට මඟ සකස්කොට තිබෙන අතර එය ආණ්ඩුවට හිතකර නොවේ.**

ආණ්ඩුව හා ජනතාව අතර ප්‍රධාන ප්‍රතිවිරෝධයක් නිර්මාණය වී ආණ්ඩුව ඊට මුහුණ දෙමින් සිටින අතරම ආණ්ඩුව තුළද ප්‍රතිවිරෝධයන් රැසක් තිබේ. ආණ්ඩුවේ ගමන අයාලේ යන බවක් පෙන්නුම් කිරීමට මෙන්ම ආණ්ඩුවේ පැවැත්මටද එම ප්‍රතිවිරෝධතා හේතුවී තිබේ. වත්මන් ආණ්ඩුවේ අයවැය ලේඛනයට පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටත එල්ලවූ විවේචන දෙස බැලූ කෙනෙක් ආණ්ඩුව අයවැය පරදිනු ඇතැයි සිතුවේ නම් එය අසාධාරණ නොවේ. එතරම් විරෝධයක් හා විවේචනයක් අයවැයට එරෙහිව තිබුණි. එහෙත් ආණ්ඩුව විසින් ඡන්ද විමසීමේදී අයවැයට පක්ෂව ඡන්ද 160ක් ලබා ගන්නා ලදී. ඒ, ආණ්ඩුව තුළ වන ප්‍රතිවිරෝධතා පද්ධතියේ ක්‍රියාකාරිත්වය හේතුවෙනි.

> "මේ තත්වය තුළ නව වසරේ ආරම්භයේ සිටම විටින් විට ජනතාව මත විවිධ බදු හරහා බර පැටවීමටත් වරින්වර සහන කපමින් රාජ්‍ය වියදම් අඩුකර ගැනීමටත් ආණ්ඩුවට සිදුවේ. එහි ප්‍රතිඵලය වන්නේ ඉදිරි කාලය තුළ ඉන් පීඩාවට පත්වන ජනකණ්ඩායම්වල විරෝධයට මුහුණ දීමට ආණ්ඩුවට සිදුවීමය. මේ අනුව ආණ්ඩුව ජනතාව සමග බරපතළ ප්‍රතිවිරෝධයකට මඟ සකස්කොට තිබෙන අතර එය ආණ්ඩුවට හිතකර නොවේ."

ආණ්ඩුව තුළ වන ප්‍රධාන ප්‍රතිවිරෝධය පවතින්නේ, එය සංයුක්තවී ඇති ප්‍රධාන පාර්ශව දෙක වන එ.ජා.ප.ය හා ශ්‍රී.ල.නි.ප.ය අතරය. ආණ්ඩුවේ පාලන කාලය තුළ තමන් ශක්තිමත් වීමට එ.ජා.ප. ය කටයුතු කරද්දී තම කණ්ඩායම සවිමත් කර ගැනීමට ශ්‍රී.ල.නි.ප ය කටයුතු කරයි. ඔවුහු එකිනෙකට විවේචන කරගනිති. විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරති. එහෙත් ඒ අතරම එකට කටයුතු කරති. එයට හේතුව කුමක්ද? ආණ්ඩුව තුළ එ.ජා.ප. හා ශ්‍රී.ල.නි.ප. අතර ප්‍රතිවිරෝධතා පවතිනවා මෙන්ම ශ්‍රී.ල.නි.ප.ය තුළද ප්‍රතිවිරෝධයක් පවතී. ඒ, මෛත්‍රී පිල හා මහින්ද පිල අතරය. ශ්‍රී.ල.නි.ප. ය ආණ්ඩුවට සම්බන්ධවී සිටීමට මෙම ප්‍රතිවිරෝධය ප්‍රධාන සාධකය බවට පත්ව තිබේ. ඊට අමතරව ශ්‍රී.ල.නි.ප. නායකයන්ට ඇමති ධුර හා වරප්‍රසාද අවශ්‍යවීමත් ඔවුන්ගේ බලයට ඇති කෑදර කමත් හේතු වන නමුත් ප්‍රධාන හේතුව වන්නේ ශ්‍රී.ල.නි.ප. තුළ වන ප්‍රතිවිරෝධයයි.

ශ්‍රී.ල.නි.ප. තුළ වන මෙම ප්‍රතිවිරෝධයේදී මෛත්‍රී කණ්ඩායමේ ශක්තිය බවට පත්ව ඇත්තේ, ඔහු සතු නායක බලය හා රාජ්‍ය බලයයි. මෛත්‍රී ජනාධිපති වීමත් ඔහු පක්ෂයේ නායකයා වීමත් විසින් ඔහුට බලයක් ලැබී ඇති අතර ශ්‍රී.ල.නි.ප. බොහෝදෙනා ඔහු සමග සිටින්නේ මෙම බලය නිසාය. මහින්දට නායක බලය හෝ රාජ්‍ය බලය දැන් නැත. එහෙත් බිමේ පාක්ෂිකයන්ගේ වැඩි කැමැත්ත ඔහුට තිබේ. ඔහු බිමේ පාක්ෂිකයාට ගැලපෙන ලෙස කටයුතු කරන්නේ ඒ හරහා නායක බලය යළි ලබා ගැනීම සඳහාය. ඒ අතර මෛත්‍රී නායක බලය හා රාජ්‍ය බලය උපයෝගීකර ගනිමින් බිමේ පාක්ෂිකයා දිනා ගැනීමටත්, මහින්දවාදීන් වරදාන මගින් තමා වෙත නම්මවා ගැනීමටත් කටයුතු කරයි. විටින් විට ඇමති ධුර, නියෝජ්‍ය ඇමති ධුර දීම තුළින් ප්‍රකාශ වන්නේ එයයි. මේ තත්වය මත පක්ෂය තුළ තම බලය තබා ගැනීමට නම් මෛත්‍රී ආණ්ඩු බලය සමග සිටිය යුතුව තිබේ. එබැවින් ප්‍රතිවිරෝධතා කොතෙක් තිබුණද තම බලය වෙනුවෙන් හවුල් ආණ්ඩුව තුළ සිටීමට මෛත්‍රීටත් ඔහුගේ පාර්ශවයටත් සිදුව තිබේ. අයවැය සම්මත වීම මෙන්ම විවිධ කලබැගෑනි මැද වුවද ආණ්ඩුව නොවැටී පෙරට යාමට මෙය හේතුවී තිබේ.

මෙහිදී මෙය දන්නා එ.ජා.ප.යද ශ්‍රී.ල.නි.ප.යේ මෙම පාර්ශව දෙකෙන් එකක් දුර්වලවී අනෙක ශක්තිමත්වීමට දායක නොවී දෙකම පවතින්නට ඉඩහරින බව පෙනේ. විශේෂයෙන් මෛත්‍රී පිල ශක්තිමත් වනු දැකීමට එ.ජා.ප.ය කැමති නැත. රාජපක්ෂවරුන්ට එරෙහිව අවශ්‍ය බරින් ක්‍රියාමාර්ග නොගැනීමේ එක් හේතුවක් වන්නේ එයයි. සැබෑ ලෙසම අගමැතිවරයා හා රාජපක්ෂවරු අතර එකඟතාවක් තිබෙන බව පැහැදිලිවම පෙනේ. තමන්ගේ නඩු පිළිබඳ ක්‍රියා මාර්ග ප්‍රමාදකර ගැනීම සඳහා රාජපක්ෂ මහතා අගමැතිවරයාට අවශ්‍ය ලෙස කටයුතු කරන අතර අගමැතිවරයා රාජපක්ෂවරුන්ට විරුද්ධව කටයුතු නොකර සිටීම මගින් ඔවුන්ගේ පිල පවතින්නට ඉඩදී තිබේ. අයවැය විවාදයේදී හා ඡන්ද විමසීමේදී මහින්ද රාජපක්ෂ මහතා අවස්ථා දෙකේම ඡන්දය දීමට නොපැමිණීම මගින්ද එ.ජා.ප. නායකයා විවේචනය කරනවා වෙනුවට ඔහු ඇගයීම විසින්ද පෙන්වන්නේ එයයි.

ආණ්ඩුව තුළ වන මෙම ප්‍රතිවිරෝධතා ආණ්ඩුවේ ගමන්මඟටද බලපා තිබේ. ඉදිරියේ පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයේදී මැතිවරණ ක්‍රමය ගැන කඹ ඇදිල්ලක් ඇතිව තිබෙන්නේද මේ නිසාය. **පළාත් පාලන ඡන්දය පැවති සමානුපාතික ක්‍රමයට නොතබා නව කේවල මිශ්‍ර ක්‍රමයට තැබීම ජනාධිපතිවරයාගේ වුවමනාව වී තිබේ. ඒ සමානුපාතික ක්‍රමය පක්ෂය තුළ අපේක්ෂකයන් තේරී පත්වීමේදී මහින්ද පිලට වාසියයි ඔහු සිතන නිසාය. ඒ නිසා ජනාධිපතිවරයා හා ඔහු සමග සිටින පිරිස නව ක්‍රමයට පුංචි ඡන්දය පැවැත්වීමට වෙර දරන අතරම එ.ජා.ප.ය තවමත් කැමති පැරණි ක්‍රමයටය. මෙම අවශ්‍යතා දෙක විසින් ඡන්දය පැවැත්වීමේ ක්‍රියාවලිය අවිනිශ්චිත බවට පත්කර තිබේ.** දැනට තිබෙන ගැටලු දෙස බැලුවිටදී මේ ඡන්දය නව ක්‍රමයට පැවැත්වීම ප්‍රායෝගික නැත. අනෙක් අතට ඒ නිසා යළි කල්දැමීමද සුදුසු නැත. කළ යුත්තේ මෙවරත් පැරණි ක්‍රමයට ඡන්දය පැවැත්වීමය. එහෙත් ජනාධිපතිවරය ***15වැනි පිටුවට***

# පලස්තීනයේ නිදහස වෙනුවෙන්

අද දවසේ සිරියාව සහ ISIS සංවිධානය අතර පවතින ගැටුම සහ එයට සම්බන්ධ අනෙක් රටවල් පිළිබඳව තොරතුරු නිරන්තරයෙන් අප වෙත ගලා එමින් තිබේ. මේ පිටුපස පවතින්නේ, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ බෙදුම්වාදී වුවමනාව මිස වෙන කිසිවක් නොවේ. සිරියාව කුඩා රාජ්‍යන්ට කඩා තමන්ට හිතැති ආකාරයට පාලනය කිරීම එම වුවමනාවයි. එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් වර්ෂ 1947 දී පලස්තීනය නම් ස්වාධීන රාජ්‍ය තුළ ඊශ්‍රායලයක් නම් කරනු ලබන්නේ මෙවැනි ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසයි. එහෙත් ඇමරිකානු වුවමනා වෙනුවෙන් ඊශ්‍රායලය විසින් දියත් කල යුද ක්‍රියා මාර්ග හරහා අද වන විට එදා 1947 දී වෙන්වූ පලස්තීනය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වෙන්කළ භූමි භාගයෙන් 11% දක්වා නව පලස්තීනය කුඩා තිබේ.

පලස්තීනය සහ එහි නිදහස වෙනුවෙන් පෙනී සිටින රටවල් හා සංවිධාන මගින් ගෙන ගිය අරගලයන් නිසාවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය කරනු ලබන රටවල් 193න් රටවල් 136ක්ම පලස්තීනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගෙන තිබේ. තත්වය මෙසේ වුවද පලස්තීනයට එරෙහි අධිරාජ්‍යවාදී බලපෑම්හි අඩුවක් සිදුවී නොමැත. ජ.වි.පෙ. තරුණ අංශය වන සමාජවාදී තරුණ සංගමයද ස්වාධීන පලස්තීනයක් වෙනුවෙන් වසර ගණනාවක් සිට තම සහෝදරාත්මක දායකත්වය දක්වමින් සිටී.

නොවැම්බර් 29 වෙනිදාට යෙදුණු පලස්තීන සහයෝගිතා දිනයට සමගාමීව පසුගිය දෙසැම්බර් 04වෙනිදා "පලස්තීනයට ජීවත් වීමට ඉඩදෙනු!" යන මැයෙන් විරෝධතා බැනරයක් අත්සන් කිරීම මරදාන සහිරා මුස්ලිම් පල්ලිය ඉදිරිපිටදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක පා.ම. බිමල් රත්නායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ස්වාධීන පලස්තීනයක් වෙනුවෙන් සිදු කරන ජනතාවගේ අරගලය පිළිබඳව දැක්වෙන වීදි නාට්‍යයක්ද මෙහිදී තරුණ සංගමය විසින් ඉදිරිපත් කරන ලදී. මීට සමගාමීව දිවයිනේ ප්‍රධාන නගර කිහිපයකම මේ ආකාරයේ වැඩසටහන් තරුණ සංගමය විසින් සංවිධානය කර තිබුණි.





# ගොවියාට පිටුපෑ හවුල

ගොවියා ගොවිතැනින් ඉවත් කිරීමට උත්සාහ කිරීම අද ඊයෙක සිදුවූවක් නොවේ. මෙරට යටත් කර ගත් බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රධානතම අභිප්‍රාය වූයේද මෙරට ජනයා ගොවිතැනින් ඉවත් කර රටේ කෘෂිකර්මාන්තය බිඳ වැට්ටවීමයි. ඒ තුළින් තම හිතැඟි අනුව මෙරට පාලනය කළ හැකි බවද ඔවුන් අවබෝධ කර ගෙන තිබුණි. 1948 වසරේදී අප ලැබූ ඊනියා නිදහසින් පසුව රට පාලනය කළ එ.ජා.පායත් එහි කාබන් කොපියක් වූ ශ්‍රීල.නි.ප. ප්‍රමුඛ සභාග ආණ්ඩුත් මෙරට පාලනය කළේද තම යටත්විජිත හාම්පුතුන්ගේ ඒ ප්‍රතිපත්ති මත පිහිටාය.

පසුගිය නොවැම්බර් මාසයේදී එළිදැක්වුණු හවුල් ආණ්ඩුවේ අයවැය තුළින්ද ගොවියා ගොවිතැනින් ඉවත් කරන තැනට වැඩ කටයුතු සිදුව තිබේ. ඒ මෙතෙක් කාලයක් ගොවීන් විසින් සිදුකරන ලද අරගලයන්ගේ ප්‍රතිඵලයක් ලෙස දිනාගත් පොහොර සහනාධාරය කප්පාදු කර ඒ වෙනුවට වසරකට උපරිම වශයෙන් රු.25,000ක සොච්චම් මුදලක් ගොවීන් අතට ලබාදීමට කටයුතු කිරීමෙනි.

රටේ සිදුවන බොහෝ සිද්ධිවලට හඬ නගන්නට කොතෙක් සංවිධාන තිබුණත් ගොවීන්ට සිදුවුණු මේ අසාධාරණයට එරෙහිව හඬ නැගීමට සිටියේ ජ.වි.පෙ.ට අනුබද්ධ ගොවි සංවිධානය වන සමස්ත ලංකා ගොවිජන සම්මේලනය පමණි. මේ පෙහොර සහනාධාරය කප්පාදු කිරීම ඇතුළු ඉල්ලීම් කිහිපයක් මුල් කරගනිමින් ගොවිජන සම්මේලනය විරෝධතා පෙළපාලි සහ සත්‍යග්‍රහ ආරම්භකරන ලදී. දඹුල්ල, ඇඹිලිපිටිය, අනුරාධපුර, අම්බලන්තොට, අම්පාර, මහියංගනය, පොළොන්නරුව, ගල්ගමුව සහ කන්තලේ යන ප්‍රදේශවල මෙම විරෝධතා ව්‍යාපාර පැවති අතර පසුගිය දෙසැම්බර 17 වෙනිදා කොළඹ ලිප්ටන් වටරවුමේ සිට අරලියගහ මන්දිරය දක්වාද විරෝධතා පා ගමනක් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විසින් සංවිධානය කර තිබුණි. ගොවීන් විශාල පිරිසකින් සමන්විත වූ මේ උද්ඝෝෂණ සදහා එම සම්මේලනයේ ජාතික සංවිධායක පළාත් සභා මන්ත්‍රී නාමල් කරුණාරත්න, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයාද ඇතුළුව ප්‍රාදේශීය ගොවි නායකයෝ රැසක්ද සහභාගි වී සිටියහ.

# ජ.වි.පෙ. ඇමරිකා යයි

ඇමරිකා එක්සත් ජනපදය කිවූ සැණින් මෙරට බොහෝ අයට විශේෂයෙන් වාමාංශිකයන්ට දැනෙනුයේ අප්‍රසන්න හැඟීමකි. එය එසේ වීමට එක්සත් ජනපදයේ රාජ්‍ය ප්‍රතිපත්ති බලපාන්නට ඇත. ඒ කෙසේ වුවත් ඇමරිකානු පොදු ජනතාව හෝ මෙරටින් ගොස් එහි පදිංචිව සිටින ලාංකිකයෝ එම චෝදනාවන්ට වග කිව යුතු නොවෙති. ධනවාදය ජාත්‍යන්තර ස්වරූපයක් ගන්නා නිසාම කිසියම් හෝ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් විවර වන ඕනෑම අවස්ථාවක පංතිය සංවිධානය කිරීමේ කර්තව්‍යය සඳහා විප්ලවවාදී ව්‍යාපාරය මැදිහත් විය යුතුය.

ජ.වි.පෙ. එම ඉඩකඩ භාවිතා කරමින් පසුගිය දෙසැම්බර් 04 වන දා සිට 14 වනදා දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ තම සංවිධාන කටයුතු සඳහා මැදිහත් විය. එයට අමතරව වොෂින්ටන් සහ නිව්යෝර්ක් යන නගරයන්හි "වත්මන් දේශපාලන තත්වය හා රටේ අනාගතය" යන මැයෙන් සම්මන්ත්‍රණ දෙකක් පැවත්වීමටද ජ.වි.පෙ.ට හැකිවිය. රාජපක්ෂ පාලනයට එරෙහිව යහපාලනයක් ගොඩනැගීම සඳහා මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ධුරයට පත් කිරීමට සහය දුන් බොහෝ පිරිස් වත්මන් හවුල් ආණ්ඩුව ගැන කලකිරී ජ.වි.පෙ. වටා එක් රැස් වනු මෙහිදී දක්නට ලැබුණි. මෙම සංවිධාන කටයුතු සඳහා එක්සත් ජනපදය බලා ගොස් තිබුණේ ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික, උතුරු මැද පළාත් සභා මන්ත්‍රී වසන්ත සමරසිංහ සහෝදරයාය.







# අයවැයෙන් ඔබ්බට

අයවැය යෝජනා පිළිබද කථිකාවේදී 2016 වසරේ ඉදිරිපත් වූ අයවැය යෝජනාවලිය යම් විශේෂත්වයක් ගනී. ඒ වෙන කිසිවක් නිසා නොව මෙතෙක් කලක් එ.ජා.ප., ශ්‍රීල.නි.ප. ආණ්ඩු තනි තනිව ඉදිරිපත් කළ අයවැය මෙවර දෙපාර්ශවයම එක්වූ හවුල් ආණ්ඩුවකින් ඉදිරිපත් විමය.

හවුල් ආණ්ඩුව විසින් 2016 අයවැය යෝජනාවලිය ඉදිරිපත් වීමත් සමඟම එයට එරෙහි නොවූ ක්ෂේත්‍රයක් සොයා ගැනීමට පවා නොහැකි විය. ගොවීන්, ශිෂ්‍යයින්, කම්කරුවන්, වෘත්තීයවේදීන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඒ අතර විය. දුබල ධනපති පාලනයට තවදුරටත් මෙරට ජනතාවගේ මූලික අවශ්‍යතා හෝ ඉටු කළ නොහැකි තත්වයකට පත්ව ඇති බව මෙම අයවැය යෝජනා තුළින් ගම්‍යවන ලදී.

මේ අයවැයට එරෙහිව නැඟ එන සමාජ විරෝධය පවතින ධනවාදී ආර්ථික ක්‍රමය වෙනස් කර වඩා යහපත් අර්ථක්‍රමයක් දක්වා ගමන් කරවීමට ජ.වි.පෙ. නායකත්වය ලබාදීමට කටයුතු කරන බව "අයවැය කාගෙද? කාටද?" යන මැයෙන් පසුගිය දෙසැම්බර් 15 වෙනිදා කොළඹ සේවා මුක්ත හට කණ්ඩායම් ශාලාවේ පැවති ප්‍රසිද්ධ දේශනයකදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා අවධාරණය කළේය.

ජ.වි.පෙ. විසින් සංවිධානය කර තිබූ මෙම සම්මන්ත්‍රණය සඳහා වෘත්තීය සමිති නායකයෝ ඇතුළුව විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# අයවැයට එරෙහි සටන
## නව සමාජ ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කරනතුරු
# ඉදිරියට ගෙන යා යුතුයි!

*පසුගිය 15වැනි දින කොළඹ කොටුව සේවා මුක්ත හටසංගම් මූලස්ථානයේදී* ***ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා*** *විසින් 'අයවැය: කාගෙද? කාටද?' තේමාව යටතේ පවත්වන ලද ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයේ ලිඛිත සටහන කාලීන වැදගත්කම සලකා සංක්ෂිප්තව මෙසේ උපුටා දක්වමු.*

මේ අයවැය ලේඛනය කාටද කියලා දැන් හැමෝම දන්නවා. ගොවි ජනතාව දන්නවා, එය ඔවුන්ට නොවන බව. ඒ නිසා අද අනුරාධපුර, දඹුල්ල ඇතුළු විවිධ දිස්ත්‍රික්කවල ගොවි ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදුව පිළිබඳව හඬනගමින් ඉන්නවා. රාජ්‍ය අංශයේ සේවක සේවිකාවන් දන්නවා මේ අයවැය තමන්ට නොවන බව. ඒ නිසා තමයි උද්ඝෝෂණවලට වැඩවර්ජනවලට තීන්දු තීරණ ගනිමින් ඉන්නේ. පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් දන්නවා තමන්ට නොවන බව. බැංකු සේවකයනුත් දන්නවා, මේ අයවැය තමන්ට නොවන බව. සාමාන්‍ය ජනතාවත් මේ පිළිබඳව අදහස් දක්වන ආකාරය බැලුවාම තේරෙනවා, එය ඔවුන්ගේ නොවන බව. විශ්වවිද්‍යාල සිසුන්, තරුණයින් මේ අයවැයට එරෙහිව අරගල දියත් කර තිබෙනවා. ඒ නිසා හරි පැහැදිලියි, මේ අයවැය පොදු ජනතාව වෙනුවෙන් නොව ඉතා කුඩා කණ්ඩායමක් වෙනුවෙන් සකස් කළ එකක් බව.

පසුගිය නොවැම්බර් 05 රනිල් වික්‍රමසිංහ මධ්‍යකාලීන ආර්ථික උපායමාර්ගය කියලා ඔවුන්ගේ ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එහිදී රනිල් වික්‍රමසිංහ මහත්තයා ජේ.ආර්. ජයවර්ධනගේ කොල්ලකාරී විවෘත ආර්ථිකය පළමු පරම්පරාවේ ආර්ථික සැලැස්ම ලෙස හැඳින්වුවා. 1990 සඳහා ඉදිරිපත් කළ ප්‍රේමදාස මහත්තයාගේ රාජ්‍ය ආයතන විකුණා දැමීමේ අයවැය දෙවන පරම්පරාවේ ආරථික සැලැස්ම ලෙස හැඳින්වුවා. රනිල් මහත්තයාගේ ආර්ථික ප්‍රතිපත්තිය තුන්වෙනි පරම්පරාවේ ආර්ථික දැක්මයි. එනිසා ජේ.ආර්., ප්‍රේමදාස, රනිල් ඉදිරිපත් කළ ආර්ථික සැලැස්ම එකට බැඳී තිබෙනවා. ඒ විතරක් නෙවෙයි වික්‍රමසිංහ මහත්තයා මේ වෙනකොට රටට වෙලා තිබෙන විනාශය ගැනත් කියනවා. රටේ ජනගහනයෙන් 43%ක දෛනික ආදායම ඩොලර් දෙකයි. ඒ කියන්නේ වික්‍රමසිංහ මහත්තයලගෙ පළමු සහ දෙවන පරම්පරාවේ ආර්ථිකයේ ශේෂ පත්‍රය තමයි ඒ. චන්ද්‍රිකා හෝ මහින්ද ඒ ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කළේ නැහැ. රාජපක්ෂ මහත්තයා අධ්‍යාපනයේ, සෞඛ්‍යයේ මුදල් කප්පාදු කළා. ඒ නිසා එකම ආර්ථික සැලැස්මක් ක්‍රියාත්මක වෙන්නේ. නමුත් ඇත්ත තත්වය තවත් බරපතළයි. අපේ රටේ ජනගහනයෙන් ඉහළම 10% ජාතික ධනයෙන් 38%ක් භුක්ති විඳිනවා. ඒ අපි යන බස් එකේ, රෝහලේදී, මාර්කට් එකේදී හමු නොවන ඉහළ පිරිසයි. එහෙම වෙද්දී පහළම 10%ට හිමිවන්නේ 1.1%යි. අතිශය දරුණු ආදායම් බෙදී යාමේ විෂමතාවයක් තිබෙනවා.

ආනයන අපනය වෙළෙඳාම. 2000දී භාණ්ඩ අපනයනයෙන් දළ ජාතික නිෂ්පාදිතයෙන් 30%ක ආදායමක් ලැබුණා. දැන් 15%යි. අපනයන වෙළෙඳාම හැකිළිලා. රනිල්ගේ මාමා 77 ආර්ථිකය පටන් ගන්නකොට ලෝක වෙළෙඳපොළේ අපේ පංගුව 0.5%යි. අද එය 0.045%යි. 2014දී ආනයනය සඳහා ඩොලර් බිලියන 20ක් වැයවෙලා තිබෙනවා. අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 11යි. විශාල වෙළෙඳ පරතරයක් නිර්මාණය කරලා තිබෙනවා. 1980 ආණ්ඩුවට දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 23.5%ක ආදායමක් තිබුණා. අද රජයේ ආදායම 12.3%යි. ආදායම වැටිලා. කොහොමද අධ්‍යාපනයට, සෞඛ්‍යට, ගොවියට සහන දෙන්නේ. ඉතිං මේ ආර්ථික සැලැස්ම සාර්ථකද? ඒ විතරක් නෙවෙයි නිෂ්පාදනය කඩා වැට්ටුවා. 1977දී අපේ රටේ කිරි අවශ්‍යතාවයෙන් 50%ක් නිෂ්පදානය කළා. කිරි කර්මාන්තයට යෝග්‍ය පරිසරයක් අපිට තිබුණා. අද 17%ක් පමණයි නිෂ්පාදනය කරන්නේ. මිරිස් අවශ්‍යතාවයෙන් 72%ක් ආනයනය කරනවා. ළූණුවලින් 56%ක් ආනයනය කරනවා. කඩදාසි 100%ක්. වාලච්චේනේ, ඇඹිලිපිටියේ කඩදාසි කම්හල් තිබුණා. ඒවා නවීකරණය කළේ නැහැ පරණ යකඩවලට වික්කා. අපිට තිබුණ පූගොඩ, තුල්හිරිය රෙදි ජනපද විනාශ කළා. සීනිවලින් 92%ක් රටින් ගේනවා. අපිට තිබුණ සීනි කර්මාන්ත ශාලා පරණ යකඩවලට වික්කා. රනිල් කියන පළමු සහ දෙවන ආර්ථික පරම්පරාව අපේ රටේ ආර්ථික දේහය විනාශ කළා.

ඒ විතරක් නෙවෙයි අපේ රටේ සමාජ අර්බුද නිර්මාණය කළා. සියදිවි හානිකරගැනීම අතින් අපි ඉන්නේ ලෝකයේ 04වැනි ස්ථානයේ. ඒ විතරක් නෙවෙයි දරුවන් ගඟට දානවා. ළිඳට දානවා. නැත්නම් දෙමාපියන් එක්කම ගඟට පනිනවා. මොකක්ද මේ ආර්ථිකය අපිට ඉතිරි කරලා තිබෙන්නේ. සමාජයක් විදියට කඩාවැට්ටුවා. දවසකට කොතනක හෝ ස්ත්‍රී දූෂණ 08ක් වෙනවා. වාර්තා වන ඒවා විතරක්. අපරාධවල නරුමභාවය වැඩි වුණා. අවුරුදු පහේ ළමයි දූෂණය කරනවා. ගුරුවරුන් දරුවන් දූෂණය කරනවා. ඒ නිසා ආර්ථිකය, සමාජය කඩාවට්ටපු රටක් අපිට ඉතිරි කළා. රටේ ස්වෛරීභාවය කඩාවට්ටලා. දැන් රනිල් වික්‍රමසිංහලාගේ මෙ ආර්ථික ප්‍රතිපත්ති තුළ කඩා වැටුණු ආර්ථිකයට සමාජ අර්බුදයට උත්තර තිබෙනවද? ඔවුන් හැමදාම කියන්නේ සිංගප්පූරුව ගැන. 1950 ගණන්වල ඉඳලා සිංගප්පූරුවේ ලී ක්වාන් යූ ගැන කියනවා. රනිල් වික්‍රමසිංහලා තායිලන්තය උදාහරණයට ගන්නවා. ඒක ලෝකයේ බුදුදහම තිබුණ රටක්. කාන්තාවන් අද ලෝකේ පුරා ගණිකා වෘත්තියේ යෙදෙනවා. තායිලන්ත ජනතාවගේ ජීවිතය අන්තිම පහළ අඩියට වැටිලා. රනිල්ලගේ තායිලන්ත උදාහරණය හොඳයිද? කොරියාව ගැන කියනවා. කොරියාවේ 15%ක ජනතාවක් දරිද්‍ර රේඛාවෙන් පහළ. මැලේසියාවේ ජනගහනයෙන් පහළම 10%ට ලැබෙන්නේ රටේ ජාතික ධනයෙන් 1.7%යි. ඒවා තමයි උදාහරණ. රනිල් මහත්තයලා හදන්නේ එහෙම ආර්ථිකයක්ද?

ඇත්තට රටේ නිෂ්පාදනය වැඩිකරන්න, රටේ ජනතාවට රැකියාවක් ලබාදෙන්න මේ ආර්ථිකයට පුළුවන්ද? ශ්‍රම බලකායට අලුතෙන් ලක්ෂ 03ක් ඇතුල් වෙනවා. ශ්‍රම බලකායෙන් අවුරුද්දකට විශ්‍රාම යන්නේ එක්ලක්ෂ විසිපන්දාහයි. එනිසා වර්ෂයක් පාසා එක්ලක්ෂ හැත්තෑපන්දහසකට රැකියාවක් අහිමි වෙලා තිබෙනවා. පිටරට රැකියාවක් සඳහා ලක්ෂ තුනක් පමණ රට අත්හැර යනවා. ආර්ථික වශයෙන් බංකලොත් වූ රාජ්‍යයක් අපිට ඉතිරිවෙලා. ඒනිසා අපිට පෙන්නුම් කරමින් තිබෙන්නේ අපේ රටට අලුත් ආර්ථික උපාය මාර්ගයක අවශ්‍යතාවයයි.

මේ අයවැයේ ප්‍රධාන කරුණු තුනක් ගැන සඳහන් වෙනවා. එකක් වෙළෙඳපොළ මුළුමනින් විවෘත කිරීම. දෙවැන්න ජනතාවගේ සහන කප්පාදු කිරීම. තුන්වැන්න ජාවාරම්කාරයන් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා. රනිල් මහත්තයලා හිතනවා ඔවුන්ගේ කාර්යය යටිතල පහසුකම් සැපයීම සහ නීති සම්පාදනය පමණයි කියලා. මෙය තමයි නව ලිබරල්වාදී දැක්ම. මෙය තමයි 2003 වසරේ 'රිගේනින් ශ්‍රී ලංකා' වැඩපිළිවෙළ. ඒ සඳහා බාධාවන් තිබෙනවා. විනිමය පාලන පනත. එය සංශෝධනය කරන්න ආණ්ඩුව යෝජනා කරනවා. විදේශිකයින් ඕන විදියට ඩොලර් ගෙනියන්න ගෙනඑන්න අවස්ථාව හදලා දෙනවා. විදේශිකයින්ට කොටස් වෙළඳපොළේ ආයෝජනය කරන්න පුළුවන් නමුත් ආදායම් බදු නැහැ. මෙය තමයි භයානක කරුණ. ඕනෑවට වැඩියෙන් විදේශයට අපේ ආර්ථිකය විවෘත කරනවා. කවුද ආවේ. කැසිනෝ ව්‍යාපාරිකයෙක් ආවා. එසේ නොමැතිව ව්‍යාපාරිකයෙක් ඇවිත් කර්මාන්ත ශාලාවක් හදලා ව්‍යාපාරයක් පටන් ගන්නේ නැහැ. වානේ සංස්ථාව ගන්න ආවා. හොඳ සිමෙන්ති නිෂ්පාදනයක් තිබුණ සිමෙන්ති සංස්ථාව ගන්න සුද්දො ආවා. අපේ රටේ ගෑස් සමාගම ෂෙල් ව්‍යාපාරිකයා ගත්තා. මේ කිසිවෙක් අලුත් ව්‍යාපාරයක් පටන් ගත්තේ නැහැ.

ඒ නිසා මොන නිදහස දුන්නත් නිෂ්පාදන පටන් ගන්න ආයෝජකයෝ එන්නේ නැහැ. ආණ්ඩුවට පුළුවන් ඕනැම ව්‍යාපාරයක් ක්‍රම උපායික සංවර්ධන පනතට දාන්න. ඒ අනුව අපේ තෙල් නිධියකින් කොටසක් ඉන්දියාවේ කායින් සමාගමට දුන්නා. බැරල් 100ක් ගොඩ ගත්තොත් අපිට හිමි වන්නේ බැරල් 10ක් පමණයි. කායින් සමාගමේ ආදායමෙන් 28%ක බද්දකුත් අපට හිමි වුණා. නමුත් බැසිල් රාජපක්ෂගේ ක්‍රමෝපායික සංවර්ධන පනතින් මේ කායින් සමාගමේ බද්ද ඉවත් කළා. ඒ වගේ භයානක පනතක් තමයි ක්‍රමෝපායික සංවර්ධන පනත. ජේම්ස් පැකර් කැසිනෝ ව්‍යාපාරිකයා ගෙන්වූයේ මේ පනතට අනුවයි. ඔහුටත් අවුරුදු 18ක පූර්ණ බදු නිදහසක් ලබා දුන්නා. දැන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ පනත අහෝසි කරලා අලුත් එකක් ගේන්න යනවා. ඒ කියන්නේ ක්‍රමෝපායික සංවර්ධන පනතින් අයෝජකයන්ට ලබාදෙන නිදහසත් රනිල් වික්‍රමසිංහලාට මදි වෙලා.

ඒ විතරක් නෙවෙයි, බදු නිදහස පමණක් නොව ආණ්ඩුව කම්කරු නීතිත් වෙනස් කරන්න යනවා. අපේ ශ්‍රමිකයන් නිදහසේ මිලදී ගන්න අවස්ථාවක් හදනවා. ජේ.ආර්. මහත්තයාගේ කාලේ මහ කොළඹ කම්කරු නීති කියලා රටේ කම්කරු නීති ලිහිල් කරලා කොග්ගල, බියගම, කටුනායක නිදහස් වෙළඳ කලාපවලට පහසුවෙන් සේවකයින් මිලදී ගන්න අවස්ථාව හදලා දුන්නා. ප්‍රේමදාස මහත්තයා ඒ නීති රටටම වලංගු කළා. රනිල් වික්‍රමසිංහලා කියන්නේ දැන් අපේ රටේ කම්කරු නීති යල් පැනලා කියලා. ඒ නිසා අද ජාත්‍යන්තර කම්කරු සංවිධානය මැදිහත් වෙලා මේ සංශෝධනය කරගෙන යනවා. වැඩ මුරය වෙනස් කරන්න යනවා. කාන්තාවන්ට රාත්‍රී වැඩමුරය ලබා දෙන්න යනවා. රවී කරුණානායක වැඩ සතිය දින 5ක් කරනවා යනවා කියලා කරන්න යන්නේ ඒකයි. දවසක වැඩ දිනය පැය 09ක් කරන්න යනවා. ලෝක කම්කරු පංතිය ලේ වගුරලා තමයි පැය 08 වැඩ දිනය ලබා ගත්තේ. ඒ විතරක් නෙවෙයි සේවකයින් ස්ථිර කිරීමේ කාලය වසරක් දක්වා දීර්ඝ කිරීමට යෝජනා කරනවා. කවුරු වෙනුවෙන්ද? මේ අයවැය ලේඛනයම සකස් කරලා තිබෙන්නේ ආයෝජකයන් වෙනුවෙන්.

ඊළඟ ඉඩම් පිළිබඳ විශාල ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. විදේශිකයන් සඳහා ඉඩම් බදු දීමේ ප්‍රමාණය අක්කර 5,000 දක්වා වැඩිකරන බව රවී කරුණානායක කියනවා. අපේ රටේ කාටවත් අක්කර 5,000ක් බද්දට ගන්න පුළුවන්කමක් නැහැ. කොම්පැනිකාරයන්ට ඉඩම් ටික දෙන්න යනවා. ඒ වගේම විදේශිකයන්ට ඉඩම් බදු දීමේදී පනවා තිබෙන 100%

15වැනි පිටුවට





"අපි ලෙනින්ගේ මේ කියමන පිළිගන්නවුන් වෙමුද? එසේය. පංති සටනේදී ධනේශ්වර පංතිය විසින් නිර්ධන පංතියට එරෙහිව උපයෝගි කරගන්නා ආයුධ හා ආයතන ධනේශ්වර පංතියට එරෙහිව එනම් වෙනස් අරමුණු සඳහා යොදා ගැනීමට අපි කැමති වෙමු. පාර්ලිමේන්තු මැතිවරණ හා පාර්ලිමේන්තු වේදිකාව පීඩිත බහුජන සමූහයාට දේශපාලන අවබෝධය, පංති අවබෝධය ලබාදීම සඳහා වේදිකාවක් කර ගැනීමට අපි කැමති වෙමු. නමුත් පංති අරගලය පාර්ලිමේන්තුවට සීමාකිරීමට අපි නොකැමති වෙමු. සූදානම් නොවෙමු."

**රෝහණ විජේවීර**
**'අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියෙනු ඇත' - 50 පිටුව**

# 'ජනතාව' බලයක් වීමට නම්...

කිසියම් මතයක් ජනතාවගේ බහුතරයක් තුළ තහවුරු වූ විට එය ද්‍රව්‍යමය බලයක් බවට පත් වන්නේ යයි මාක්ස්වාදයේ සඳහන් වේ. ජනතාව බලවේගයක් වීමට නම් කිසියම් මතයක්, සංකල්පයක් ඔවුන් බහුතරයක් අතර තහවුරු විය යුතුය. ජනතාව සමාජ විප්ලවයේදී විප්ලවීය බලවේග යක් වන්නේද පවතින සමාජය වෙනස් කළ යුතු බවත් නව සමාජයක් අවශ්‍ය බවත් වන මතය, අදහස, ජනතාවගේ බහුතරයක් තුළ තහවුරු වූ විටය. ධනවාදය තුළ ධනවාදී මතවාදවලින්, අදහස්වලින් නොමග යවා වල්මත්කර සිටින ජනතාවක්, ධනවාදය තුළ හුදකලා කොට, ආත්මාර්ථකාමී ලෙස සිතීමට බලකරනු ලැබූ හා පුරුදු කරනු  ලැබූ ජනතාවක්, නව සමාජයක් ගොඩ නගන සමාජ විප්ලවයක් සඳහා බලවේගයක් වන්නේ කෙසේද? මෙය ඉතා වැදගත් ප්‍රශ්නයකි. පිළිතුරු නිවැරදිව සොයා ගත යුතු ප්‍රශ්නයකි.

**අවබෝධකර ගැනීම**

මෙයට පෙර ලිපියකදීද සඳහන් කළ පරිදි ධනවාදය තුළ මිනිසුන්ගේ සිතීම හා හැසිරීම අවබෝධ කරගත යුතු වන අතරම එය මිනිසුන්ගේ පෞද්ගලික වරදක් හෝ දුර්ගුණයක් නොවන බවද තේරුම් ගත යුතුය. ධනවාදය තුළ මිනිසුන් පොදුවේ ආත්මාර්ථකාමීය; ගතානුගතිකය; සම්ප්‍රදායිකය; සැක සහිතය; වෙනස්වීම්වලට බියය. මේ පිළිබඳ අගනා විග්‍රහයක් මැක්සිම් ගෝර්කිගේ "අම්මා" නවකථාවේ තිබේ. රුසියාවේ කම්කරු ජනපදයට විප්ලවවාදී ව්‍යාපාරයේ අය පැමිණිවිට ඔවුන් දෙස පොදු කම්කරුවා බලන ආකාරය එහි මෙලෙස දැක්වේ. ***"පිටතින් පැමිණි අර මිනිහාගේ අසමාන ගතිගුණ දකින ජනපදවාසීහු, බොහෝ කල් යනතුරු ඒවා අමතක කිරීමෙහි අපොහොසත්වන අතර, හේතු රහිතව බියපත්ව, ඔහුගෙන් බේරීමට මාන බලති. තමන්ගේ අමිහිරි, දුක්බර එහෙත් නිසොල්මන් දිවි පෙවෙත නැතිකර දමනුවස් අර මිනිහා මොනවා හෝ කරතියි ඔව්හු බියපත් වෙති. ජීවිතය හැමදාම එක ලෙස තමන්ට පීඩාකරන්නේයයි සිතන මිනිස්සු, එය හොඳ අතට හැරෙතියි කිසි දිනක කල්පනා නොකරන අතර, ඇතිවන වෙනස්වීම්වල එකම විපාකය මර්දනය වැඩිවීම යයි සිතති."*** ඉහත විස්තරය අවධානයෙන් හොඳින් යළි යළිත් කියවා බලන්න! ලොව පුරා කොතැනත් ජනතාව පිළිබඳ පොදු තත්වය (කුඩා කුඩා වෙනස්කම් සහිතව වුවත්) මෙය බව වැටහෙනු ඇත. මෙලෙස හැසිරෙන ජනතාවක් විප්ලවයක බලවේගයන් බවට පත්කර ගැනීම විප්ලවාදීන් ඉදිරියේ ඇති අභියෝගය වේ. එය කරන්නේ කෙසේද? කළ නොහැකිද? සත්තකින්ම එය කළ හැකිය. ඒ සඳහා ජනතාව වටහාගෙන ඔවුනට සමීපවන ලෙස ඔවුන් සමග ඔවුන් අතර වැඩ කළ යුතුය. එවිට ක්‍රමානුකූලව ඔවුන් වෙනස් කළ හැකිවනු ඇත. මිනිසුන් අතර වැඩ කිරීමේ කලාවක් වන්නේ එවිටය.



**දැනුමද? අත්දැකීමද?**

ජනතාව බලවේගයක් බවට පත්කර ගැනීමට ඔවුනට දේශපාලන දැනුම ලබාදිය යුතුය. එහෙත් එය පහසු කරුණක් නොවන්නා සේම දැනුම ලබාදුන් පමණින් හැම දෙනාම වෙනස්වේයයි සිතිය යුතු නැත. ඔවුනට අත්දැකීම්ද අවශ්‍යයය. එහිදී පොදු සමාජ අත්දැකීම් මෙන්ම පෞද්ගලික අත්දැකීම්ද මෙහිදී වැදගත්වේ.

**ජනතාව පොදු අත්දැකීම් ලබාගන්නේ තමන් අත්විඳින පීඩාව නිතිපතා වැඩිවීමත් ජනතාවගේ ගැටලු වෙනුවෙන් කරන අරගල උද්ඝෝෂණ හා සටන් මගිනුත්ය. මෙය පංති සටනේ අත්දැකීම් ලෙස කෙටියෙන් තේරුම් ගත හැක. ජනතාව විප්ලවවාදී ව්‍යාපාරයක් හා බැඳීමට එය පමණක් ප්‍රමාණවත් වන්නේද නැත. ඔවුනට විප්ලවාදී ව්‍යාපාරයේ ක්‍රියාධරයන් හා බැඳුණු පෞද්ගලික අත්දැකීම්ද අවශ්‍යවේ.**

ධනවාදය තුළ ජීවත්වන මිනිසුන්ගෙන් සාතිශය බහුතරය සිතන්නේ ධනවාදයට අනුවය. ධනවාදය තුළ හැම දෙනාම කටයුතු කරන්නේ පෞද්ගලික ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙනි. කෙනෙකුට යමක් කරදුන් විට 'ස්තුතියි' යන වචනය වත් ඔවුන් බලාපොරොත්තු වෙති. මෙම තත්වය තුළ තමන්ට පෞද්ගලික ප්‍රතිලාභ නොලබා එවැන්නක් අපේක්ෂා නොකොට ජනතාව වෙනුවෙන් වැඩකරන විප්ලවාදියෙකුගේ ජීවිතය තේරුම් ගැනීමට එක්වරම පොදු ජනතාව සමත් වන්නේ නැත. එබැවින් විප්ලවවාදී ව්‍යාපාරය සැක කිරීමට ඔවුහු පෙලඹෙති. 'කැප කිරීම' තේරුම් ගැනීමට ජනතාව අසමත්ය. එක්කෝ ඔවුහු එවැන්නක් නැතැයි සිතන අතර නැතිනම් එය මෝඩකමක් ලෙස දකිති. මෙම තත්ත්වය වෙනස් කළ හැක්කේ විප්ලවාදී ක්‍රියාධරයන් පොදු ජනතාව සමග සමීපව සම්බන්ධවී තම ජීවන හැසිරීම් මගින් පොදු ජනතාවට අත්දැකීම් ලබාදීම මගිනි. එය ඉතාමත් වැදගත්ය. එලෙස කිසියම් කෙනෙකුගේ හෝ කිහිපදෙනෙකුගේ පෞද්ගලික හැසිරීම් හා ආදර්ශයන්ගෙන් ඉගෙන ගන්නා, අත්දැකීම් ලබන ජනතාව දේශපාලන දැනුම නැතත් ඔවුනට බැඳෙති. ඒ වෙනුවෙන් බොහෝ දේ කිරීමටද පෙළඹෙති. සත්‍යය එයයි.

> "ධනවාදයේ අර්බුදය විසින් ජනතාව පීඩාවට පත්වීමත්, එකී පීඩනයෙන් මිදීමට ජනතාව ගත් සියලු උත්සාහයන් ව්‍යර්ථවී සමාජ ක්‍රමය වෙනස් කිරීමේ මඟට ඒමට ඔවුන්ට සිදුවීමත් වමේ ව්‍යාපාරයක් මතවාදී ලෙස ඔවුන් දිනා ගැනීමත් යන සාධක සමග පෞද්ගලික අත්දැකීම් විසින්ද ජනතාව දිනා ගැනීම එක්වූ විට ජනතාව විප්ලවීය බලයක් බවට පත්වේ."

**'අම්මා'ගෙන් ඉගෙනීම**

ගෝර්කිගේ 'අම්මා' නවකථාවේ පාවෙල්ගේ අම්මා සිය පුතුගේ රහසිගත දේශපාලනයේ ක්‍රියාකාරී කෙනෙක් වූයේ විප්ලවය පිළිබඳ අධ්‍යාපනික දැනුමකින් නොව, තම නිවසට පැමිණි, පුතාගේ සගයන්ගේ පෞද්ගලික හැසිරීමෙන්, කැපකිරීමෙන්, සහෝදරාත්මක බැඳීම් තේරුම් ගැනීමෙන්, තම පුතුගේ වෙනස්කම් දැකීමෙන් හා ඒවා ඇගයීමෙන්ය. දේශපාලන අවබෝධය කිසිත් නැතිව "මේ ළමයි හොඳ වැඩක් කරනවා. ඒ අයට උදව් කළ යුතුයි" යන සිතිවිල්ලෙන් මහා කැපකිරීම් කළ 'අම්මාවරු, අපේ රටේද මෑත ඉතිහාසයේ සිටියෝය; දැනුදු සිටිති. **ඉන් තේරුම් ගත යුත්තේ පෞද්ගලික ආදර්ශයන් හා අත්දැකීම්වලට කෙනෙකු තුළ කළ හැකි වෙනස්කම් විශාල බවය. ඔවුන් තුළ විශාල විශ්වාසයක් ගොඩ නැගීමට එයට පුළුවන. මෙහි අනතුර නම් එහි විලෝමයද තිබීමය. එනම් පෞද්ගලික හැසිරීම්වල දුර්ගුණයන් ජනතාව තුළ විශ්වාසය බිඳීමට ද හේතුවන බවය.**

විප්ලවවාදී ව්‍යාපාරයක විප්ලවවාදීන් සතුව පැවතිය යුතු ගුණයන් රැසක් තිබේ. කොමියුනිස්ට්වාදී විප්ලවාදීන් සටන් වදින්නේ නව සමාජයක් වෙනුවෙනි. ඒ, සමාජවාදී සමාජයයි. එම නව සමාජය ගොඩ නැගීමට දේශපාලන හා ප්‍රායෝගික නායකත්වය හා දායකත්වය දෙන්නේ විප්ලවවාදීන්ය. එසේ වූ විට අනාගතයේ ගොඩ නගන එම නව සමාජයේ හොඳ ගුණාංග, සදාචාරයත් වර්තමානයේ විප්ලවවාදීන් තුළ තිබිය යුතුය. එය තිබීම පමණක් ප්‍රමාණවත් නැත. එම ගුණයන් සමාජයට ඔවුන් වෙතින් පරාවර්තනය විය යුතුය. ජනතාව බැඳෙන්නේ එලෙස පරාවර්තනය වන ධනවාදීන් තුළ නැති එකී නව ගුණයන් වෙතය.

**සංස්කෘතිය තේරුම් ගැනීම**

ජනතාව දිනා ගැනීම සඳහා ඔවුන් සමග වැඩකිරීමේදී පොදු ජන සංස්කෘතිය තේරුම් ගැනීම, ඔවුන්ගේ විශ්වාසයන්, සම්ප්‍රදායන් සදාචාරයන් තේරුම් ගැනීම හා ඒවාට හානි නොකිරීම අත්‍යාවශ්‍ය වේ. නොගැලපෙන මත, හා සම්ප්‍රදායන් වෙනස් කළ යුතු වුවත් එහිදී පවා ඔවුන් සමග ගැටුමක්, ප්‍රතිවිරෝධයක් ඇති නොවනසේ එය කිරීමට අවශ්‍ය වේ. ජනතාව තුළ පවතින විශ්ශ්‍රාවාදී මිත්‍යාවන්, වැරදි අදහස්, නරක සිරිත් වෙනස් කළ යුතු අතර ඒවා වෙනස් කිරීම සඳහා අනුගමනය කළ යුත්තේ ඒවාට නිර්දය ලෙස පහර දීම නොව ඔවුනට ඉවසීමෙන් අවබෝධකරදීම හා ඒත්තු ගැන්වීමය. නැතිනම් ඔවුහු තම මතවාද වෙනුවෙන් විප්ලවාදීන් සමග සටනට එති. එවිට ජනතාව අතර ගොඩනැගෙන සම්බන්ධයට බාධා ඇතිවේ.

ජනතාව අතර වැඩකිරීමේදී ඔවුන් අතර පවතින සම්ප්‍රදායන්ට ගරුකිරීම මෙන්ම නව වටිනා සම්ප්‍රදායන් හා වටිනාකම්වලට ඔවුන් හුරු කිරීම කළ යුතුය. එවිට ඔවුන් ඒවා වැළඳගනු ඇත. එසේම ලෝක විප්ලවාදී ව්‍යාපාර රැසක් තම අත්දැකීම් ඇසුරින් උගන්වා ඇති පරිදි දේශපාලන ක්‍රියාකාරකම්වලදී හා පෞද්ගලික සබඳතාවලදීද ජනතාවට රිදෙන ඔවුන් පීඩාවට පත්වන දේ නිතර නිතර කිරීමෙන් වැළකිය යුතුය. ඔවුන්ගෙන් යමක් ලබා ගැනීමේදී , පොදු සටන් ක්‍රියාමාර්ගයකදී අපහසුතා ඇති වුවත් ඒවා ඔවුන් කැමැත්තෙන් ඉවසා සිටින තත්වයට පත් කළ යුතුය. දේශපාලන ක්‍රියාකාරකම් හෝ පෞද්ගලික හැසිරීම් නිතර ජනතාවට පීඩාගෙන දෙන්නේ නම් එවිට ඔවුන් කරදරයෙන් මිදීමට සතුරන් වෙතට යනු ඇත.

මෙලෙස ජනතාව සමග කටයුතු කිරීම සරල නොවන තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් වුවද එසේ ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍යය. ධනවාදයේ **අර්බුදය විසින් ජනතාව පීඩාවට පත්වීමත්, එකී පීඩනයෙන් මිදීමට ජනතාව ගත් සියලු උත්සාහයන් ව්‍යර්ථවී සමාජ ක්‍රමය වෙනස් කිරීමේ මගට ඒමට ඔවුන්ට සිදුවීමත් වමේ ව්‍යාපාරයක් මතවාදී ලෙස ඔවුන් දිනා ගැනීමත් යන සාධක සමග පෞද්ගලික අත්දැකීම් විසින්ද ජනතාව දිනා ගැනීම එක්වූ විට ජනතාව විප්ලවීය බලයක් බවට පත්වේ.** එවැනි ජනතාවක් අනභිබවනීය වන අතරම ඔවුන් අනිවාර්ය ලෙසම ජය ගන්නවා ඇත. ඒ සඳහා ජනතාව සමඟ වැඩ කළ යුතුය. ජනතාව සමඟ වැඩ කරන කලාව ඉගෙනගත යුතුය.

# 2015 අයවැය ජනතාවගෙන් උදුරාගත් දේ!




රනිල් - මෛත්‍රී හවුල් පාලනයේ පළමු අයවැය (යහපාලන අයවැය) පාර්ලිමේන්තුවේ මාසයක කාලයක් වාද විවාද කර පසුගිය දෙසැම්බර් 19 වෙනිදා බහුතර මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවේදී සම්මත කරගන්නා ලදී. මෑත ඉතිහාසයේ අයවැයක් පිළිබඳව වැඩිම කථාබහකට ලක්වූයේ මෙම අයවැය යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවනු ඇත. එසේම ජනතාවගෙන් වැඩිම විවේචන එල්ල වූ අයවැය අතුරින් එකක්ද වූයේ මෙම අයවැයයි. අයවැය පාර්ලිමේන්තුවේ සම්මත වුවද අයවැයට ඉදිරිපත් වන විවේචන සහ උද්ඝෝෂණ නතර වූ බවක් පෙනෙන්නට නැත. මහපාරේ පරණ යකඩ එකතු කරන්නාගේ සිට සුපිරි ඉලෙක්ට්‍රොනික් කාර් ආනයනය කරන්නා දක්වාම ආණ්ඩුවට බනින අයවැයක් බවට මෙම අයවැය පත්විය. එසේම අයවැය කථාවෙන් පසුව වරින් වර සංශෝධනයන් බොහොමයකට ලක්වූ අයවැය අතුරින් ඉතිහාසගතවන අයවැයක් බවට මෙම රනිල් - මෛත්‍රී හවුල් අයවැය පත් විය.

### ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධන

අයවැය විවාදය අතරතුර කෙරුණු සංශෝධන ආණ්ඩුවේ ඇමතිවරුන් හැඳින්වූයේ ආණ්ඩුව කලින් පැවැති රාජපක්ෂ රෙජීමයට වඩා ප්‍රජාතන්ත්‍රවාදී ඇහුම්කන් දෙන ආණ්ඩුවක් නිසා විපක්ෂයට සහ මහජනතාවට ඇහුම්කන් දීමෙන් සිදුකරන ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධන ලෙසය. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නිසා තමන් මේ ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ නම් ඔවුන් එම ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු වූයේ අයවැය ඉදිරිපත් කිරීමටත් කලින්මය. එසේම විපක්ෂයට සවන්දෙන ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ නම් වෙනස් කළ යුතු වූ රටට අහිතකර ලෙසම ඇති යෝජනා බොහොමයක් වෙනස් නොකරම පවතී. (උදා: විනිමය රෙගුලාසි අහෝසි කිරීම, ඉඩම් බැහැර කිරීමට තිබූ නීතිමය බාධා ඉවත් කිරීම ) ඒවා ආණ්ඩුවේ ආර්ථික උපායමාර්ග යන් අනුව නව ලිබරල්කරණයේ ඉදිරි පිම්මට සකස් කළ යෝජනාය. වෙනස් කරනවාය කියා ආණ්ඩුව කියන්නේ ආණ්ඩුවේ ආර්ථික උපායමාර්ග යට හානිකරන නොවන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු ආණ්ඩුව සතුටු කරන බලවේග තරහා නොවන යෝජනාය. ඒවා එහා මෙහා කිරීමට ඉඩ ඇති එයින් භාණ්ඩාගාරයට ඉතා අවම හානි ඇති (හානි නොවන) යෝජනාය. (උදා:- දුම් පරීක්ෂණ ගාස්තු අඩුකිරීම, පොල් ආනයනය නතර කිරීම, බැංකුවේ තැන්පත් කළ මුදල් ලබා ගන්නා විට ගාස්තුවක් අය කිරීමේ යෝජනාව ඉවත් කර ගැනීම) ආණ්ඩුව මහජන උද්ඝෝෂණයට පිටුපෑමට නොහැකි තැන තාක්ෂණික වශයෙන් සුළු වෙනස්කම් කිහිපයක් පමණක් සිදු කර ගත්තා මිස අයවැයේ ජනතාව පීඩනයට පත් කරන කිසිදු යෝජනාවක් ඉවත් කරගෙන නොමැත.



"නිෂ්පාදනය සංකේන්ද්‍රණ විය. එයින් ඒකාධිකාර උද්ගත විය. බැංකු හා කර්මාන්තය සංයෝජනය විය. නැතහොත් එකට හා විය. මූල්‍ය ප්‍රාග්ධනයේ නැගීමේ ඉතිහාසය එසේ විය. එමෙන්ම එම සංකල්පයේ සන්ධාරයද එපරිදිය."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 04 වෙළුම, 74 පිටුව**

### කොල්ලුපිටියෙන් - ඇඹිලිපිටියට

1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථිකයේත් ගමන් මග විවිධ නාමකරණයන්ට ලක් කළද එකම පීල්ලක, එකම මගක දිගටම ගමන් කර දැන් ප්‍රධාන ධනපති පක්ෂ දෙකේ හවුල් පාලනයක් ළඟ නතර කර ඇත. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා මෑතකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල "සමාජ වෙළඳපොළ" (social market economy) වෙළඳපොළ ආර්ථික දැක්මද විවෘත ආර්ථික ගමනේම ඉදිරි දිගුවක් බව අයවැය යෝජනා මගින් තවදුරටත් තහවුරු කර ඇත. සමාන්‍ය ජනතාවට 85%ක් වක්‍ර බදු පනවන ගමන්, බදු සහන යෝජනා කර ඇත්තේ, විදේශීය ආයෝජන සඳහාය. විදේශිකයින්ට ඉඩම් පැවරීමට - බදු දීමට තිබූ නීති ලිහිල් කරන ගමන් පොහොර සහනාධාරය කප්පාදු කර දාන්නේ, රටට බත සපයන ගොවි ජනතාවටය. තේ. රබර් කර්මාන්ත ඇද වැටෙද්දී දිරි දී ඇත්තේ, ඔවුන්ට නොව විදේශීය ආයෝජන සඳහාය; ලංකාවට තේ ආනයනය කර විකිණීමටය. ආණ්ඩුවේ ඉලක්කය වී ඇත්තේ, කොල්ලුපිටියට විදේශීය ආයෝජන කැඳවා ඇඹිලිපිටියට ඉන් සොච්චමක් ගලා යනු ඇතැයි විශ්වාසය ජනතාවට ජනිත කිරීමය.

රනිල් වික්‍රමසිංහ පාලනය බලාපොරොත්තු තබා ඇත්තේ, ලබන ජනවාරි වනවිට ජෝර්ජ් සොරෝස් වැනි ධන කුවේරයන්ද, ජොර්ජ් ස්ටිග්ලිට්ස් වැනි ආර්ථික විශේෂඥයින් ලංකාවට කැඳවීමටය. ජෝර්ජ් ස්ටිග්ලිට්ස් ඇමරිකානු ආර්ථික අර්බුදයේදී ඇමරිකා එක්සත් ජනපදය අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තිය ගැන දැක්වූ අදහස කොල්ලුපිටියට මුදල් මුදාහැර ඇඹිලිපිටිය දියුණු කරන ආණ්ඩුවේ සංකල්පයට හොඳම පිළිතුරක් සපයයි. ඔහු පැවසුවේ මෙයය.

**"...ඔබ වෝල් වීදියට, ඇමරිකානු මූල්‍ය වෙළඳපොළට ඇති තරම් මුදල් වීසිකර ඉන් කොටසක් පහළට කාන්දු කිරීමෙන් ආර්ථිකයේ අනිකුත් අංශ ශක්තිමත් වේ යැයි අපේක්ෂා කරයි. මෙය අභ්‍යන්තර ලේ ගැලීමක් සිදුවුණු රෝගියකුට පිටතින් විශාල වශයෙන් ලේ පොම්ප කිරීමක් බඳුය. එය අභ්‍යන්තර ලේ ගැලීමට හේතු වූ මූලික කරුණු විසඳීමට, ප්‍රශ්නයට මුල් වූ හේතු කිසිවක් විසඳීමට කිසිවක් කරන්නේ නැත."**

ආණ්ඩුවේ කොල්ලුපිටියට මුදල් කැඳවා ඇඹිලිපිටිය දියුණු වේ යැයි සිතන මිත්‍යාවට අපට දිය හැකි හොඳම උදාහරණයද ජෝර්ජ් ස්ටිග්ලිට්ස් වොල් වීදියේ අර්බුදය ගැන කළ ප්‍රකාශයමය.

### අයවැය අහිමි කළ දේ

ආණ්ඩුවකින් අයවැය ඉදිරිපත් කරන විට, ආණ්ඩුව අපේක්ෂා කරන්නේ, ඉදිරි වසර සඳහා ආදායම ඉපැයීම සහ වියදම් කළමනාකරණය කිරීමය.

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නිසා තමන් මේ ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ නම් ඔවුන් එම ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු වූයේ අයවැය ඉදිරිපත් කිරීමටත් කලින්මය. එසේම විපක්ෂයට සවන්දෙන ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ නම් වෙනස් කළ යුතු වූ රටට අහිතකර ලෙසම ඇති යෝජනා බොහොමයක් වෙනස් නොකරම පවතී.

ජනතාව අපේක්ෂා කරන්නේ, තමන් මෙතෙක් ලබා ඇති අයිතීන් කප්පාදු කර නොගෙන තවත් යම් සහනාධාරයක් ලබා ගැනීමය.

නමුත් ආණ්ඩුව (යහපාලන) අයවැයෙන් සිදුකර ඇත්තේ, ජනතාව මෙතෙක් ලබා තිබූ සහනත් අයවැයෙන් කප්පාදු කිරීමය. ඒ නිසා නැති අර්බුද රැසක් අයවැය සම්මත වන විට ආණ්ඩුව රට පුරා ඇති කර ගත්තේය. අදටත් ඒ අර්බුද එලෙසම ඇවිලෙමින් පවතී. ඉන් ප්‍රධාන සහන කප්පාදුවක් සිදු වූයේ පොහොර සහනාධාරයට අදාලවය.

### පොහොර අ(සහනාධාරය)

රු. 350ට පැවැති පොහොර මිටියක සහනාධාරය මෙවර අයවැයෙන් ඉවත් කර හෙක්ටයාරයකට (අක්කර 2 1/2) රු. 25,000ක මුදලක් ලබා දීමේ යෝජනාවක් අයවැය මගින් ඉදිරිපත් කර ඇත. එම රු.25,000න් ගොවි ජනතාව පොහොර ලබා ගත යුත්තේ රු. 350/- මිලට නොව මින් ඉදිරියට වෙළඳ පොලේ පොහොර සමාගම් තීරණය කරන මිලටය. එවිට පොහොර මිටියක් සඳහා රු. 4000/-ක් පමණ වියදමක් දැරීමට සිදුවනු ඇත.

මුල්න් පැවැති අයවැය යෝජනාව අනුව කන්න දෙක සඳහාම ලබාදුන් රු.25,000/- පසුව විරෝධතා නිසා රු. 50,000/- ක් දක්වා වැඩි කළද එය කෙසේවත් ගොවියාට ප්‍රමාණවත් නොවේ. සාමාන්‍යයෙන් අක්කරයකට පොහොර සඳහා ගොවියා රු.11,212/-ක් දැරිය යුතු වේ. (රු.500/- ට පොහොර සහනාධාරය ඇතිවිට ගොවීන්ට වියදම වූයේ රු. 2000කි. රු. 9212/-ක් වියදම දැරුවේ ආණ්ඩුව විසිනි.)

අක්කර 2 1/2ක් සඳහා වර්තමාන යෝජනාව අනුව ගොවින් විසින් අමතර රු.11,630/-ක් ගෙවිය යුතුවේ. ඉන් නතර නොවන ආණ්ඩුව (යහපාලන) පැවැති සම්බා සඳහා සහතික මිල රු.50 රු. 09කින් අඩු කර රු. 41ක් දක්වා පහත දමා ඇත. ගොවියෙක් සම්බා සහල් කිලෝ 2000ක් ආණ්ඩුවේ වී ගබඩාවට අලෙවි කළේනම් ඔහුට අහිමි වන මුදල (9 * 2000) රු. 18,000/-කි. කන්න 2ක් සඳහා 36,000/-කි. පොහොර සහනාධාරය කන්න 2ක් සඳහා රු. 23,000/-කුත්, වී මිල පහත දැමීම නිසා රු. 36,000/-කුත් බැගින් වසරකට ගොවියාට සිදුවන පාඩුව පමණක් රු. 59,000/-ක් වනු ඇත. ජනතාවට පැවැති සහනාධාරයක් ආණ්ඩුව උදුරා ගැනීමෙන් ගොවි ජනතාවට සිදුවන පාඩුව එලෙසය. තේ සඳහා ලැබුණු සහනාධාරයද මුළුමනින්ම ඉවත් කර ඇත. පැවැති විරෝධතා නිසා එළවළු, මල්, පළතුරු සඳහා සහනාධාර දෙන බව ප්‍රකාශ කළද ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොමැති බව මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තරයෙන් වාර්තා වේ.

### තේ - කසළ කිරීම

ආණ්ඩුවේ අයවැය යෝජනා අනුව "සිලෝන් තේ" (Ceylon Tea) නාමය කසළ තේ කිරීමට යෝජනා කර ඇත. ඩුබායි ආදර්ශය ලබා ගෙන ඩුබායි මෙන් තේ කලවම් කර විකිණීමේ (ප්‍රති අපනයනය) මධ්‍යස්ථානයක් බවට ලංකාව පත් කිරීම සඳහා ආණ්ඩුව අයවැය යෝජනා මගින් ලංකාවට තේ ආනයනය කිරීමට යෝජනා කර ඇත. ඩුබායි තේ නිපදවන රටක් නොවේ. ලංකාව තේ නිපදවන රටක් මෙන්ම තේ පිළිබඳව නාමයක් ලෝකයේ සලකුණු කළ රටකි. එක් පැත්තකින් තේ පොහොර සහනාධාරය මෙන්ම, ආණ්ඩුව මෙතෙක් ගෙවන ලද රු. 80/-ක සහතික මිලද අහෝසි කරන අයවැය තේ සඳහා සහනාධාර ලබා දී ඇත්තේ වැවිලි සමාග ම්වලට පමණි. විශාල වැවිලි සමාගම් වසර 02 කට බදු නිදහසකින් සහන සලසන ආණ්ඩුව, කුඩා වැවිලිකරුවන්ට සහ තේ කර්මාන්තශාලා හිමියාට කිසිදු සහනයක් නොදී ඒ වෙනුවට ආර්ථික සේවා ගාස්තුවටත් ආදායම් බදු සීමා ඉහළ දැමීමටත් ලක් කර ඇත. ලක්ෂ 10ක් පමණ ඍජුවත් තවත් ලක්ෂ 20ක් පමණ වක්‍රවත් දැවැන්ත පීඩනයකට ඒ මගින් ලක් කර ඇත.

පොල් ආනයනය කිරීමට ගෙන තිබූ යෝජනාව පැන නැගී විරෝධය නිසා හකුළා ගන්නා ලදී. නමුත් පැවැති නිල ඇඳුම් ලබා දීමේ ක්‍රමවේදය වෙනස් කිරීමෙන් ඇති වූ අවුලට විසඳුමක් නැත. වාහන ගෙන්වීම සම්බන්ධයෙන්ද ආණ්ඩුව අයවැයෙන් නිර්මාණය කළේ විකෘතිම තත්වයකි. ලෝකයේ බොහෝ රටවල පරිසර හිතකාමී වාහන සඳහා බදු සහන ලබා දෙන තත්වයක් තුළ ආණ්ඩුව ඉලෙක්ට්‍රොනික් වාහන සඳහා ලක්ෂ 25ක පමණ ඉහළ බදු පනවන ලදී. බැංකුවේ මුදල් තැන්පත් කරන අයගෙන් ලක්ෂ 10 කට වැඩි මුදලක් නැවත ගන්නා විට 1%ක් (රු. 10,000)ක් අය කරන අපූරු ක්‍රමයක් හඳුන්වා දී ඇත. එයද විපක්ෂයේ විරෝදතා නිසා හකුළා ගන්නා බව ප්‍රකාශ කළද තවමත් ක්‍රියාත්මක කිරීමේ චක්‍රලේඛයක් නිකුත් වී නොමැත. රන් කර්මාන්තයේ නියැළුණු අයටද කණකොකා හඬවමින් රත්‍රං ගෙන්වීම 50 දෙනෙකුගේ ඒකාධිකාරයකට පමණක් සීමා කිරීමට අයවැය යෝජනා කර ඇත. මාර්ග අනතුරක් සිදුවන්නේ කාගේ වරදින්දැයි නොසොයා අනතුරකට රු.10.000ක් ද, පොදු දේපළවලට වන හානි සඳහා වෙනම දඩ ගාස්තු අයකිරීමටද යෝජිතය.

මෙතෙක් 15වැනි පිටුවට

# ආණ්ඩුවේ රෙදි ගැලවූ පාසල් නිල ඇඳුම් රෙදි



පාසල් දරුවන්ට නිල ඇඳුම් රෙදි නොමිලයේ ලබාදීම වෙනුවට වත්මන් යහපාලන ආණ්ඩුව හිටිග මන් එක්වරම එය නවතා දමා ඊට වඩා වියදම් අඩු ක්‍රමයක් ලෙස හුවා දක්වමින් රෙදි ලබාදීම වෙනුවට එම නිල ඇඳුම් රෙදි විවෘත වෙළඳපොළෙන් ලබාගැනීම සඳහා වූ වවුචර්පතක් ලබාදීම ආරම්භ කළේය. ආරම්භයේදීම මේ සඳහා ගුරුවරුන්ගේත් විදුහල්පතිවරුන්ගේත් දෙමව්පියන්ගේත් විරෝධතා එල්ලවීම මගින් එය අවුල් ජාලයක් බවට පත්විය. වත්මන් ආණ්ඩුව විසින් ගත් මෙම අත්තනෝමතික තීරණය හේතුවෙන් මතුවූ ගැටලු හා එකී ක්‍රමයේ අඩුපාඩු හා දෝෂත් පාසල් නිල ඇඳුම් රෙදි නොමිලයේ ලබාදීමේ ක්‍රියාවලියට සිදුවිය හැකි අනතුරත් පිළිබඳ විවිධ පාර්ශවයන් පෙන්වාදුන් කරුණු කිසිවක් පිළිගැනීමට තරම්වත් ආණ්ඩුව හෝ අධ්‍යාපන අමාත්‍යවරයා නිහතමානී වූයේද නැත. ඔවුන් පවසන ආකාරයට නොමිලේ නිල ඇඳුම් රෙදි ලබාදීම සඳහා තිබෙන සුපිරිම හා නිවැරදිම ක්‍රමවේදය මෙයයි. එකී ක්‍රමවේදයට සමාජයේ මතුව තිබෙන විවේචනයත් විරෝධයත් අනුව ඔවුන්ගේ සුපිරි ක්‍රමවේදයේ තරම හොඳින් පැහැදිලි වේ.

නොමිලයේ පාසල් නිල ඇඳුම් රෙදි ලබදීම ආරම්භ වූයේ 1993 වර්ෂයේදීය. එතෙක් සිට මේ දක්වා වසර 22ක් පුරාම පාසල් දරුවන්ගේ අතටම නිල ඇඳුම් රෙදි ලබාදීමේ ක්‍රියාවලිය පාසල මගින් සිදුවිය. එකී ක්‍රියාවලිය නියාමනයේ හා අධීක්ෂණයේ පැවති යම් යම් අඩුපාඩු හේතුවෙන් එහි යම් ප්‍රමාදයන්ද ප්‍රමිතිය පිළිබඳ ගැටලුද මතුවිය. එසේ වුවද දරුවන්ගේ අතට බාධාවකින් තොරව නිල ඇඳුම් රෙදි ලැබුණි. 1993 පැවති රණසිංහ ප්‍රේමදාස මහතාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් නොමිලයේ පාසල් නිල ඇඳුම් රෙදි ලබාදීම ආරම්භ කළ අතර මේ දක්වා පැවති පොදු පෙරමුණු ආණ්ඩු හා සන්ධාන ආණ්ඩුත් එකී ක්‍රමවේදයටම පාසල් නිල ඇඳුම් රෙදි ලබාදීම සිදුකරන ලදී. එසේ වුවද 2015 පත්වූ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවට එම ක්‍රමවේදය මහා බරපතළ මුදල් නාස්තිකර දමන ඉතා වැරදි ක්‍රමවේදයක් බවට පත්ව තිබීම ඉතිහාසයේ සරදමකි. රජය විසින් පාසල් දරුවන්ට නිල ඇඳුම් රෙදි ලබාදීම සිදුකරන ලද්දේ විශේෂයෙන්ම මේ රටේ වෙසෙන බහුතරයක් වූ දුප්පත් අහිංසක දරුවන්ට පාසල් අධ්‍යාපනයට පැවති බාධාවන් ඉවත් කිරීමේ අරමුණෙනි. මන්ද පාසල් වෙත යාමට නිල ඇඳුම සකසා ගැනීමට වත්කමක් නොමැතිකමින් බොහෝ දරුවන් පාසල් යාම නවතා තිබූ බැවිනි. තවද රටේ සියලු දරුවන්ට එක හා සමාන නිල ඇඳුම් රෙදි සැපයීම මගින් දරුවන් සියලුදෙනා අතර සමානකමක් පවත්වා ගැනීමද මෙහි අරමුණක් විය. එසේම නිල ඇඳුම් රෙදි සැපයීමේ ක්‍රියාවලියේදී මූලික කරුණු දෙකක් සැලකිල්ලට ගනු ලැබීය. ඉන් ප්‍රධාන කරුණ වූයේ දරුවන්ට ඉතා ඉහළ ප්‍රමිතියෙන් යුතු නිල ඇඳුම් රෙදි ලබාදීමය. අනෙක එකී ඉහළ ප්‍රමිතියෙන් යුතු නිල ඇඳුම් රෙදි නිෂ්පාදනය දේශීය නිෂ්පාදකයින්ට ලබාදෙමින් දේශීය රෙදි කර්මාන්තයට අත්වැලක් සැපයීමය.

### පැටවී ගැසූ ගැටලු

නමුත් නව වවුචර්පත් ක්‍රමවේදය තුළින් ඉහත කී මූලික කරුණු දෙකම උල්ලංඝනය කර තිබේ. මන්ද වවුචර්පත මගින් රෙදි මිලදී ගැනීම විවෘත වෙළඳපොල මගින් සිදුකළ යුතුවීම නිසාත් එකී වෙළඳ ආයතනවල විවිධ මිල ගණන් හා විවිධ ප්‍රමිතියෙන් යුතු රෙදි වර්ග තිබීමත් ඉහළ ප්‍රමිතියෙන් යුතු නිල ඇඳුම් රෙදි අවශ්‍ය ප්‍රමාණය මිලට ගැනීමට වවුචර්පතේ වටිනාකම ප්‍රමාණවත් නොවීමත් යන කරුණු හේතුවෙන් මෙරට බහුතරයක් වූ දුප්පත් දෙමව්පියන් විසින් තම දරුවා වෙනුවෙන් මිලදී ගන්නේ වවුචර් පතේ වටිනාකමට පමණක් සරිලන ප්‍රමිතියෙන් අඩු නිල ඇඳුම් රෙදි හෝ මසා නිමකළ නිල ඇඳුම්ය. නමුත් යම් ආර්ථික හැකියාවක් ඇති දෙමව්පියෝ ඉහළ ප්‍රමිතියෙන් යුතු හොඳ නිල ඇඳුමක් හෝ රෙදි තම දරුවා වෙනුවෙන් මිලදී ගනිති. ඒ අනුව පාසල තුළ හා පංති කාමරය තුළ නිල ඇඳුම මගින් දරුවන් තුළ සමානාත්ම හැඟීමක් ඇති කිරීමට උත්සාහ දැරීම උල්ලංඝනය වී තිබේ. එසේම දරුවන් සියලු දෙනාට ප්‍රමිතියෙන් ඉහළ නිල ඇඳුමක් සැපයීම යන්නද බිඳ දමා තිබේ. විශේෂයෙන් විවෘත වෙළඳපොළේ සියලුම ව්‍යාපාරිකයින් සතුව පවතින පාසල් නිල ඇඳුම් රෙදි බොහෝමයක්ම ආනයනික රෙදි තොග බැවින් දේශීය නිල ඇඳුම් නිෂ්පාදකයින්ට මෙම වවුචර් පත් ක්‍රමය හරහා කිසිදු සහනයක් නැති අතර තමන්ට තිබූ වෙළඳපොළද අහිමි වීමෙන් ඔවුන් වැටී ඇත්තේ කබලෙන් ලිපටය.

එබැවින් වත්මන් ආණ්ඩුව මේ සම්බන්ධව ගත යුතුව තිබුනේ පැවති ක්‍රමයේ අඩුපාඩු හා දෝෂ මගහරවා ගත් විධිමත් හා සැලසුම්ගත ප්‍රවේශයකට එළැඹීමය. ඒ වෙනුවට හිතුවක්කාරී හා අත්තනෝමතික ලෙස ගෙන ආ වවුචර්පත් ක්‍රමය හේතුවෙන් ඉහත කී කරුණුවලට අමතරව තවත් ගැටලු රාශියක් මතුව තිබේ.

වවුචර් පත් දරුවන් හෝ දෙමව්පියන් විසින් අතට පත්කිරීමේදී සකසා තිබෙන ක්‍රමවේදයේ ගැටලු ගණනාවක් පවතී. එකී සෑම වවුචර් පතකම පාසල් අංකය සඳහන් කිරීම, ගුරු වැටුප් ගිණුම වෙනුවෙන් එම ගිණුම පවත්වාගෙන යන ගුරුවරයා හා විදුහල්පතිවරයා අත්සන් යෙදීම එම ගිණුම් අංකය එහි සඳහන් කිරීම, වවුචර්පත ගන්නා අයගේ (ශිෂ්‍යයාගේ හෝ දෙමව්පියන්ගේ) නම, පුද්ගල හැඳුනුම්පත් අංකය, අත්සන පුද්ගල හැඳුනුම්පත නොමැතිනම් දෙමාපිය අත්සන සහතික කිරීමට විදුහල්පති අත්සන තැබීම යන කරුණු සියල්ල සම්පූර්ණ කිරීමේදී විදුහල්පති, ගුරුවරුන්, දෙමව්පියන් හා දරුවන් දැඩි අපහසුවකටත් පීඩාවකටත් පත් වෙති. එසේම ඒ සඳහා සැලකිය යුතු කාලයක් වැය කිරීමටද සිදුවේ.

### ගුරු වැටුප් අනතුරේ

විශාල සිසුන් සංඛ්‍යාවක් සිටින පාසලක එම ප්‍රමාණයට සරිලන වවුචර්පත් සංඛ්‍යාවක් අත්සන් කිරීමට විදුහල්පතිවරයාටත් ගුරු වැටුප් ගිණුම පවත්වාගෙන යන ගුරුවරයාටත් සිදුවීම පාසල් පරිපාලන කටයුතු හා සැසඳීමේදී බලවත් පීඩාවක් වූ අමතර රාජකාරියකි. එසේම වවුචර්පත් පාසලට ලබා ගැනීම පංතිවලට බෙදාහැරීම, දෙමව්පියන්ට හෝ සිසුන්ට ලබාදීම, ඉතිරි වවුචර්පත් යළි විදුහල්පතිවරයාට භාරදීම. ඉතිරි වවුචර්පත් යළි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාරදීම යන සෑම අවස්ථාවකටම අදාලව ආකෘති පත්‍ර ගණනාවක් පිරවීමට ගුරුවරුන්ට හා විදුහල්පතිට සිදුවීමද ඔවුන්ට දැඩි පීඩාවකි. මෙවර වසර අවසාන වාර විභාග කටයුතු, ඇගයීම් වාර්තා සැකසීම, උත්තර පත්‍ර සැකසීම, දෙමව්පිය කව පැවැත්වීම යන වැඩකටයුතු බහුලව සිටි ගුරුවරයා මත වවුචර්පත ලබාදීමේ ඉහත කී වැඩ කන්දරාවද පැටවීමෙන් ගුරුවරු විශාල පීඩනයකට පත්වූහ. ගුරුවරුන් පත්වූ මෙම වැඩ අධික පීඩාකාරී තත්වය හේතුවෙන් නිසි පරිදි වවුචර් පත දෙමව්පියන් අතට පත්කිරීමේ ගැටලු මතුවිය. එබැවින් මෙම වවුචර් පත ලබාගැනීම සඳහා දෙමව්පියන්ට දින කිහිපයක්ම පාසල වෙත පැමිණෙමින් රස්තියාදුවීමට සිදුවිය. එදිනෙදා කුලී වැඩ කරන දෙමව්පියන්ද, ස්වයං රැකියාවල නියුතුවූවන්ද තමන්ගේ දින දෙක තුනක ආර්ථික පාඩුවක් සිදුකරගනිමින් මෙම වවුචරය ලබාගැනීමට පාසලට පැමිණීමට සිදුවිය. ඒනිසා වවුචර් පතේ වටිනාකමට වඩා හත්අට ගුණයක ආර්ථික හානියක් සිදුකර ගැනීමට දෙමව්පියන්ට සිදුවිය. එබැවින් ආරම්භයේදීම මෙම වවුචර් ක්‍රමයට දෙමව්පියන්ගේ දැඩි විරෝධයක් එල්ල විය.

වවුචර්පතට අදාළ නිල ඇඳුම් රෙදි ලබාගැනීමට දෙමව්පියන්ට දරුවන්ද සමග කඩේ යාමට සිදුව තිබීමද ඔවුන්ට අමතර පීඩනයක් මෙන්ම දෛනික ආර්ථික කටයුතුද හානියට පත්කර ගැනීමකි. මෙම වවුචරයට නිල ඇඳුම් ලබාදෙන වෙළඳසැලක් සොයාගැනීමද ප්‍රධාන නගරවලින් බැහැරදී ඉතා දුෂ්කර කටයුත්තකි. ඒ අනුව බලන කළ වත්මන් ආණ්ඩුව නිල ඇඳුම් වවුචරය මගින් මේ රටේ දුප්පත් අහිංසක දෙමව්පියන් කඩේ යවමින් සිටී. ඇතැම් වෙළඳ ව්‍යාපාරිකයින් නිල ඇඳුම් රෙදි සඳහා විවිධ මිල ගණන් අයකරන බැවින් බොහෝ දෙමව්පියන්ට අදාළ නිල ඇඳුම් රෙදි ප්‍රමාණය මිලදී ගැනීම සඳහා වවුචර් පතේ වටිනාකම ප්‍රමාණවත් නොවීම නිසා අතින් මුදල් ගෙවීමටද සිදුව තිබේ.

වවුචර් සඳහා ගුරු වැටුප් ගිණුම යොදවා ගැනීමට ආණ්ඩුව ගෙන තිබෙන තීරණයට ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ දැඩි විරෝධය එල්ලවෙමින් පවතී. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිසි පරිදි වවුචර්පත්වලට අදාළ මුදල් ගුරු වැටුප් ගිණුමට බැර නොකළහොත් හා ගුරු වැටුප් ගිණුම හරහා ව්‍යාපාරිකයින් තමන්ට ලැබුණු වවුචර්පත් මුදල්කරගතහොත් ගිණුමේ මුදල් අවසන් වීමෙන් ගුරුවරුන්ට හා විදුහල්පතිවරුන්ට තම වැටුප් අහිමිවීම සිදුවිය හැක. එබැවින් මෙම වවුචර් සඳහා ගුරුවරුන්ගේ ගිණුම යෙදාගැනීම හේතුවෙන් ගුරුවරුන්ගේ වැටුප් සම්බන්ධව අනතුරක් තිබේ.

### කප්පාදුවේ ඇරඹුමද?

මෙම වවුචර් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් පැනනැගී ඇති ගැටලු කන්දරාව දෙස බැලූවිට පෙනී යන්නේ ආණ්ඩුව මෙය හිතාමතා සැලසුම් කළ එකක්ද? යන්නය. එනම් බොහෝ දෙනා පවසන ආකාරයට ආණ්ඩුවට ඕනැවී තිබෙන්නේ පාසල් නිල ඇඳුම් රෙදි නොමිලයේ ලබාදීම කෙසේ හෝ නවතා දමන්නටය. ඒ සඳහා ඔවුහු එය පියවරෙන් පියවර කප්පාදු කිරීමේ කුමන්ත්‍රණයක යෙදී සිටිති. ඒ අනුව යමින් ඔවුහු පාසල් නිල ඇඳුම් රෙදි ලබාදීමේ විකල්ප ක්‍රමයක් ලෙස මෙකී ආන්දෝලනාත්මක වවුචර් ක්‍රමය හඳුන්වා දුන්හ. ඒ තුළ සැකසූ ක්‍රියාවලිය මගින් මීට සම්බන්ධිත අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා දෙමව්පියන් හා දරුවන් පීඩාවට පත්කිරීමට හිතාමතාම සැලසුම් කර තිබේ. ඒ හරහා නිල ඇඳුම් නොමිලයේ ලබාගැනීම හා ලබාදීම මෙකී ක්‍රියාවලිය මගින් එපා කරවා අත්හැරීම දක්වා ගෙනයමින් නිල ඇඳුම් රෙදි කප්පාදුව අරඹා තිබේ.

මෙරට ජනතාව ගොනාට අන්දවා නොමිලයේ ලබා දෙන නිල ඇඳුම් කප්පාදු කිරීමට වත්මන් යහපාලන ආණ්ඩුව විසින් ගෙන ආ විකල්ප වවුචර් ක්‍රමය හෙවත් නිල ඇඳුම් කප්පාදු කුමන්ත්‍රණයේ පළමු පියවර පිළිබඳ සමාජය අවදියෙන් සිටිය යුතුය. කෙසේ වුවද ආණ්ඩුවේ මෙකී විකල්ප ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට යාමෙන් ඔවුන් හත්පොළේ ගාගෙන ඇති බව පැහැදිලිය. කෙසේ වුවද ආණ්ඩුවේ කුමන්ත්‍රණය පරාජය කිරීම වෙනුවෙන් මෙරට බහුතර දුප්පත් ජනතාව පෙළගැසිය යුතුය.

> "වවුචර් සඳහා ගුරු වැටුප් ගිණුම යොදවා ගැනීමට ආණ්ඩුව ගෙන තිබෙන තීරණයට ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ දැඩි විරෝධය එල්ලවෙමින් පවතී. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිසි පරිදි වවුචර්පත්වලට අදාළ මුදල් ගුරු වැටුප් ගිණුමට බැර නොකළහොත් හා ගුරු වැටුප් ගිණුම හරහා ව්‍යාපාරිකයින් තමන්ට ලැබුණු වවුචර්පත් මුදල්කරගතහොත් ගිණුමේ මුදල් අවසන් වීමෙන් ගුරුවරුන්ට හා විදුහල්පතිවරුන්ට තම වැටුප් අහිමිවීම සිදුවිය හැක. එබැවින් මෙම වවුචර් සඳහා ගුරුවරුන්ගේ ගිණුම යෙදාගැනීම හේතුවෙන් ගුරුවරුන්ගේ වැටුප් සම්බන්ධව අනතුරක් තිබේ."

# වෙනිසියුලාව: ආණ්ඩු බලය පැරදවූ රාජ්‍ය බලය



2016 වසර අවසන් වූයේ අධිරාජ්‍යවාදී වුවමනාවන් නියෝජනය කරන්නන් හා අධිරාජ්‍යාවාදීන් එකසේ මහත් නොඉවසිල්ලෙන් බලා සිටි මැතිවරණයක ප්‍රතිඵල නිකුත් කරලමිනි. එම ප්‍රතිඵලය අධිරාජ්‍යවාදීන්ට විශේෂයෙන්ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන්ට සුභදායක එකක් වූ අතර අධිරාජ්‍ය විරෝධීන්ට තම ක්‍රියාමාර්ග පිළිබඳ නැවත සිතා බැලීමට බල කෙරෙනා වූ එකක් විය.

පසුගිය දෙසැම්බර් 06 වන දින පැවැත්වූ වෙනිසියුලානු මහ මැතිවරණයෙන් එරට දක්ෂිණාංශික සන්ධානය වූ ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් වටමේසය (Democratic Union Round Table) තුනෙන් දෙකක බහුතරයක් දිනා ගැනීමට සමත් විය. එනම් මුළු ආසන ගණන 167ක් වූ එරට ජාතික සභාවේ ආසන සංඛ්‍යාවෙන් (එරට පාර්ලිමේන්තුව හඳුන්වන්නේ ජාතික සභාව යන නමිනි.) ආසන 112ක් දිනා ගැනීමට එම පක්ෂයට හැකි විය. වෙනිසියුලාවේ බොලිවේරියානු විප්ලවයේ නායක හියුගෝ චාවේස්ගේ හා වත්මන් වෙනිසියුලානු ජනාධිපති නිකොලාස් මධුරෝගේ පක්ෂය වන වත්මන් වෙනසියුලාවේ එකසත් සමාජවාදී පක්ෂය ප්‍රමුඛ සන්ධානයට ලබා ගත හැකි වූයේ ආසන 55ක් පමණි. මැතිවරණ ප්‍රතිඵල නිකුත් වීමත් සමඟ ජාතිය ඇමතූ ජනාධිපති නිකලොස් මධුරෝ මහ මැතිවරණ ප්‍රතිඵලය තමන් පිළිගන්නා බව ප්‍රකාශ කර සිටියේය.

මෙවර මහ මැතිවරණයේ දී 74.25%ක් ජන්දය පාවිච්චි කර තබූ අතර ඉන් 64.07% දක්ෂිණාංශික සන්ධානයට ජන්දය ලබාදී තිබුණු ජනාධිපති මධුරෝගේ පක්ෂයට ලැබුණේ 32.93%ක ප්‍රතිශතයකි. නව පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වන්නේ 2016 ජනවාරි 05 වන දින සිටය.

මෙම මහ මැතිවරණය ජනාධිපති හියුගෝ චාවේස් බලයට පත් වීමෙන් පසු පැවැත්වූ 20වැනි මැතිවරණයයි. එම මැතිවරණ 20 අතරින් ජනාධිපති හියුගෝ චාවේස්ගේ පක්ෂය පරාජයට පත් වූයේ අවස්ථා දෙකකදී පමණි. පළමු පරාජය සිදුවූයේ වෙනිසියුලානු නව ව්‍යවස්ථාව අනුමත කිරීම සඳහා පැවති ජනමත විචාරණයේදීය. දෙවන අවස්ථාව මෙමම මහ මැතිවරණයයි.

වසර 17ක චාවේස්වාදී පාලනයේ දුෂ්කරම මැතිවරණය වූයේ මෙයයි. හියුගෝ චාවේස්ගේ අකල් මරණයෙන් පසු ගත වූ වසර දෙකහමාර චාවේස්වාදීන්ට ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් විය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයත් ඔවුන්ගේ දේශීය ඒජන්තයින් වන දක්ෂිණාංශික සන්ධානයක් දිගින් දිගටම රට තුළ අර්බුදයක් නිර්මාණය කළහ. ඔවුහු වෙනිසියුලාව තුළ කෘත්‍රිම භාණ්ඩ හිඟයක් නිර්මාණය කළ අතර රට පුරා කඩාකප්පල්කාරී ක්‍රියා සංවිධානය කළහ; අභ්‍යන්තර කැරලි කෝලහාල නිර්මාණය කළහ; ජනාධිපති නිකොලාස් මධුරෝට එරෙහිවත් පොදුවේ චාවේස්වාදීන්ට එරෙහිවත් දැවැන්ත මාධ්‍ය මෙහෙයුමක නිරත වූහ.

ලෝක වෙළඳපළේ තෙල් මිල අඩුවීමෙන් වෙනිසියුලානු ආර්ථිකයට සිදුවූ බලපෑම නිසා මෙම තත්වය තවත් තීව්‍ර විය. කලාපීය අධිරාජ්‍ය විරෝධීන්ගේ සහය ලැබුවද ජනාධිපති නිකොලාස් මධුරෝ ප්‍රමුඛ චාවේස්වාදීන්ට තත්වය යහපත් අතට පාලනය කරගත නොහැකි විය.

මෙම මහ මැතිවරණයට පෙර පැවැත්වූ ආර්ජන්ටිනාවේ මහ මැතිවරණයෙන් දක්ෂිණාංශිකයන් ජයග්‍රහණය කිරීමද ඇතිකරවූයේ අහිතකර බලපෑමකි.

මෙම මැතිවරණය පිළිබඳ නිරීක්ෂණය කළ දේශපාලන විචාරකයින් පවසන්නේ දක්ෂිණාංශික සන්ධානය මෙම මහ මැතිවරණයේදී ප්‍රධාන වශයෙන් භාවිතා කළේ ජාත්‍යන්තර හා දේශීය මාධ්‍ය හා සමාජ වෙබ් අඩවි බවය. ඔවුන් බිම් මට්ටමේ මැතිවරණය ව්‍යාපාරය සිදු කර ඇත්තේ ඉතාම අල්ප වශයෙනි.

අවුරුදු 16ක් එකම පාලනයක් තුළ සිටි ජනතාවට වෙනසක අවශ්‍යතාවයද තිබුණි. එය වඩාත් අවශ්‍ය වූයේ පසුගිය අවුරුදු දෙකහමාර තුළ ඔවුන් මුහුණ දුන් ආර්ථික දුෂ්කරතාව හේතුවෙනි. ඇතැම් විට ආහාර ලබා ගැනීම සඳහා ඔවුන්ට සතියකට පැය 07ක් පමණ පෝලිම් ගත කිරීමට සිදු වී තිබිණි. දක්ෂිණාංශිකයන් විසින් සිදු කළ ආර්ථික යුද්ධයට මුහුණදීමට චාවේස්වාදී පාලනය ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කර ගැනීමට අසමත් විය.

දේශපාලන විචාරකයන්ට අනුව ජනාධිපති නිකොලාස් මධුරෝගේ පක්ෂයේ බිම් මට්ටමේ සංවිධාන ක්‍රියාවලිය පසුගිය කාලය තුළදී දුර්වල වී තිබේ. ලෝකයේ අනෙත් ධනේශ්වර පක්ෂවලට වඩා ඔවුන්ගේ බිම් මට්ටමේ ගනුදෙනු හා සංවිධාන ශකතිය ඉදිරියෙන් තිබුණද චාවේස්වාදී පාලනයේ මුල් කාලයට සාපේක්ෂව එය බෙහෙවින් දුර්වල වී තිබේ.

කෙසේ වෙතත් වෙනිසියුලාවේ තම දක්ෂිණාංශික පාලනය ඉදිරියේදී කවර ක්‍රියාමාර්ග යන්ට පිවිසේදැයි කවුරුත් අසන ප්‍රශ්නයකි. එය සරල නොවනු ඇත. පාර්ලිමේන්තුව තුළ 2/3ක බලයක් ලබා ඇති නිසා ඔවුනට අවශ්‍ය නම් ව්‍යවස්ථාව වුවද වෙනස් කළ හැකිය. මැතිවරණ කොමිසම, අධිකරණය හා ජනාධිපතිවරයා පවා වෙනස් කළ හැකිය. මේ නිසා ජනාධිපති හියුගෝ චාවේස් විසින් ආරම්භ කරනු ලැබූ බොලිවේරියානු විප්ලවය හා එහි ක්‍රියාමාර්ග ආපසු හැරවීමේ හැකයාව ඔවුන්ට ඇත.

එසේම ආර්ජන්ටිනාව තුළත්, වෙනිසියුලාව තුළත් සිදු වූ දක්ෂිණාංශිකයන්ගේ මැතිවරණ ජයග්‍රහණයන් කලාපයේ අනෙකුත් රටවල් තුළද බලපෑමක් ඇති කරලීම සඳහා යොදා ගැනීමට අධිරාජ්‍යවාදීන් අනිවාර්යයෙන්ම උත්සාහ කරනු ඇත. එබැවින් මෙකී මැතිවරණ ප්‍රතිඵලයේ අහිතකර බලපෑම වෙනිසියුලාවට පමණක් නොව ලතින් ඇමරිකානු කලාපයටම අදාළ වන්නක් විය හැකිය.

ජනාධිපති හියුගෝ චාවේස් විසින් ආරම්භ කරන ලද බොලිවේරියානු විප්ලවයට වසර 16ක් ගත වී ඇත. එය වෙනිසියුලාවේ ජනතාවට දැවැන්ත සුභසාධනයන් ප්‍රමාණයක් සිදු කළේය. එය ඔවුන්ගේ දුගීභාවය සැලකිය යුතු තරමින් නැති කළ අතර සාක්ෂරතාවය ඉහළ දැමීය; සෞඛ්‍ය තත්වය නඟා සිටුවීය; රටින් පිටට ඇදී ගිය මහා ධනස්කන්ධයක් රට තුළ රඳවා ගනිමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කළේය; එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීමට කටයුතු කළේය. එහෙත් ඒ කිසිවක් බොලිවේරියානු විප්ලවය ආරක්ෂා කරදීමට සමත් වී නැත. ඉන් නැවත වතාවක් තහවුරු වී ඇත්තේ, සමාජවාදී විප්ලවය උදෙසා නිර්ධන පංතිය අතට රාජ්‍ය බලය ලබා ගැනීමේ අවශ්‍යතාවයි. රාජ්‍ය බලය වෙනත් පංතියක් සතුව පවතිද්දී ආණ්ඩු බලයෙන් පමණක් සමාජවාදී විප්ලවය සිදු කළ නොහැකිය යන්නය.



"මා පමණක් නොව සමස්ත ලෝකයම දන්නා පරිදි ධනවාදී ක්‍රමය ඇමරිකා එක්සත් ජනපදය හෝ ලෝකය යන දෙකින් කිසිවකට සේවය නොකරයි. ඒ වෙනුවට එවා සෑම කල්හිම කලිනට වඩා බරපතළ ලෙස අර්බුදයෙන් අර්බුදයට තල්ලු කරවයි."

**ෆිදෙල් කස්ත්‍රෝ**
**හවානා සරසවි දේශනයකදී**

# කියුබාව: ජයග්‍රහණ කේවල් කිරීමට ඉඩ නොදෙමින්

2016 ජනවාරි පළමුවැනිදාට කියුබානු විප්ලවයට වසර 57ක් සම්පූර්ණ වේ. කියුබානු සමාජවාදී විප්ලවයට එරෙහිව ආර්ථික සම්බාධක පැනවීමෙන් පසු පළුදු වූ එක්සත් ජනපදය හා කියුබාව අතර සම්බන්ධතාව යථා තත්වයට පත් කර ගැනීම අරඹා පසුගිය දෙසැම්බර් 17වනදාට වර්ෂයක් සම්පූර්ණ වේ. එම සංවත්සරයට ප්‍රථමයෙන් පසුගිය 14 වන සඳුදා එක්සත් ජනපද ජනාධිපති බැරැක් ඔබාමා ප්‍රකාශයක් කරමින් කියා සිටියේ තත්වයන් නිවැරදි නම් තමා කියුබානු සංචාරයක යෙදෙන බවයි. ඔහු නිවැරදි තත්වයන් ලෙස සඳහන් කර තිබුනේ කියුබාවට පැමිණි පසු තමාට කියුබාවේ ඕනෑම කෙනෙකු මුණගැසීමට අවස්ථාව තිබිය යුතු බව (දේශපාලන සිරකරුවන් හා කියුබානු ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන අය පවා) හා කියුබානු ආණ්ඩුව දැන් ගමන් කරන දිශාව වෙනත් අතකට යොමු කළ හැකි වීමය.

එහෙත් ඒ සමගම එක්සත් ජනපදයට අනතුරු අඟවමින් කියුබාව ප්‍රකාශ කළේ, එක්සත් ජනපදය කිසිවිටෙක කියුබාවේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමට සූදානම් නොවිය යුතු බවය. ඒ අතරම කියුබාව හා එක්සත් ජනපදය අතර සබඳතා යහපත තත්වයට පත්වීමට නම් කියුබානු භූමිය තුළ ඇති



ගුවන්තනාමෝ කඳවුර ඉවත් කළ යුතු බවත් ආර්ථික සම්බාධක මුළුමනින්ම අහෝසි කළ යුතු බවත් කියුබානු පාලනයට එරෙහිව විකාශනය කරනු ලබන ගුවන්විදුලි සේවාව හා රූපවාහිනී සේවාව මහා නවතා දැමීමට එක්සත් ජනපදය කටයුතු කළ යුතු බවත් කියුබාව පවසා සිටී.

මේ අතර කියුබාව එක දිගට 06 වන වසරටත් එරට ළදරු මරණ අනුපාතිකය දරු උපත් 1000ට 05කට අඩුවෙන් තබා ගැනීමට සමත් වී සිටී. එය කැනඩාවේ සහ එකසත් ජනපදයේ ළදරු මරණ අනුපාතිකයට වඩා අඩු අගයකි.

# කියුබාවේ ඇය සහ ලංකාවේ අපි



වත්මන් ආණ්ඩුවේ පාලකයන් විසින් මෙරට මහජන ආයතන වන පළාත් පාලන, පළාත් සභා හා පාර්ලිමේන්තුව සඳහා කාන්තා සහභාගිත්වය 25% දක්වා වැඩි කළ යුතු බවට සාකච්ඡාවක් ගෙන යමින් සිටී. 2016 වසර සඳහා කාන්තාවන් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ එකම අයවැය යෝජනාවද එය විය. ඔවුන් එසේ කරනුයේ කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් යැයි පැවසේ.

වත්මන් මැතිවරණ ඉතිහාසයේ ධනවාදී දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලැබූ අපේක්ෂකයින් දෙස බැලූ විට ඔවුන්ගෙන් බහුතරයක් තෝරාපත් කරගෙන ඇත්තේ වෘත්තීය සුදුසුකම් පසෙක ලා මැතිවරණ සඳහා මුදල් වියදම් කිරීමට ඇති හැකියාව පදනම් කර ගනිමිනි. එනිසා අද වනවිට තේරී පත්වන නියෝජිතයින් ජනතාවට සේවය කිරීම වෙනුවට කුමන නීතිවිරෝධී මාර්ගයකින් හෝ මුදල් එක්රැස් කර ගැනීමේ දේශපාලන සංස්කෘතියක් බිහි වී ඇත.



එසේ එක්රැස් කරගන්නා මුදලින් කොටසක් ඊ ළඟ මැතිවරණයේදී ජනතාවට විවිධ අල්ලස් ලබා දීමටත්, මැර කණ්ඩායම් පවත්වා ගැනීමටත් යොදවති. තමාගේ ප්‍රතිවාදියා කෙසේ හෝ පරාජය කිරීමට ප්‍රචණ්ඩත්වයන් පවා මුදා හැරීමට ඔවුන් පසුබට වන්නේ නැත. තම පක්ෂයේම අපේක්ෂකයන්ටද එය එකසේ අදාළ වන්නේ එබැවිනි.

මුදල් වියදම් කිරීමේ හැකියාව, මැරකම් කිරීමේ හැකියාව, දේශපාලන ඥාතීත්වය වැනි කාරණා මැතිවරණයට ඉදිරිපත්වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයන් බවට පත්ව ඇති තත්වයක් තුළ කාන්තාවන් දේශපාලනයට පැමිණ ඇත්තේ සීමිත සංඛ්‍යාවකි. බොහෝ විට එසේ පැමිණි අතළොස්සද දේශපාලන ඥාතීත්වය මත පදනම් වූවන්ය. පවතින තත්වයන් වෙනස් කිරීමට කිසිදු වැඩපිළිවෙළක් නොමැතිව ගහෙන් ගෙඩි එන්නා සේ මහජන ආයතනවලට කාන්තාවන් තෝරා පත්කර ගැනීමේ ප්‍රමාණය වැඩි කරනවා යැයි කියූ පමණින් කාන්තාවන් එසේ දේශපාලන නායකත්වයට ගෙන ඒමට නොහැකි වනු ඇත.

කාන්තාවන් සවිබල ගැන්වීම යන්නෙන් ප්‍රකාශ වන්නේ දේශපාලන, ආර්ථික හා සමාජීය ක්ෂේත්‍ර තුළ කාන්තාවන්ගේ භූමිකාව වඩාත් සාධනීය මට්ටමකට ගෙන ඒමය. කාන්තාවන් මේ ක්ෂේත්‍ර තුළ ජයග්‍රහණ ලබමින් ඉදිරියට ගොස් ඇති රටවල් අතර කියුබාව සිටින්නේ වඩාත් ඉහළිනි.

කියුබාව තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ඉතා වැදගත් පියවර කිහිපයක්ම ගෙන ඇත. ඔවුන් ලිංගික සමානත්වය ඇති කිරීමට, කාන්තා ශ්‍රම දායකත්වය ඉහළ නැංවීමට, රැකියාවට අමතරව පොදු සමාජීය හා දේශපාලන ක්‍රියාකාරිත්වයන් ඉහළ නැංවීමට ප්‍රතිපත්තිමය වශයෙන් සැලසුම් සකස් කර ඇත.

කියුබාවේ සමාජවාදී විප්ලවයෙන් පසු 1963 අගෝස්තු 23 පිහිටුවා ගත් කියුබන් කාන්තාවන්ගේ සම්මේලනය ඒ සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ හා කරනු ලබන සංවිධානයකි. එහි නායකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ ප්‍රධාන විප්ලවවාදී කාන්තා නායිකාවන්ය. වැඩ කරන කාන්තාවන් නායකත්වයට පත් කිරීම සඳහා ඔවුන් ප්‍රධාන ආයතන 3ක් ස්ථාපිත කරන ලදි. ඉන් පළමුවැන්න කාන්තාවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය වේ. කාන්තාවන් සංවිධාන නායකත්වයට පුහුණු කිරීම හා හැඩගැස්වීම එම ආයතනය පිහිටුවීමේ අරමුණ විය. දෙවැන්න කාන්තාවන් සඳහා වූ අධ්‍යයන මධ්‍යස්ථානය වේ. කාන්තාවන් සඳහා වූ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු එයට පැවරුණු වගකීම් වේ. කාන්තාවන් හා පවුලේ අය සඳහා වූ බහුවිධ උපදේශන මධ්‍යස්ථානය කාන්තාවන් සඳහා පිහිට වූ තෙවන ආයතනයයි. ඒවා නාගරික සභා පදනම් කරගෙන පිහිටුවා ඇත. නාගරික ජන සමූහයන් මත පදනම්ව කාන්තාවන් සහ පවුල තුළ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පවත්වාගෙන යාම හා රෝග නිවාරණ කටයුතු හා සෞඛ්‍යාරක්ෂණ ක්‍රම පිළිබඳ අධ්‍යාපන වැඩසටහන්, නීතිමය හා මානසික උපදේශන ඊට අයත් කාර්යයන් වේ.

අද වන විට කියුබන් පාර්ලිමේන්තුවේ ආසන 612න් ආසන 299ක්ම හිමිකරගෙන ඇත්තේ කාන්තා නියෝජිතයින් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 48.9% කි. තවද අමෙරිකානු අර්ධද්වීපයේ රටවල් අතර කියුබාව දෙවැනි වන්නේ බොලීවියාවට පමණි. ලෝකය තුළ පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන් අතර කියුබාව සිටින්නේ හතර වන ස්ථානයේය. ඒ සමස්ත ලෝකයේම පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තා නියෝජිතයින්ගේ ප්‍රමාණය 22%ක මට්ටමක පවතින තත්වයක් තුළය.

එසේම අද වනවිට වැඩකරන ස්ථානවල පරිපාලන හා නායකත්ව තනතුරු හොබවන කාන්තාවන් 46%කි. සෞඛ්‍ය සේවකයින්ගෙන් කාන්තාවන් 78.5%කි. විද්‍යාත්මක පර්යේෂණ අංශයේ කාන්තාවන් 48%කි. උසස් තාක්ෂණික හා වෘත්තීයවේදී කාන්තාවන් 65.2%කි. උපාධිධාරී කාන්තාවන් 65.2%කි. මෙසේ කියුබාවේ සමාජවාදී විප්ලවයෙන් පසුව දියත් කෙරුණු කෙටි කාලීන හා දීර්ඝකාලීන වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස කියුබාවේ කාන්තාවන් ලබාගත් ජයග්‍රහණ ඉතා විශාලය.

මෙරට ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතන තුළ කාන්තාවන්ගේ දායකත්වය ඉතාම පහළ මට්ටමක පවතින බව සැබෑවකි. එසේ අවම වීමට බලපා ඇති හේතු හඳුනාගෙන ඒවාට ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් කිසිවක් නොමැතිව එකවර කාන්තාවන් දේශපාලන නායකත්වයට ගෙන ඒමට හැකි යැයි මෙරට පාලකයන් සිතන්නේ නම් එය මුග්ධකමකි. නැතහොත් කාන්තාවන් රැවටීමට ගන්නා උත්සාහයකි.

## ජනේරුවේ පැතුම...

කනේරු වැට උඩින් සිනා පිණි කැට විසිරෙන්නේ
රනේ රුවට කමත් පුරා බැත කඳු යාලන්නේ
අනේ අපට කොයි අහසෙද ඉර හඳ පායන්නේ
ජනේරුවට කවදද අපි කිරි පැණි උතුරන්නේ

මත් කොවුලන් හඬලනු මිස වසත් සමය මෙය නොවේ
සත් සමුදුරු ගොඩ ගැලුවත් දුක් ගින්දර නිම නොවේ
වත් පිළිවෙත් පිරුවට තුළ යෙහෙන් කිළිටි වන ලොවේ
තවත් පිටක ලියැවුණාට මේ නව තනුවක් නොවේ

ගෙවුන වසර අලුත් වුණොත් දහක් පැතුම් එක්කයි
දොලොස් මසක් ගෙවී ගියත් ඉෂ්ට වුණේ මක්කයි
අපේ හීන පොදි බැඳගෙන උන් යහමින් වික්කයි
උනුත් එකයි මුනුත් එකයි අපි කලින්ම දැක්කයි

හෙටත් නැගෙන හිරු සුපුරුදු ලෙස බැස යන්නට නොදී
අලුත් වසර නිමවමු අපි නිමකර, දුක් ගිනි විඳී
යළිත් බිඳිනු බැරි විලසට මහ පවුරක් ලෙස සැදී
අපිත් හදමු අලුත් ලොවක් එකිනෙක අත්වැල් බැඳී



උළුවප් සීතල ඇවිදින් අරගෙන
උණුසුම් වසරක්
මැදිහත් වන්නට කාරණා ඇත
අප හට තව දහසක්
මදහස් නඟනා සටනට
තව කුමටද සුබ
නැකතක්
අදහස් කරනෙමු එක් වී
ඔසවන්නට රතු ධජයක්



**කැරොලිනා බ්‍රසීල ජනාධිපතිට...**

**ජනාධිපතියො, උඹ කූඩුවක ඉන්න ගිරවෙක්. ලස්සන ලස්සන කතා කියනවා. ඒත් බඩගින්නෙ ඉන්න මිනිස්සු ව්‍යාඝ්‍රයෝ කියලා හිතාගන්න එක හොඳයි. උන් ඉන්නෙ කෝපයෙන්. අවස්ථාව ආපු ගමන් උන් උඹව ගොදුරු කර ගන්නවා.**

**-කැරොලිනාගේ දිනපොත-**

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2015 දෙසැම්බර් 04

# 'ඇවන්ට් ගාඩ්' දේශපාලනයක් රටේ තහවුරු වෙන්න දෙන්න ඕනෑද?

**විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක සහෝදරයා**
*(රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට එක්වෙමින්)*



මම අවධානය යොමු කරන්න කැමැතියි, ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුව පිළිබඳව. දැන්, නාවික හමුදාව යටතට එහි කාර්ය භාරය පවරා ගන්න ජනාධිපතිවරයා නියෝග යක් නිකුත් කරලා තිබෙනවා. එතකොට නාවික හමුදාව යටතට එම කාර්ය භාරය පවරා ගන්න නම්, ඔවුන්ගේ වැරැද්දක් තිබිය යුතුයි. නැත්නම් පවරා ගන්න බැහැනේ. පවරා ගන්නේ ඒ නිසා. නැත්නම් පවරා ගැනීමක් සිදු කරන්න බැහැ. විශේෂයෙන්ම මා දන්නවා. අවසානයේදී අත්අඩංගුවට ගත් නෞකාව කිසිදු අවසරයකින් තොරව ලංකාවට ඇතුළු වෙන්න ආපු නෞකාවක් බව. එහි Sea Marshalsලා තුන් දෙනෙක් සිටින බවට සහ අවි ආයුධ තුනක් තිබෙන බවට තමයි MoD එක දැනුවත් කරලා තිබුණේ. ඒ වාගේම එහි කපිතාන්වරයා ශ්‍රී ලාංකික කපිතාන්වරයෙක් කියලා දැනුවත් කරලා තිබුණා. ඒකට ඇතුල් වීම සඳහා දරපු උත්සාහය වැළැක්වුවා. නමුත් නාවික හමුදාවේ නිලධාරීන්ගේ ධෛර්යය මත ඒකට ඇතුල් වුණා. ඊට පස්සේ ඒ සියලු අවි ආයුධ පිළිබඳව වාර්තාවක් සකස් කරලා තිබෙනවා. මා දන්නා විධියට ඒ වාර්තාව ලොකු පොතක්. එක් එක් අවිය පිළිබඳව වෙන වෙනම වාර්තා ඒ තුළ තිබෙනවා. එහිදී හඳුනා ගෙන තිබෙනවා. අවි ආයුධ 53ක අංක වෙනස් කොට තිබෙන බව. මා දන්නේ නැහැ. මා පරීක්ෂා කළේ නැහැ. මා කියන්නේ, නාවික හමුදාව විසින් එම අවි ආයුධ පරීක්ෂා කොට බලා ඉදිරිපත් කරලා තිබෙන වාර්තාව අනුවයි. ඒ වාර්තාවේ කරුණු කිහිපයක් පිළිබඳව පැහැදිලිව සඳහන් වෙනවා. එක කාරණයක් තමයි, ඔවුන් අවසර ගෙන තිබුණේ නැහැ කියන එක. ඔවුන් දැනුවත් වී තිබුණේ, Sea Marshals තිදෙනෙක් සිටින බවට සහ අවි ආයුධ තුනක් තිබෙන බවටයි. ඔවුන් දැනුවත් කොට තිබුණේ.

හැබැයි කපිතාන්වරයා ලාංකිකයෙක් නොවෙයි. අත්අඩංගුවට ගත් අවි ආයුධ ප්‍රමාණයෙන් 53කට ආසන්න සංඛ්‍යාවක අංක තහඩු මකා තිබෙන බව ඔවුන් නිරීක්ෂණය කර තිබෙනවා. ඉතින් මේක බරපතළ අපරාධයක් නේ. අංක තහඩු මකා දමන ලද අවි ආයුධ මේ නැවේ තිබෙනවා කියලා නාවික හමුදාව විසින්ම වාර්තා සපයලා කියනවා නම් කොහොමද, කපිතාන්වරයා එළියට යන්නේ? කොහොමද, කාර්ය මණ්ඩලය එළියට යන්නේ? මම දැන ගන්න කැමැතියි, මොන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගිහිල්ලාද කපිතාන්වරයාගෙන් කට උත්තරයක් අරගෙන තිබෙන්නේ කියලා; එහි කාර්ය මණ්ඩලයෙන් කට උත්තරයක් අරගෙන තිබෙන්නේ කියලා. නැවක් ඇතුළේ තිබී මේ වාගේ අවි ආයුධ තොගයක් හසු වුණා නම්, නැව ඇතුළේ තිබුණු අවි ආයුධවල අංක තහඩු මකා තිබෙනවා නම්, සාමාන්‍ය නීතිය අනුව කළ යුතු පළමු කාර්ය භාරය තමයි එහි කපිතාන්වරයාගෙන් කට උත්තරයක් ලබා ගැනීම. මා යෝජනා කරන්නේ නැහැ, ඔහු අත්අඩංගුවට ගන්න කියලා. ඒකත් හොඳ පියවරක්. හැබැයි, පළමුකොටම කටඋත්තරයක් ගන්න ඕනෑ. එහි කාර්ය මණ්ඩලයෙන් කට උත්තරයක් ගන්න ඕනෑ. හැබැයි තවම ඒ කපිතාන්වරයාගෙන් හෝ ඒ කාර්ය මණ්ඩලයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කට උත්තරයක් අරගෙන නැහැ. සාමාන්‍ය පුරවැසියෙකුටත් මේ නීතිය මෙහෙමම බල පැවැත්වෙනවාද? **සාමාන්‍ය පුරවැසියෙක් කම්මලේ හදන පොඩි ගිනි අවියක් ළඟ තබා ගත්තත්, පොලිසිය ඇවිල්ලා ඔහු අත්අඩංගුවට ගන්නවා; කම්මලේ මයිනහම ඇදපු කෙනාත් අත්අඩංගුවට ගන්නවා. මෙන්න මෙහෙමනේ නීතිය ඉටු වන්නේ. "ඔයාද හුළං ඇරියේ?" කියලා කම්මලේ මයින හම අදින කෙනාත් අත් අඩංගුවට ගන්නවා. එහෙම අත්අඩංගුවට ගන්න නීතියක් තිබෙන රටේ ආයුධ 53කට ආසන්න ප්‍රමාණයක අංක තහඩු මකලා තිබෙනවා කියලා, නාවික හමුදාවේ පරීක්ෂා කරන ලද නිලධාරින් වාර්තා කරලා තිබියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කට උත්තරයක් නොගන්නේ ඇයි? ඒකද අපේ** රටේ නීතිය? බලය තිබෙන අයට, මුදල් තිබෙන අයට, අවිය තිබෙන අයට, නීතිය නැද්ද? නීතිය තිබෙන්නේ සාමාන්‍ය ගමේ සිටින අයට විතරක්ද?

> සාමාන්‍ය පුරවැසියෙක් කම්මලේ හදන පොඩි ගිනි අවියක් ළඟ තබා ගත්තත්, පොලිසිය ඇවිල්ලා ඔහු අත්අඩංගුවට ගන්නවා; කම්මලේ මයිනහම ඇදපු කෙනාත් අත් අඩංගුවට ගන්නවා. මෙන්න මෙහෙම නේ නීතිය ඉටු වන්නේ. "ඔයාද හුළං ඇරියේ?" කියලා කම්මලේ මයින හම අදින කෙනාත් අත් අඩංගුවට ගන්නවා. එහෙම අත්අඩංගුවට ගන්න නීතියක් තිබෙන රටේ ආයුධ 53කට ආසන්න ප්‍රමාණයක අංක තහඩු මකලා තිබෙනවා කියලා, නාවික හමුදාවේ පරීක්ෂා කරන ලද නිලධාරින් වාර්තා කරලා තිබියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කට උත්තරයක් නොගන්නේ ඇයි? ඒකද අපේ රටේ නීතිය? බලය තිබෙන අයට, මුදල් තිබෙන අයට, අවිය තිබෙන අයට, නීතිය නැද්ද?

එන නිසා මෙම නීතියේ සාධාරණත්වය හැදෙන්න ඕන, මම නැවත නැවතත් කියන්නේ මේකේ ගනුදෙනු ගොඩක් තිබෙන අතර, මෙම අවසන් ගනුදෙනුවේදී; අවසන් සිදුවීමේ දී ඉතා පැහැදිලිව දක්ෂිණ අනුබණ්ඩය භාරව හිටපු ඒ නාවික හමුදාවේ නිලධාරීන්ට අප ස්තුතිවන්ත වෙනවා. ඔවුන්ට ධෛර්යයක් තිබුණා. ඔවුන් බාධාවන් මැඩ පැවැත්වීම සඳහා විවිධ උපක්‍රම යෙදුවා. ඒ උපක්‍රම හරහා තමයි ඔවුන් ඒ නැවට ගොඩ වුණේ සාමාන්‍ය ක්‍රියාදාමයට අනුව ඔවුන් එම නැවට ගොඩ වෙන්න උත්සාහ කළානම්, ඔවුන්ට ගොඩ වෙන්න බැහැ. ඔවුන් ගොඩ වීම වළක්වනවා. ගොඩ වීම වැළැක්වීම සඳහා බාධාවන් හදනවා. හැබැයි, විවිධ උපක්‍රම හරහා තමයි ඔවුන් එම නැවට ගොඩ වී ඒවා පරීක්ෂා කරන්න අවස්ථාව ලබා ගත්තේ. වාර්තාව ඇවිත් තිබෙනවා. මා දන්නා විධියට ජනාධිපතිතුමාට එම වාර්තාව පෙන්වා තිබෙනවා. එදා ඇති වූ සාකච්ඡාවේදී එතුමාට එය ලබා දුන්නා ද කියලා මා දන්නේ නැහැ. නමුත්, වාර්තාවක් තිබෙනවා. එක හරිම පැහැදිලියි.

මේ ආකාරයෙන් අවි ආයුධ 53කට ආසන්න ප්‍රමාණයක අංක තහඩු මකලා තිබෙනවා කියලා නාවික හමුදාපතිවරයා විසින් ජනාධිපතිවරයාට වාර්තා කර තිබෙනවා නම්, අපි කාටද තව කියන්නේ? මේ රටේ සිටින අප නීතියේ සහ යුක්තියේ සාධාරණත්වය ඉල්ලා බලාගෙන ඉන්නේ කවුරු දෙසද? ජනාධිපතිවරයා ගාවටත් ගොස් තිබෙනවා නම්, අමාත්‍යවරු ගාවටත් ගොස් තිබෙනවා නම්, යුක්තිය හා සාධාරණත්වය ඉල්ලලා කවුරු දෙස ද අපි බලාගෙන ඉන්න ඕනෑ. මීට වඩා ඉල්ලන්න තැනක් නැහැ. පිටසක්වල ඉන්න දෙවියන්ගෙන් ඉල්ලන්නද? 15වැනි පිටුවට

2015 දෙසැම්බර් 04

# යෝෂිතට එරෙහි පරීක්ෂණේට මොකද වුණේ?

**පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා**
*((ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)*



දැන් මේ දෙසැම්බර් 9වනදා වන කොට ශ්‍රී ලංකා නාවික හමුදාවට අවුරුදු 65ක් පිරෙනවා. සාමාන්‍යයෙන් නාවික හමුදාවට බඳවා ගැනීමේදී , විශේෂයෙන්ම commissioned officersලා ගන්න කොට විශ්වවිද්‍යාල උපාධියක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් අපේක්ෂා කරනවා. ඒ වාගේම cadet නිලධාරීන් බඳවා ගන්න කොට එක්කෝ කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය හරහා හෝ එහෙම නැත්නම් සාමාන්‍ය බඳවා ගැනීමේ පරිපාටිය හරහා තමයි මේක සිද්ධ වෙන්නේ. සාමාන්‍යයෙන් නාවික හමුදාව ගැන දන්නා කවුරුත් දන්නවා, එහි විවිධ අංශ තිබෙන බව. නීති අංශය වෙන්න පුළුවන්. සැපයුම් අංශය වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඉංජිනේරු අංශය වෙන්න පුළුවන්. ඒ සියලු අංශ අතරින් විධායක අංශයට - executive branch - ප්‍රමුඛතාවක් හිමිවනවා. මොකද, යාත්‍රාවක් මුහුදට දැම්මාට පස්සේ ඒ යාත්‍රාවේ සම්පූර්ණ වගකීම පැවරෙන්නේ executive branch එකට. ඒ නිසා executive branch එකට බඳවා ගැනීමේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ගණිත හෝ විද්‍යා විෂය ධාරාවන් කර තිබීම අනිවාර්යයි. එසේ ඉල්ලන්නේ ඒ කාර්ය සඳහා භෞතික විද්‍යා දැනුම ඕනෑ, නැවේ ගමන් මගෙහි දිශානතිය තීන්දු කරන්න. ඒ වාගේම ප්‍රහාර එල්ල කරනවා නම් ඒ දිශානතිය බලන්න. ඒ වාගේම එහි තිබෙන සමහර engine කොටස් සම්බන්ධයෙන් භෞතික විද්‍යා දැනුමක් ඕනෑ කරනවා. නාවික හමුදාවේ විධායක අංශයට කොච්චර තැනක් තිබෙනවාද කියනවා නම්, මා දන්නා හැටියට නාවික හමුදාපතිවරුන් බොහොමයක් - සියලු දෙනාම වාගේ - පත් වුණේ මේ විධායක අංශය හරහායි.

මා අතේ තිබෙනවා ශ්‍රී ලංකා නාවික හමුදාවට ශිෂ්‍ය භට නිලධාරින් බඳවා ගන්න 2006 ඔක්තෝබර් 15වැනිදා " සිළුමිණ" සහ "Daily News" පත්තරවල පළ කළ දැන්වීමක්. ඒ සඳහා අධ්‍යාපන සුදුසුකම් ඉල්ලා තිබෙන විධිය මා සඳහන් කරන්නම්.

සැපයුම් අංශය සඳහා බඳවා ගන්න වාණිජ විෂය ධාරාව හැදෑරීම, ඉංජිනේරු අංශය බඳවා ගන්න භෞතික විද්‍යා විසය ධාරාව හැදෑරීම, විධායක හා නාවික සෙබළ අංශය සඳහා බඳවා ගන්න විද්‍යා, වාණිජ හෝ කලා විෂය ධාරාවන් හදාරා තිබීම සහ අපොස සාමාන්‍ය පෙළ විභාගය එකවර සම්මාන සාමාර්ථ 06ක් සහිතව සමත් වෙලා තියෙන්න ඕනෑ.

දැන් මේ advertisement එකේ තිබෙනවා. පොඩි වහලා ගැහැල්ලක්. මොකක්ද? සාමාන්‍යයෙන් විධායක අංශයට සහ නාවික සෙබළ අංශයට බඳවා ගන්න කොට එකම සුදුසුකම් ඉල්ලන්නේ නැහැ. මෙතැනදී විද්‍යාව, වාණිජ හෝ කලා කියන තුනම සඳහන් කරලා Executive branch එකයි, naval patrol එකයි දෙකම එකට දාලා දැන්වීම පළ කර තිබෙන්නේ හොර පාරෙන් ගහන්නයි. මොකක්ද සිද්ධ වුණේ?

මේ දැන්වීම අනුව, හිටපු ජනාධිපතිවරයාගේ දැන් කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ දෙවන පුත් යෝෂිත රාජපක්ෂ නාවික හමුදාවට ඇතුළත් වුණා. ඔහුගේ අංකය NRX2431. කොහොමද ඔහු නාවික හමුදාවට ඇතුළත් වෙන්නේ? මේ සුදුසුකම් ඔහුට තිබුණාද? මා බොහොම වගකීමෙන් කියන්නේ. **ඔහු අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් එකවර වැඩ 06ක් සමත් නැහැ. O/L එකවර වැඩ 06ක් සමත් නැහැ. කවර කථාද A/L ගැන. ඔහු කලා විෂය ධාරාවෙනුයි උසස් පෙළ කරලා තිබුණේ. ඔහුට ඇතුළත් වීම සඳහා තමයි මේ advertisement එක වෙනස් කළේ. විධායක අංශයට බඳවා ගන්න කොට කවදාවත් physics හැර වෙන දෙයක් ඉල්ලන්නේ නැහැ. මේකෙදී කොළේ වහලා ගැහුවා.** විතරක් නොවෙයි. මෙහෙම සුදුසුකම් අඩු කරලත් ඒ සුදුසුකම් සපුරා ගන්න බැරි වුණා. O/L වැඩ 06ක් එකවර සමත් වෙන්න බැරි වුණා. නමුත් ඔහුව නාවික හමුදාවට ඇතුළත් කර ගත්තා. ත්‍රිකුණාමලය නාවික හමුදා පුහුණු විද්‍යාලයේ පුහුණුවට ඇතුළත් වුණා. දවස් කීයක් හිටියා ද? හමුදාවට තරුණයින් ඇතුළත් වෙන්නේ නැහැ. ඒ අයගේ චිත්ත ධෛර්ය හදන්න ඕනෑයි කියලා පත්තරේ දැන්වීම් දාලා ඇතුළත් වුණු යෝෂිත රාජපක්ෂ දවස් කීයක් ත්‍රිකුණාමලය නාවික හමුදා පුහුණු විද්‍යාලයේ පුහුණුවක් ලැබුවාද? දවස් 20යි.

> ඒ කාලයේ රුසියාවේ තානාපතිවරයා උදයංග වීරතුංග. ඔහු ආරක්ෂක අමාත්‍යාංශයට ලියුමක් එවනවා. යුක්රේනයේ ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාඨමාලාවකට අපේ ආරක්ෂක හමුදාවේ ඉන්න කවර හෝ සුදුස්සෙක් එවන්න කියලා. ආරක්ෂක අමාත්‍යාංශය හැරෙන තැපෑලෙන් යෝෂිත තෝරා යවනවා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පුංචි අම්මාගේ පුතා එහෙන් ලියුමක් එවනවා, මහින්ද මහත්තයාගේ මල්ලී වන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට, ඒ පාඨමාලාවට. ඒ පාඨමාලාවට යෝෂිත තෝරලා ඔහු අත්සන් කරලා යවනවා. කොහොමද තෝරා ගත්තේ?

දවස් 20කට පස්සේ ඒ කණ්ඩායමේ Best Cadet කියලා ඔහුට දුන්නා එංගලන්තයේ ඩාර්ට්මවුත්වල නාවික පුහුණු academy එකට යන්න අවස්ථාවක්. අපේ රටේ නාවික හමුදාවට බැඳෙන සෙබළුන්ට ලැබෙන අතිවිශේෂ වරප්‍රසාදයක් ඒක. දක්ෂතමයන්ට තමයි, best cadetට තමයි ඩාර්ට්මවුත්වල Royal Naval Academy එකේ පුහුණුවට යන්න අවස්ථාව ලැබෙන්නේ. සාමාන්‍යයෙන් cadet training එකේ මාස 09ක් ගියාට පස්සේ ඒකේ ඉන්න හොඳම කෙනා තෝරලායි ඒකට යවන්නේ. නමුත් යෝෂිත රාජපක්ෂ යැව්වා. 2007 ජනවාරි ඉඳලා ඒ අවුරුද්දම එයා එහේ; ඩාර්ට්මවුත්වල. දැන් අපට කියනවා, තරුණයන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කරන්න හමුදාවට බැඳෙව්වා කියලා. දවස් 20යි ලංකාවේ හිටියේ. මාස 20ක් එංගලන්තයේ. මෙහෙම යවනවා නම් කොයි අම්මා, තාත්තා වුණත් තමන්ගේ පුතා හමුදාවට යවාවිනේ. ඇයි ඒ? දවස් 20ක් මෙහේ. මාස 20ක් එංගලන්තයේ. ඒකට වියදම් කළ මුදල කොච්චරද? ඒකට ආණ්ඩුවෙන් වියදම් කළා, රුපියල් ලක්ෂ 63ක්.

මේ අවස්ථාව ලැබෙන්න තිබුණේ කාටද? ඒ කණ්ඩායමේ හිටියා, අනුරාධපුරයේ දක්ෂ තරුණයෙක්. නාවික සෙබළෙක්. ඔහුට ලැබෙන්න තිබුණු අවස්ථාව. මා අහනවා, ආරක්ෂක අමාත්‍යාංශයෙන්, මා අහනවා නාවික හමුදාවෙන් මෙකට යෝෂිත රාජපක්ෂ තෝරා ගත්තේ කොහොමද කියලා. මොකක්ද පදනම? කොහොමද ලකුණු ලැබුණේ? කිසිම දෙයක් නැහැ. දවස් 20න් ඔහුව යැව්වා. ඒ විතරක් නොවෙයි, 2007 දෙසැම්බර් 07 වැනිදා ඒ පාඨමාලාව අවසන් කළා. ලංකාවට 15වැනි පිටුවට

## කවුළුව හැරම් තබමි

# හැපි නිව් ඉයර්...

පඩි වදන්, ව්‍යාජ සුභාසිංශන ඇතුළු මෙකී නොකී සුපුරුදු කුණු කන්දල්ද සමග නව වසරක් උදා විය. නව පැතුම්, නැවුම් බලාපොරොත්තු, නව මාවත් මේ අවුරුද්ද ආරම්භයේදීත් දෝරෙ ගලා ගියේය. සංකල්ප සහ මිනිස් ගැටලු වෙළඳාම් කරන FM නාලිකාවලින්, ටී.වී චැනල්වලින් තොරතෝංචියක් නැතුව අපේ මැද සාලයටම අර පෙර කී ව්‍යාජ දෑ ඇති පදම් ගෙන ආවෝය.

මොනතරම් අලුත් දේවල්, අලුත් බලාපොරොත්තු, අලුත් පැතුම් ගැන හැම අවුරුද්දක් ආරම්භයේදීම අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල උදවිය කථා කළද, ප්‍රාර්ථනා කළද රටක් සහ පුරවැසියන් හැටියට අපි අවුරුද්දක් පාසාම නාරා වළ කරා ඇදෙනු විනා මිනිස් කෙතක් කරා ඇදෙන බවක් නම් දක්නට නැත. පරණ කුණු කන්දල් සහ දහජරාවලින් බිඳක් හෝ අපේ හිස් මතින් ඉවත ලෑමට අපි ගෙවා දැමූ කිසිම අවුරුද්දකදී හෝ අපි සමත්වීද?




දත්වලින් බොරු සිනහව පා බොරුවට සුභපතා හදවතින් යක් පැතුම් පතන සමාජයක ජීවත්වන අපි ගෙවී ගිය හැම අලුත් අවුරුද්දකදීම සමාජයක් හැටියට අත්පත්කරගත් මානුෂීය ජයග්‍රහණ මොනවාද? එසේ උසස් මානුෂීය ජයග්‍රහණ සමාජයක් හැටියට අත්පත් කරගැනීමේ අදිටනින්ද අපි හැම අලුත් අවුරුද්දකටම පා තැබුවේ.

ටොන් ගණන් සුභපැතුම්වලට වඩා මානුෂීය සාරයේ අංශුවක් වටනේය. හැම අලුත් අවුරුද්දකටම වරක් ඔළු පරණ වන සමාජයකට යන එනමං නැත. අලුත් අවුරුද්දත් සමග තමන්ගේ ඔළුද අලුත් කරගන්නා මිනිසුන්ට ජයවේවා.

# අන්ලිමිටඩ් ජෝක්ස් ....



විවිධ මුද්‍රිත හා ඉලෙක්ට්‍රෝනික මාධ්‍ය තුළත් ඕනෑවටත් වඩා පිම්බෙන්න දඟලන බොහෝ උදවිය අවසානයේ ඒවා තුළ කටේ දමා හැපිය හැකි චුයින්ගමයක් බවට, ටැබ්ලොයිඩ් කරණයට, සංක්ෂිප්තකරණයට, අතිසරුකරණයට ලක්වී අවසානයේ තනිකරම ජෝකරයෝ බවට පත්වෙති.

මේ රටේ ප්‍රසිද්ධ සිවිල් චරිත දැන් විවිධ ව්‍යායාම්වල යෙදෙති. යෝගී ව්‍යායාමද ඒ අතර එකකි. පසුගිය කාලයේ ඉන්දියාවේ අගමැති මෝඩිගේ යෝගී ව්‍යායාම්වලට ලොවපුරා ප්‍රසිද්ධියක් ලබාදෙන ලදී.

ප්‍රසිද්ධ සිවිල් චරිත පමණක් නොව දැන් රටේ බොහෝ පුරවැසියෝද ව්‍යායාම්වල යෙදෙති. එහි කිසිදු වරදක් නැත. තම ශරීරයේ සහ මොළයේ ක්‍රියාකාරීත්වය යථා පරිදි පවත්වාගෙන යාමට මිනිස්සු ව්‍යායාම් කිරීම අපට ප්‍රශ්ණයක් නොවේ. එහෙත් යමෙකු දිනෙන් දින ක්ෂය වී යන තම කීර්ති කදම්භය රැකගැනීම සඳහා විවිධ වර්ගයේ මාධ්‍ය සංදර්ශන පැවැත්වීම හා හැබෑවටම ව්‍යායාම්වල යෙදීම යනු දෙකකි.

ශාරීරික ව්‍යායාම්වල යෙදෙන්නෙකු තම බිඳවැටෙමින් පවතින ප්‍රතිරූපය රැකගැනීම සඳහා ව්‍යායාමයක එල්ලී සිටී නම් එතන ඇත්තේ තනිකරම ජෝක් එකකි. ඒ පුද්ගලයා රටේ හිටපු පාලකයකු වූ කලී එය ඊටත් වඩා ජෝක් එකකි.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ යනු මාධ්‍ය රඟ මඩල තුල ප්‍රසිද්ධ නළුවෙකු බව රටම දනී. දැන් එම රඟ මඩලේ ඔහුගේ භූමිකාව හිස්වෙමින් පවතී. අප රටේ බොහෝ දක්ෂ නළුවන් තම ජනප්‍රියතාවය හීන වන විට තෝරා ගන්නේ ජෝකරයාගේ පාට් එකය. මහරාජ රාජපක්ෂටද දැන් සිදු වී ඇත්තේ එයමය. ඔහු ඉනවටා බැඳගත් කඹයක එල්ලී ඔළුවෙන් හිටගෙන යෝගී ව්‍යායාමයක යෙදෙන අන්දම පිළිබඳ ඡායාරූපයක් පහුගිය දිනවල පුවත්පත්වල පළවී තිබුණි. ඒ ගැන ඔහු පසුව පවසා තිබුනේ "බලන්නකො මං දන්නෙවත් නැනෙ. මේක අපේ නාමල් කොලුවගෙ වැඩක්නෙ. මේකා මාව කෑවනෙ" කියාය. එතනදී මහින්ද බබා වී නාමල් කොලුවා විය. ඒ විතරක් නොව මහින්ද නැවත වරක් ඔප්පු කර සිටියේ, තම ව්‍යාජ ප්‍රතිරූපය රැක ගැනීම සඳහා තම පුත්‍රයා වුවද පාවාදීමට ඔහු පසුබට නොවන බවය. එකක් කිව යුතුය. දෙපයින් හිටගෙන කරගත නොහැකි වූ දේ ඔළුවෙන් හිටගෙන මහින්දලාට කෙසේවත් කරගත නොහැක. අනෙක් අතට ජනතාව ඔළුවෙන් සිටවනවාට වඩා මොළය අදාළ තැනට එනතෙක් මහින්දලාම ඔළුවෙන් සිටගෙන සිටීම රටට හොඳය.

# සුපර් හියුමන්ස්

ඔබව අන්දවා ඔබ වෙනුවෙන් පෙනී සිටින බව පෙන්වන ධනපති දේශපාලකයා ඔබට දෙන්නේ දියහැකි ලොකුම ලණුවය. එය නොගිලීම ඔබේ වගකීමය. ඒ අනුව බලනවිට සයනයිඩ් කරල  වඩා අහිංසකය.

මේ ප්‍රෝඩාකාරී දේශපාලුවන්ට ඔවුන්ගේ 'අභිලාෂය' ජනතාවගේ අභිලාෂය බවට පත්කරන්නට වැයවන්නේ තඩි  වාක්‍ය කිහිපයක් පමණි.

ලංකාවේ රාජ්‍ය ආයතන පමණක් නොව එම රාජ්‍ය ආයතන හසුරුවන දේශපාලකයන්ගෙන් බහුතරයද දූෂිතයන්ය. එනයින් ගත්කළ ඔවුන්ගේ රජදහන වන පාර්ලිමේන්තුවද දූෂිතය. ඉදින් එවන් දූෂිතයන් රටේ සිදු වූ සහ සිදුවන විවිධාකාර දූෂණයන්ට එරෙහිව දූෂණ විරෝධී පා ගමන් යාම කොතරම් සිනහ උපදවන විහිළුවක්ද?

අප මෙහෙම අසන්නේ පසුගිය දිනෙක ආණ්ඩුවේම දේශපාලකයෝ පිරිසක් රටේ දූෂණයන්ට එරෙහිව දූෂණ විරෝධී පා ගමනක් සහ උද්ඝෝෂණයක් පැවත්වීම පිළිබඳ ප්‍රවෘත්තියක් මාධ්‍යවල ප්‍රචාරය වූ නිසාය. ඊට රාජපක්ෂ නඩයේ දේශපාලුවන් කිහිපදෙනෙක්ද එක් වී සිටි බව දකිනවිට සිනහව සමග ඔක්කාරයද ඇතිවේ. මේ නොමිනිස් කැළ රැ



වටීමට දඟලන්නේ මේ රටේ මිනිසුන්වය. මෙය හරියටම "පික් පොකට් ගැසූ හොරාම ඔන්න හොරෙක් අල්ලපියව්" යනුවෙන් දිවයෑමට සමානය. එහිදී ඔහු මිනිසුන්ට පෙන්වන්නට හදන්නේ හොරා තමා නොව තමා හොරා අල්ලන්නට යන එකෙක් යන්නය. ඊට රැවටෙන මිනිසුන් හොරාද තමාගේ ගොඩේම එකෙක් ලෙස භාර ගනිති.

ලංකාවේ හුදී ජනයා රැවටීමට කළ යුත්තේ සරල කාරණා කිහිපයක් බව කපටි දේශපාලකයා දනී. හොරු හොරකමට විරුද්ධව පෙනී සිටීමද එවැනි සරල කරුණකි. සරල දෙයින් රැවටිය හැකි ජනතාවක් නිසරු බවින් මුදාගැනීම හරිම අසීරුය. මේ විශ්මිත රටේ කපටි දේශපාලකයින් විසින් කිසිදු අභියෝගයකින් තොරව දෙන 'ගේම්'වලින් සනාථ වනුයේ එයය.

## පොලිටිකල් පංතිය

ළමයි පංතියට එනකොට පොලිටික්ක හිස්ටීරියාවත් එක්ක දොර ගාව කදේ දාගෙන මාර සීන් කෝන් එකක් ගැන කියවනව. ළමයි එකා දෙන්නා "ගුඩ් මෝනිං" කියාගෙන පංතියට රිංගනව. ඒත් දෙන්නට නිනව්වක් නෑ. පොලිටික්ක රහ කර කර කියනවා. හිස්ටීරියාව ලේන්සුවෙන් කට තදකරගෙන හිනාවෙනව.

"මොකද්ද සර් කේස් එක?" චමියා පොලිටික්කගෙ කතාවෙ හිස්තැනක් බලල එබුවෙ සෑහෙන වෙලාවක් බලං ඉඳල.

"ඉන්නකො ළමයො, මං කියන්නම්..." පොලික්ක චමියට රැව්ව. "... ඉතින් ටීචර් ඔන්න ඔහොමයි යහපාලනේ රෙද්ද පල්ලෙන් බේරෙනව." පොලික්ක සද්දෙට කතාව නැවැත්තුවෙ තවත් මොන මොනවද කුටු කටු ගාල.

"ඔය ළමයි දන්නවද බ්‍රාෂෝ එක ගැන." පොලිටික්කගෙ ඇස් දෙක නළලෙ.

"බ්‍රාසෝ කියන්නෙ පිත්තල බඩු පොලිෂ් කරන ඒවට නේද සර්?" වසන්තිය බැලුවෙ කවුරුත් නොදන්න දේකට එක දාගන්න.

"බම්බුව තමයි..." පොලිටික්ක ණයට ගත්තේ මෛත්‍රී මහත්තයගෙ පරණ වචනයක්. "මේක බ්‍රා... ෂෝ එකක්."

"එහෙනම් සර්..." මොකද්ද කියන්න කට ඇරලා "...අනේ දන්නෑ සර්." කියපු එකට පංතියට හිනා ගියේ ඇයි කියලා අනුරුද්ධියට තේරුණේ නැහැ.

"ඔය ළමයි නොදැන ඉන්න විදිහක් නෑ." පොලිටික්ක පංතිය දිහා බැලුවෙ ඇල්ප්ස් කඳුවැටියට නැග්ග නැපෝලියන් වගේ.

"මොකද්ද සර්, තුන් තේරවිල්ලක්ද?" කනියට ප්‍රෙහේලිකා පෙන්නන්න බෑ.

"තුන් තේරවිල්ලක් නෙමෙයි, මං කිවුවෙ අමුවටම... අමු හිංහලෙන්." කවදාවත් නැතුව පොලිටික්කගෙ කට කනේ. කන සාක්කුවෙ.

"නැහැ කිවුවට සර් කියපු විදිහට ඒක තේරවිල්ලක් තමයි." සමන පොලිටික්කගෙ මූඩ් ෆික්ස් කළා. "බ්‍රා නම් බෙෂියර්. බෙෂියර්  නම් තනපට. ෂෝ නම් ප්‍රසංගය. ඔය කියන්නෙ කොළඹ තිබ්බ එන්රිකේ ඉග්ලිසියාෂ්ගේ මියුසිකල් ෂෝ එක ගැන. එතනදි ලංකාවෙ කෙල්ලෙක් තමන්ගෙ බ්‍රෙෂියර් එක ගායකයගෙ අතට විසිකරපු සිද්ධිය." සමන අවස්ථා සම්බන්ධය ලෙහුව.

"අන්න හරි ඔය තියෙන්නෙ. බලන්න අපේ සංස්කෘතිය දැන් බල්ලට ගිහින්." පොලිටික්ක තේරුම් කරවන්න හැදුව.

"ඇයි සර් දැන් බල්ලට ගිහින් කිවුවෙ." චමිය හැදුවෙ කොක්කක් පටලගන්න. "කලින් හොඳට තිබුණද?"

"දැන් නේන්නම්. මහින්ද මහත්තයගෙ කාලෙ ඕව තිබ්බද? එහෙම වුණානම් බලන්න තිබුණා ෂෝසාව" පොලිටික්ක පැහැදිලි කරනව.

"ඇයි මහින්ද මහත්තගෙ කාලෙ නේද හික්ක ෂෝ එක තිබ්බේ. අර ප්‍රසිද්ධියෙ නිරුවත් නැටුම් තිබුණෙ... හික්කඩුවෙ." සමන මතකය අලුත් කළා. "තංගල්ල හිටපු නගරාධිපති නත්තල් සැමරුවෙ රුසියන් කාන්තාවක් දූෂණය කරලා, සුද්දෙක් මරලා. අකුරැස්ස හිටපු ප්‍රාදේශීය සභා සභාපති සිය ගාණක් ළමයි දූෂණය කළේ. මේ යන්නෙත් ඒ ගමනම තමයි."

"නාමල් බේබිල ගර්ල්ස් ස්කූල්වලට පැනලා නටන්න හැදුව නේද ..." කනියටත් මතක් වෙන දේවල්.

"නෑ සමන් මෙතන වෙනස්...මේ යහපාලනේ ඇතුළෙ මේ වගේ වැඩ වෙනකොට..." පොලිටික්ක ඇක්සිඩන්ට් එක බේරන්න එහෙට කපනවා, මෙහෙට කපනව. වෙරිකාරයෙක් වගේ.

"වෙනසක් නෑ සර්. කලින් තනි පාලනේ. මේක හවුල් පාලනේ. කෝච්චිය මාරු වුණාට, ඩ්‍රයිවර්ල මාරු වුණාට පීල්ල එකයි. මහින්ද මහත්තයා 'මතට තිත' කියල තිතට මත දුන්නෙ. ඒ වගේම තමයි 'යහපාලනේ' කියල කිවුවට හොරු රකිනවා, මිනීමරුවො නිදැල්ලෙ. සුදු වෑන් වෙනුවට කළු ඩිෆෙන්ඩර්වලින් නීතිය රකින්න හදනව... ජාවාරම්කාරයින්ට බදු සහන, ගොවියො, කම්කරුවො ශිෂ්‍යයො මහ පාරෙ. ඉතින් සංස්කෘතිය විතරක් බේරෙයිද?... කඩ දෙකේම බඩු එක්ස්පයර්" සමනගෙ කතාව අතරෙ පොලිටික්ක වැරදිච්ච අහස් කූරක් වගේ පුටුවට කඩා වැටුණ.

## 05 පිටුවෙන් ජනවාරි 8 ...



තමන්ගේ බලයේ දෘෂ්ටිකෝණයෙන් මේ දෙස බලන නිසා දැන් අවුලක් නිර්මාණය වී තිබේ.

ඉදිරියේ ආණ්ඩුව ගෙන ඒමට උත්සාහ කරන නව ව්‍යවස්ථාව සකස්කිරීමේදී ද මෙම ප්‍රතිවිරෝධයන් බලපානු ඇත. මේ අනුව ආණ්ඩුවේ බොහෝ ක්‍රියාමාර්ග දැන් තීරණය වන්නේ, රටේ වුවමනාවන්ට හෝ ජනතාවගේ අවශ්‍යතාවයන්ට අනුව නොව මෙම දේශපාලන කණ්ඩායම්වල බල තරඟයේ බල වුවමනාවන්ට අනුවය. ආණ්ඩුවේ අර්බුදයත් එසේම පැවැත්මත් මෙම බල තරඟය හා ප්‍රතිවිරෝධතා මත පවතින බව පෙනෙන්නේ මේ අනුවය.

කෙසේ වෙතත් ඉදිරි වසර කීපය තුළ ආණ්ඩුවේ අර්බුදයත් ඉන් ජනතාව පීඩාවට පත්වීමත් පීඩාවට පත්වන ජනකණ්ඩායම් ඊට එරෙහි අරගල කිරීමත් වැළැක්විය නොහැකිය. එහිදී එක් අතකින් ලංකාවේ ධනපති කණ්ඩායම් දෙකම සාපේක්ෂකව දුර්වලය. එසේම ඔවුහු දෙපිරිසම එකට ආණ්ඩුවේ සිටිති. ඒ නිසා ආණ්ඩුව කෙරෙහි කලකිරෙන ජනයා පෙරදී මෙන් රවටා ගැනීමට දැන් ධනපති දේශපාලනයේ පක්ෂයක් නැත. දෙකම එකට ආණ්ඩුවේය. රාජපක්ෂ කණ්ඩායම එළියේ සිටියද ඉදිරි කාලය තුළ ඔවුන්ගේ පැවැත්ම පිළිබඳ අනාවැකි කිව නොහැක. ඔවුන් හීලෑකිරීමේ මන්තර එ.ජා.ප. සතුව පවතී. ඒ, ඔවුන් මූල්‍ය අපරාධවලට සම්බන්ධව සිටීමය. වීරවංශ මන්ත්‍රීවරයා මුළු අයවැය කාලය පුරාම රටින් පිටව සිටීම සරල හෝ අහම්බ කරුණක් නොවන්නේ මේ තත්වය තුළය.

මේ සියලු සාධක විසින් නිර්මාණය කරන හෙට දවසේ දේශපාලනය තුළ ජනතා බලවේගවලට නායකත්වය දීමේ හා ආණ්ඩුවට විකල්ප බලයක් බවට පත්වීමේ හැකියාව ඇත්තේ වමටය. ධනපති ආණ්ඩුවට විකල්ප ලෙස තවත් ධනපති පක්ෂයක් වෙනුවට දැන් ධනපති ආණ්ඩුවට එරෙහිව වමේ විකල්ප බලයකට ඉඩ විවර වෙමින් තිබේ. එම ඉඩ හා අවස්ථාව අත්පත් කරගැනීම සඳහා විශාල ජනතා බලවේගයක් ගොඩනැගීමට නායකත්වය ගෙන කටයුතු කිරීම සැබෑ වමේ ව්‍යාපාරයේ වගකීම වී තිබේ.

## 09 පිටුවෙන් 2015 අයවැය...

පැවැති ජනතාවට බර පටවා ආදායම ඉපයීමෙන් යැපෙන ක්‍රමවේදය වෙනුවට ඊට වඩා ජනතාවාදී කිසිදු යෝජනාවක් නැති අයවැය රට පුරා ජනතාවගේ විරෝධය පමණක් අවුලවා උද්ඝෝෂණ රැල්ලක් හදා අවසන් විය. අයවැය ජනතාවට සහන වෙනුවට අසහන බෙදා දී ඇත. ධනපති ආණ්ඩුව තවත් වරක් අයවැය මගින්ද ඔප්පු කර ඇත්තේ, වෙන් වෙන්ව මෙන්ම හවුලේද කළ හැක්කේ ජනතාව පීඩනය පත් කිරීම මිස ජනතාවට සහන සැලසීම නොවන බවය.

## අවසන් පිටුවෙන් පුංචි ඡන්දය...

පාර්ශවවලට විවිධ දේශපාලන අරමුණු තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ඇතුළු කණ්ඩායමට වුවමනා වෙලා තියෙනවා අලුත් ක්‍රමයට ඡන්දය තියන්න. නමුත් එජාපය පැරණි ක්‍රමයට කැමතියි. අලුත් ඡන්ද ක්‍රමය කියන්නේ රාජපක්ෂ මහත්තයා බලයේ ඉන්න වෙලාවේ ඔවුන්ට වාසි වෙන්න ගෙනාපු ඡන්ද ක්‍රමයක්. කොට්ඨාශ ක්‍රමය හා සමානුපාතික ඡන්ද ක්‍රමය මිශ්‍ර කරලා ඒක සකස් කරලා තියෙනවා. මහින්ද රාජපක්ෂලා බලය පාවිච්චි කරලා තමන්ට වාසි වෙන විදියට කොට්ඨාශ නීර්ණය කළා. ඒ කොට්ඨාශ නීර්ණයේ ගැටලු ගණනාවක් තියෙනවා. ඒ නිසා දෝෂ සෙවීමට කොමිසමක් පත්කළා. එම කොට්ඨාශ නීර්ණයේ විද්‍යාත්මක පදනමක් නැති බවත් දෝෂ ගණනාවක් තිබෙන බවත් කොමිසම පිළිගත්තා.

ඒ නිසා කොට්ඨාශ නීර්ණයට අලුත් කොමිසමක් පත් කළ යුතුව තිබෙනවා. ඒ වගේම පළාත් පාලන පනතේ අඩුපාඩු ගණනාවක් තිබෙනවා. ඒවා නිවැරදි කරන්න සංශෝධන ගේන්න ඕනෑ. මෙම ගැටලු නිරාකරණය කර ගත යුතුයි. නමුත් මෙම අලුත් ක්‍රමයේ දෝෂ නිසා ඡන්දය කල් දැමීම සුදුසු නැහැ. මේ වනවිටත් මහජන නියෝජිතයින් නොමැති පළාත් පාලන ආයතන 300කට අධික ප්‍රමාණයක් තිබෙනවා. මන්ත්‍රීවරු සිටිද්දී පළාත් පාලන ආයතන කල් දැමීම ප්‍රශ්නයක් නැති වෙන්න පුළුවන්. මන්ත්‍රීවරුන් නොමැතිව තිබියදී පළාත් පාලන මැතිවරණ පැවැත්වීම කල් දැමීමෙන් ජනතාවට සිදු වන අසාධාරණයට උත්තරයක් නැහැ.

අපි යෝජනා කරන්නේ, මෙම පළාත් පාලන මැතිවරණය නියමිත වේලාවට පැවැත්විය යුතුයි කියලා. අලුත් ක්‍රමය එයට බාධාවක් නම් එය කෙසේ හෝ අටවාගෙන ඡන්දය තියන එක සුදුසු ක්‍රමය නෙවෙයි. ඒ නිසා කළ යුත්තේ පැරණි ක්‍රමයට ඡන්දය පවත්වන එකයි. ඒ වගේම අපි කියනවා දැනට පවතින සමානුපාතික ඡන්ද ක්‍රමයේ මනාප ඡන්ද ක්‍රමය වැනි ගැටලු ඉවත් කළ යුතුයි කියාලා. අලුත් ඡන්ද ක්‍රමයක් හදනවා නම් ඒ මගින් මහජන කැමැත්ත සාධාරණ ලෙස පිළිබිඹු විය යුතුයි. වැරැද්ද නිවැරදි කරනවා නම් එය හරියටම නිවැරදි කළ යුතුයි."

මෙම අවස්ථාවට ජවිපෙ මධ්‍යම කමිටු සාමාජික පළාත් සභා මන්ත්‍රී ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයාද එක්ව සිටියේය.

## 07 පිටුවෙන් අයවැයට එරෙහි...




බද්ද ඉවත් කරන්න යනවා. එවැනි බද්දක් පනවා තිබෙන්නේ අපේ රටේ පුද්ගලයෙකුගේ ආදායම සහ විදේශිකයෙකුගේ ආදායම අතර විශාල පරතරයක් තිබෙන නිසා. ආදායම අනුව විදේශිකයාට මිලදී ගැනීමේ හැකියාව වැඩියි. වෙනත් රටකදී නම් අපේ රටේ පුද්ගලයෙකුට අඩුම තරමේ කඩ කාමරයක් මිලදී ගන්න පුළුවන්කමක් නැහැ. හැම රටක්ම තමන්ගේ රටේ ඉඩම් ස්වදේශිකයන්ට ආරක්ෂා කරලා දෙනවා. නමුත් රනිල් වික්‍රමසිංහලා 2003දීත් මේ ඉඩම් නීති ලිහිල් කළා. ඒ අනුව විදේශිකයන් ගාලු කොටුවේ ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් ගත්තා. නමුත් මා ඉඩම් අමාත්‍යවරයා වූ ආණ්ඩුවේ විදේශිකයන් අපේ රටේ ඉඩම් මිලදී ගැනීමේදී 100% බද්දකට යටත් කළා. දැන් ඒ බද්ද අයින් කරන්න යනවා. ඒ වගේම අපේ රටේ ඉඩම් බැහැර කිරීමේ හා සීමා කිරීමේ ඉඩම් නීති ලිහිල් කරන්න යනවා. ලංකාවේ පනත් 72ක් මගින් ඉඩම් පිළිබඳ නීති සකස් කර තිබෙනවා. දැන් ඒ සියලු ඉඩම් නීති ලිහිල් කරන්න යනවා.

මේ අයවැය ලේඛනයේ උපායමාර්ගය මුළුමනින්ම වැරදියි. රනිල් වික්‍රමසිංහලාගේ මේ ගමන සියල්ල පොඩි පට්ටම් කරගෙන වේගයෙන් යන ගමනක්. අගෝස්තු බලයට ඇවිත් නොවැම්බර් මාසේ මෙවැනි දේවල් කරයි කියලා කවුරුත් විශ්වාස කළේ නැහැ. මෙය විනාශකාරී ගමනක්. ඒ ආර්ථික උපායමාර්ගයේ යනවිට ආණ්ඩුවට ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කරන්න වෙනවා. ඒ සඳහා අයවැයේ යෝජනා ගණනාවක් සම්පාදනය කර තිබෙනවා. මේ අතර රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප කප්පාදු කරන්න යනවා. ගුරුවරිය, කොන්දොස්තර මහත්තයා, ගාමන්ට් පැක්ටරියේ වැඩකරන සහෝදරිය, ඇතුළු වැඩකරන අපි සියලු දෙනා සමාජ කාර්යයක් ඉෂ්ට කරනවා. ඔවුන්ට වැඩ කරන්න බැරිවන තත්වයකදී ඔවුන් බලාගැනීම සමාජයේ කාර්යභාරයක්. ඔවුන්ට ලැබෙන සහතිකය තමයි විශ්‍රාම වැටුප. අද ඒක ඉවත් කරන්න යනවා. සමාජ වගකීම අත්හරිනවා. කරන්න ඕනෑ විශ්‍රාම වැටුප නැති අයට විශ්‍රාම ක්‍රමයක් හදන එක. එනිසා විශ්‍රාම වැටුප ආරක්ෂා කර ගැනීමට අරගලයක් දියත් කළ යුතුව තිබෙනවා. ඒ වගේම රාජ්‍ය නිලධාරීන්ට ලැබෙන වාහන පර්මිට් එක එය ඔවුන්ගේ අයිතියක්. එය රාජ්‍ය සේවයට ආකර්ෂණය කරගැනීමේ පියවරක්. නමුත් රනිල් වික්‍රමසිංහලා කල්පනා කරන්නේ, රාජ්‍ය සේවය ආණ්ඩුවට බරක් කියලයි. අපි වැනි කුඩා රටක ශක්තිමත්භාවය රඳා පවතින්නේ, රාජ්‍ය සේවය ශක්තිමත් වුණොත් විතරයි. රාජ්‍ය සේවය ලිහිල් කරලා දැම්මොත් පෞද්ගලික සමාගම් කිහිපයක් විසින් අපේ රට අත්පත් කර ගන්නවා.

ඒ වගේම ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය කප්පාදු කරනවා. අක්කර 05ක් තිබුණු කෙනාටත් අක්කර 21/2කට විතරයි පොහොර දෙන්නෙ. කන්න දෙකටම රු.25,000යි. අක්කරේකට සහනාධාරය රුපියල් 5000යි. ඒ කියන්නෙ අක්කර 21/2කට සහනාධාරය රු.11,500කින් කපා දමා තිබෙනවා. අක්කර 05ක් තිබුණු ගොවියෙකුට එක කන්නයක කප්පාදුව රු. 33,000යි. ඒ පමණක් නෙවෙයි, වීවල සහතික මිල රු. 50 සිට 41 දක්වා රු. 09කින් කප්පාදු කරනවා. ගොවීන් මේ සහනාධාර දිනාගත්තේ සටන් කරලා. ඒ වගේම රනිල් වික්‍රමසිංහලා ආණ්ඩුව හදන්න යනකොට ප්‍රධාන සටන් පාඨයක් වුණේ මහින්ද රාජපක්ෂ ගොවි විශ්‍රාමය කැපුවා කියන එක. ඒක දායක විශ්‍රාම වැටුපක්. මේ අයවැයේ ගොවි විශ්‍රාම වැටුප ගැන කිසිම සඳහනක් නැහැ.

පළමුවෙනි කාරණේ මේ අයවැයේ උපායමාර්ගය වැරදියි. දෙවැනි කාරණේ ජනතාවගේ සහන කප්පාදු කර තිබෙනවා. තුන්වැන්න ජාවාරම්කාර වුවමනාවන් මේ අයවැය පිටුපස තිබෙනවා. මේ අයවැය අපේ රටේ සියලු දේ විනාශකරමින් යන ගමනකට මඟ විවෘත කර තිබෙනවා. අධ්‍යාපනයට 5.4%ක් වැය කරන බව මුදල් ඇමති කියනකොට ඇත්ත කියලා හිතුණා. ඒත් තාක්ෂණ වාර්තා බලනකොට කෝටි 1210ක් දාලා තිබුණා. වෙන්කරන ආකාරයක් පෙන්නන්නෙ නැතුව. හොයලා බලනකොට ඒ අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ප්‍රාග්ධන වත්කම්වල එකතුව. සෞඛ්‍යයටත් මේ වැඩේම කරලා. අධ්‍යාපනයට ඇත්තට වෙන්කරපු මුදල 2.4%ටත් අඩුයි. මේ විදිහෙ වංචාවනුත් මේ අයවැයේ තියෙනවා.

කාලයක් ශ්‍රීලනිපය වෙනම අයවැය ඉදිරිපත් කළා. එජාපය වෙනම අයවැය ඉදිරිපත් කළා. දැන් දෙකම එකට අයවැය ඉදිරිපත් කරලත් පෙන්නුම් කර තියෙන්නේ අපේ රටේ දුබල ධනපති ක්‍රමයට තවදුරටත් ඉදිරියට යන්න බැරි බව. කඩාවට්ටපු රටක දුබල ධනපති ක්‍රමයකින් මීට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. මේ අයවැය කියන්නේ බැරිකමේ ප්‍රකාශනයයි. ඒ නිසා කප්පාදු කරන ලද අයිතීන් දිනාගන්න අපට අරගලයක් තියෙනවා. ගොවි ජනතාව, වැඩකරන ජනතාව ඉදිරියට එමින් සිටිනවා. මේ විනාශකාරී ආර්ථික ගමන නැවත්වීමත් කප්පාදු කරන ලද අයිතිවාසිකම් දිනා දීමත් සඳහා සටනක් දියත් කළ යුතුයි. ඒ සඳහා නායකත්වය දෙන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම්. අයවැයට එරෙහිව ගොඩනැගෙන විරෝධය මේ සමාජ ආර්ථික ක්‍රමය වෙනස්කර ජනතාවට සාධාරණය ඉටුවන නව සමාජ ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කරන තුරු ඉදිරියට ගෙන යා යුතුයි. ඒ සඳහා අත්වැල් බැඳගන්නා මෙන් සියලු ජනතාවට ආරාධනා කරනවා.

## 'ඇවන්ට් ගාඩ්'... 13 පිටුවෙන්



කවුරු ඉල්ලුවත් අපි ඒ ගොල්ලන්ගෙන් ඉල්ලන්නෙත් නැහැ. ඒක නේ තිබෙන ප්‍රශ්නය? ඒ නිසා අපි කියන්නේ, මේ සිද්ධිය සම්බන්ධයෙන් යන්න පුළුවන් උපරිම තැනට ගොස් තිබෙනවා. නමුත්, යට ගසමින් තිබෙනවා. යට ගසමින් තිබෙනවා පමණක් නොවෙයි. ඔවුන් දේශපාලනයට මැදිහත් වෙමින් තිබෙනවා. මෙතැන තිබෙන්නේ ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුවක් නොවෙයි. ඇවන්ට් ගාර්ඩ් දේශපාලනයක්. මේ රටේ පුරවැසියන්ගෙන් අපි අහනවා, ඇවන්ට් ගාර්ඩ් දේශපාලනයක් අපේ රටට තහවුරු වෙන්න ඕනෑද කියලා? ඇමතිවරු මිලදී ගන්න පුළුවන්. මන්ත්‍රීවරු මිලදී ගන්න පුළුවන්. Files හංගන්න පුළුවන්. නිලධාරීන් මිලදී ගන්න පුළුවන්. ව්‍යාපාරිකයන් මිලදී ගන්න පුළුවන්. මාධ්‍ය මිලදී ගන්න පුළුවන්. වෙබ් අඩවිකරුවන් මිලදී ගන්න පුළුවන්. මේක, ඇවන්ට් ගාර්ඩ් දේශපාලනයක්.

**අපි අහනවා, අපේ රටේ ඇවන්ට් ගාර්ඩ් දේශපාලනයක් ඇති වෙන්න ඕනෑද? ඒක සාධාරණයිද? මේ ඇවන්ට් ගාර්ඩ් දේශපාලනය. හෙට මේ ගොල්ලන් තමයි ආණ්ඩු හදන්නේ කවුද කියා තීරණය කරන්නේ. මෙය වර්ධනය වෙනවා නම්, මේගොල්ලෝ තමයි හෙට ආණ්ඩු තිබෙනවාද කියලා තීරණය කරන්නේ. මේගොල්ලෝ තමයි ආණ්ඩු වට්ටන්නේ.** ලෝකයේ කැසිනෝ දේශපාලනය තිබුණු එක යුගයක් තිබුණා. කැසිනෝ ව්‍යාපාරය ඇතුළත තමයි ආණ්ඩු පෙරළන්න සිකච්ඡා කරන්නේ. කැසිනෝ ව්‍යාපාරය ඇතුළත තමයි ගනුදෙනු සිදු වෙන්නේ. කැසිනෝ ව්‍යාපාරයෙන් තමයි මන්ත්‍රීවරු මිලදී ගන්නේ. ඒ අනුව, කැසිනෝ දේශපාලනය හා සමාන අවන්ට් ගාර්ඩ් දේශපාලනයක් අපේ රටේ තිබෙනවා. ඒ නිසා ඔවුන් තමයි අපේ රටේ ආණ්ඩු පෙරළන්නේ. ආණ්ඩු පිහිටුවන්නේ. මන්ත්‍රීවරු මිලදී ගන්නේ. ඔවුන්ව එහෙට මෙහෙට මාරු කරන්නේ. ඒ නිසා ඇවන්ට් ගාර්ඩ් දේශපාලනයටයි අපි විරුද්ධ වෙන්න ඕනෑ. එහෙම නැතිව පුද්ගලයෙකුට නොවෙයි. ඔහුගේ කාර්ය භාරයන් පිළිබඳව නොවෙයි. ඇවන්ට් ගාර්ඩ් දේශපාලනයක් අපි අපේ රටේ තහවුරු වෙන්න ඉඩ දෙන්න ඕනෑද? ජනවාරි මාසයේ 08 වෙනිදා අපේක්ෂා කළේ ඒකද?

## යෝෂිතට එරෙහි...



ආවාද? නැහැ. ආරක්ෂක අමාත්‍යාංශයෙන් තවත් රුපියල් ලක්ෂ 65ක් වියදම් කරලා තවත් sea training පාඨමාලා දෙකකට ඔහුව යැව්වා. ගෙන්වා ගත්තේ නැහැ. අපට කිව්වේ මොකක්ද? තරුණයන්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කරන්න පුතාව හමුදාවට යවනවා කිව්වා. මාස 20ක් එංගලන්තයේ තිබ්බා. ඒ පාඨමාලා තුනට විතරක් ආරක්ෂක අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 125ක් වියදම් කර තිබෙනවා. ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශය අනුමැතිය දීලා තිබෙනවා. ඊට පස්සේ ලංකාවට ආවාම ඔහුට best midshipman තනතුර දුන්නා. ඒ කණ්ඩායමේ තිබෙනවා, හොඳම midshipman තනතුර. එහෙම තෝරා ගෙන ඔහුට තමයි sword of honour එක දුන්නේ.

ඒ විතරක් නොවෙයි. මම අහන්නේ මේකයි, ඒ කාලයේ නාවික හමුදාවේ 45වැනි කණ්ඩායමේ හිටපු සෙබළු එල්ටීටීඊ එකත් එක්ක යුද්ධ කළා. මම අහනවා, යෝෂිත රාජපක්ෂ අඩු ගණනේ කේපී හැර එල්ටීටීඊ සාමාජිකයෙක් පණපිටින් දැක තිබෙනවාද කියලා. ඔහු කරපු යුද්ධය මොකක්ද? ඒ ඇවිල්ලාත් මාස කිහිපයයි. මෙහේ හිටියේ. යුද්ධයට සම්බන්ධ වුණේ නැහැ. 2009 ඔක්තෝබර් මාසයේ ඉඳලා 2010 අගෝස්තු මාසය වන තෙක් තවත් පුහුණුවක්. කොහේද? යුක්රේනයේ.

**ඒක හරි අපූරු වැඩක්. ඒ කාලයේ රුසියාවේ තානාපතිවරයා උදයංග වීරතුංග. ඔහු ආරක්ෂක අමාත්‍යාංශයට ලියුමක් එවනවා. යුක්රේනයේ ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පාඨමාලාවකට අපේ ආරක්ෂක හමුදාවේ ඉන්න කවර හෝ සුදුස්සෙක් එවන්න කියලා. ආරක්ෂක අමාත්‍යාංශය හැරෙන තැපෑලෙන් යෝෂිත තෝරා යවනවා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පුංචි අම්මාගේ පුතා එහෙන් ලියුමක් එවනවා, මහින්ද මහත්තයාගේ මල්ලී වන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට, ඒ පාඨමාලාවට. ඒ පාඨමාලාවට යෝෂිත තෝරලා ඔහු අත්සන් කරලා යවනවා.** කොහොමද තෝරා ගත්තේ? මොකක්ද, පදනම? කවුද, ලකුණු දුන්නේ? කවුද, interview එකට ගෙනාවේ? යුද හමුදාවේ. නාවික හමුදාවේ. ගුවන් හමුදාවේ හමුදාවේ හමුදාපතිවරු කියන්න බලන්න. ඒ සම්මුඛ පරීක්ෂණයට එව්වෙ කවුද කියලා. කිසිවෙක් එව්වේ නැහැ. උදයංග වීරතුංග එහෙන් ලියු එවනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා අත්සන ගහලා මෙහෙන් ලියුම යවනවා. ඒ course එක මොකක්ද, Navy Units Combat Employment and Actions Management Course එකට ආණ්ඩුවෙන් රුපියල් ලක්ෂ 40ක් දුන්නා. ඒක ඉවර වුණා. ඒක ඉවර වුණාට පස්සේ රුසියාවේ තානාපති උදයංග වීරතුංග ආයෙත් ලියුමක් එවනවා. මොකක්ද දන්නවාද? මේ course එක කරපු නිසා ඔහුට මෙතැනින් එහාට යන්න, ඔහුට දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක් -Doctor of Philosophy- හදාරන්න අවස්ථාව දෙන්න කියලා. O/L **වැඩ හය පාස් නැහැ. ආණ්ඩුවේ සල්ලිවලින් රුපියල් ලක්ෂ 217ක් වියදම් කරලා** Doctor of Philosophy **ගන්න අවස්ථාව හදලා දුන්නා. මෙන්න මෙහෙම තමයි පසු ගිය කාලයේ වැඩ කරලා තිබෙන්නේ. මම අහන්නේ, ඔහුට එහෙම අවස්ථාවක් ලැබුණේ කොහොමද කියලායි. මොනවා කරලාද? ඇතුළත් වෙන්න සුදුසුකම් නැහැ. හොර පාරෙන් ඇතුළත් කර ගත්තා. අඩු සුදුසුකම් පෙන්නුවා. එහෙම පෙන්නලා ලංකාවේ තියා ගන්නේ නැතිව පාඨමාලා පහකට රුපියල් ලක්ෂ 217ක් වියදම් කර තිබෙනවා.**

මම ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 26වැනිදා යෝෂිත රාජපක්ෂට විරුද්ධව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට කරුණු 13ක් සහිතව පැමිණිල්ලක් ඉදිරිපත් කළා. මම දන්නා හැටියට නාවික හමුදාවේ නිලධාරීන් තුන් දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් ඒ පිළිබඳව පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණ වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශයට භාර දීලා තිබෙනවා. ඒ මූලික පරීක්ෂයේදී ගත් තීන්දුවට මොකද වුණේ කියලායි මම අහන්නේ.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



ජ.වි.පෙ. නියෝජිතයින් චීන සංචාරයකට එක්වෙමින්...



ආසියාවේ වාමේ පක්ෂ සමඟ සමුළුවකට එක්වෙමින්...




ඉතාලියේ නාපොලිහිදී සහෝදරත්වයේ දිනය සමරා...



මාතලේදී බලමුළු ගැනුණු තරුණ නායකත්වය



ඉතාලියේ මෙස්සිනාහි දේශනයක් පවත්වමින්...

## පුංචි ඡන්දය කල් තැබීම ජනතාවට වන අසාධාරණයක්

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**



2016 මාර්තු මාසයේ පැවැත්විය යුතු පළාත් පාලන ඡන්දය මාස 06කින් කල් දැමීමට ආණ්ඩුව පියවර ගැනීම ගැටලු සහගත බවත් එය රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අනුවත් ජනතාවගේ ඡන්ද අයිතිය අනුවත් බලවත් අසාධාරණයක් බවත් පෙන්වා දුන් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ඡන්ද ක්‍රමයේ ගැටලු පදනම් කර ගනිමින් මැතිවරණය කල් දැමීමට ජනතා විමුක්ති පෙරමුණේ තරයේ විරුද්ධ බව ප්‍රකාශ කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 29වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

මෙසේ මැතිවරණ කල් දැමීමට ආණ්ඩුවකට අයිතියක් නොමැති බව අවධාරණය කළ ටිල්වින් සිල්වා සහෝදරයා මෙමගින් සිදු වෙන්නේ, පළාත් පාලන ආයතනවලට තමන්ගේ නියෝජිතයකු පත් කර ගැනීමට මහජනතාවට ඇති අවස්ථාව අහිමි වීම බව පෙන්වා දුන්නේය. ඔහු වැඩිදුරටත් මෙසේද කීය.

"සමහරු කියන්න පුළුවන් මේක පුංචි ඡන්දයක් නිසා කලබල වෙන්න ඕන නැහැ කියලා. නමුත් අනෙකුත් ආයතනවලට වඩා ජනතාවගේ එදිනෙදා අත්‍යාවශ්‍ය කටයුතු ඉටුකර දීමට මැදිහත් වන්නේ පළාත් පාලන ආයතනයි. බෝක්කුව හදා ගන්න, ලයිට් කණුවට බල්බ් එක දාගන්න වගේ සියලුම දේවල් ඉටුකර දෙන්නේ පළාත් පාලන ආයතනයි. මේවනවිට පළාත් පාලන ආයතන රැසක ජනතා නියෝජිතයෝ නැහැ. බොහෝ ආයතන තිබෙන්නේ කොමසාරිස් පාලනය යටතේ. නමුත් කොමසාරිස්වරයා ජනතාවට සමීප නැහැ. ජනතාවගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න විදියක් නැහැ. යෝජනාවක් දාන්න විදියක් නැහැ. ප්‍රශ්න තව තවත් වැඩි වෙනවා. දින 100 ආණ්ඩුව කාලේ පළාත් පාලන ආයතන වසරකින් කල් දාන විට අපි බලාගෙන හිටියා අවුරුද්ද තුළ ගැටලුව විසඳයි කියලා. නමුත් දිගින් දිගටම කල් දාන්න ඉඩ දෙන්න බැහැ.

ආණ්ඩුවේ විවිධ 15 පිටුවට

## තෙල් මිල අඩුවීමේ සහනය ජනතාවට ඕනෑ

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**



පහුගිය වසරේ සිට ලෝක වෙළඳපොළේ බොරතෙල් මිල විශාල ලෙස පහළට ඒමට පටන් ගෙන ඇති නමුදු ආණ්ඩුව එහි වාසිය රටේ ජනතාවට ලබාදීමට අසමත් වී ඇතැයි චෝදනා කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා මිල අඩුවීමේ වහා වාසිය ජනතාවට ලබාදිය යුතු බව කියා සිටියේය.

ඔහු මෙසේ කියා සිටියේ පසුගිය 23වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

2014 අගෝස්තුවේදී ඩොලර් 102.15ක්ව තිබූ බොරතෙල් බැරලයක මිල මේ වෙනවිට ඩොලර් 36.38ක් බව පැවසූ විජිත හේරත් සහෝදරයා ඒ අනුව ආණ්ඩුව විසින් ලබන අයුතු ලාභය රටේ ජනතාවට පැහැදිලි වන බව ප්‍රකාශ කළේය. "බරපතළ ගැටලුව වන්නේ ආණ්ඩුව විසින් පමණක් නොව ඉන්දියානු තෙල් සමාගම විසින්ද මෙම අතිරේක ලාභය ලබාගැනීමයි. ඔවුන් මාසිකව තෙල් ලීටර් මිලියන 20ක් අලෙවි කරනවා. ඒ අනුව ඔවුන් මාසිකව ලංකාවෙන් රැගෙන යන අතිරේක ලාභය රු. මිලියන 320ක්."

ඔහු අනාවරණය කළේය.

"තමන් මිලට ගන්නා තෙල්වල මිල තීරණය වන ආකාරය ජනතාවට විනිවිද දැකිය හැකි විය යුතුයි. අලුත් සූත්‍රයක් සකස් කරන තෙක් තිබෙන සූත්‍රය මගින් හෝ මිල අඩුවීමේ වාසිය ජනතාවට ලබාදිය යුතුයි. එක්සත් ජාතික පක්ෂය පසුගිය කාලයේ විපක්ෂයේ සිටියදී මිල අඩුවීමේ වාසිය ජනතාවට ලබාදිය යුතු බවට කිව්වා. නමුත් දැන් ආණ්ඩුවේ සිටින ඔවුන් ඒ පිළිබඳ කිසිදු ශබ්දයක් නැහැ. අපි අවධාරණය කරන්නේ ජනතාවට තෙල් මිල අඩුවීමේ සහනය ලබාදිය යුතු බවයි. එය ජනතාවට ලබා නොදී ඔවුන් මත අසාධාරණ බදු පනවා තිබීම හෙළා දකිනවා. ඉන්ධන මිල අඩුකිරීමෙන් ජනතාවට විශාල සහනයක් ලැබෙනවා. රටේ සමස්ත නිෂ්පාදන පිරිවැය අඩුවීමෙන් විශාල ප්‍රතිලාභයක් ජනතාවට අත් වෙනවා." ඔහු කීය.

මෙම මාධ්‍ය හමුවට එක්ව සිටි ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික, සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා ගොවි ගැටලු පිළිබඳව අදහස් දක්වමින් මෙසේ පැවසීය.

"අතිවිශාල ගොවි ජනතාවගේ මෙම සටනට ආණ්ඩුව විසින් දන්වන ලද ප්‍රතිචාරය අතිශය කණගාටුදායකයි. ගොවි ජනතාව අලුතින් යමක් ඉල්ලුවේ නැහැ."

## මාලබේ හොර වෛද්‍ය කඩයට රජයේ රෝහල් ලබා නොදිය යුතුයි

**සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා**



වෛද්‍ය උපාධිය දීමට සුදුසුකම් සපුරා නැති මාලබේ සයිටම් පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතනය වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති බවට අසත්‍ය ප්‍රකාශ කරමින් වංචාකාරී ලෙස කටයුතු කරන බවට චෝදනා කළ රංගන දේවප්‍රිය සහෝදරයා ආණ්ඩුව එම අධ්‍යාපන ආයතනයට සායනික පුහුණුව සඳහා රජයේ රෝහල් ලබා නොදිය යුතු බවට අවධාරණය කළේය.

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 17වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය.

"සෞඛ්‍ය අමාත්‍යාංශය රෝහල් ලබා නොදීමෙන් අධිකරණ තීන්දුවක් කඩලා තිබුණෙ නැහැ. ඒත් සෞඛ්‍ය ඇමතිවරයා සයිටම් ආයතනය සමඟ රහසේ එකඟතාවයට ඇවිත් තියෙනවා. ඒ අනුව සයිටම් ආයතනය සායනික පුහුණුවට රෝහල් ලබා නොදීම මගින් ඇමතිවරයා අධිකරණයට අපහාස කළා කියලා නඩුවක් ගොනු කරනවා. ඒ අනුව ඇමතිවරයා අවිස්සාවේල්ල මූලික රෝහල සහ කඩුවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සායනික පුහුණුව සඳහා ලබාදීමට පොරොන්දු වීමෙන් පසුව අපහාස නඩුව ඉල්ලා අස්කර ගන්නවා.

රජයේ ඇමතිවරයෙක් රජයේ දේපළ විකුණන්නේ කොහොමද? ඔවුන් කියනවා මේ පුහුණුව වෙනුවෙන් රුපියල් 50,000ක් අයකරනවා කියලා. වෛද්‍යවරුන්, හෙද කාර්යමණ්ඩලය, අනෙකුත් කාර්ය මණ්ඩල, අනෙකුත් පහසුකම් හා රෝගීන් රු. 50,000කට මිල නියම කරලා. ඔවුන්ට විකුණන්න අයිතියක් එන්නෙ කෙහොමද? රංගන සහෝදරයා ප්‍රශ්නකර සිටියේය.

## තාරුණ්‍යය රටපුරා බලමුළු ගැන්වෙයි

වසර 67ක් වරින් වර තමන් රැවටූ පාලනයට එරෙහිව ලාංකේය තාරුණ්‍යය අන් කවරදාටත් වඩා උද්යෝගයෙන් සමාජවාදී තරුණ සංගමය වටා එක්රොක් වෙමින් සිටියි. එනිසාවෙන් සමාජවාදී තරුණ සංගමය ප්‍රථම වරට තම දිස්ත්‍රික් සමුළු ගොඩනංවමින් නව දිස්ත්‍රික් නායකත්වයක් රටට හඳුන්වා දීම ආරම්භ කර ඇත.

ඒ අනුව මංගල දිසා සමුළුව ලෙස මාතලේ දිස්ත්‍රික් තරුණ සමුළුව 2015 දෙසැම්බර් 05 වන දින මාතලේ හොටල් පාසල් ශ්‍රවණාගාරයේදී අභිමානවත්ව පැවැත්වනු ලැබූ අතර එහි දෙවැන්න දෙසැම්බර් 25 වන දින බදුල්ල වයි.එම්.එම්.ඒ. ශාලාවේදී පැවැත්විණි.

මෙලෙස රට පුරා සියලුම දිස්ත්‍රික් සමුළු සංවිධානය කර අවසන 2016 පෙබරවාරි 28 දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී 03 වන ජාතික මහා සමුළුව පැවැත්වීමට සමාජවාදී තරුණ සංගමය සූදානම් වෙමින් සිටී.



බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.